

# මොනිකා පුෂ්ප කුමාරි

KATHAPOTHAK.BLOGSPOT.COM

ඔදකන් පෙති අද්දරින් වැගිර ළැම මත රොක් වූ දහඩිය බිඳු ඔහු නොසන්සුන් කළේය. මම ගුලිකොට උන් ලේන්සු පොඩිත්ත ගෙන ගෙලත් ළැමත් පිසලැවෙමි.

"බහින්න මාකඩ"

සුදාරක මගේ ඇඳුම් තිබූ බෑගයද ගෙන සිටියේය. මම ත්‍රීරෝද රියෙන් බිමට බැස්සේ දිගු සාය සකසා පරිස්සමින් අඩිය තියාය.

"එන්න."

සුදාරක ඉස්සර විය.

ගණුදෙනු බේරාගත් ත්‍රීවිලරය ගොරහැඩි හඬින් කන් රිදවමින් ආපසු හැරිනි. මම අගරින් පතර තුත්තිරි වැවුණු ගෙමිදුලේ සුදාරක පස්සේ වැටිමි.

"අද ඉඳල මේක තමා අපි දෙන්නගෙ ගෙදර" සාක්කුවෙන් ගත් යතුරින් දොර හැර සුදාරක මලු දෙක උස්සා ගෙට ගත්තේය. පයලු සෙරෙප්පු පඩියේ රදවා මම නිරුවත් දකුණු පය පෙරට තැබීමි. හීන් හීතලක් හිත හිරිවැට්ටීය.

"මානවී"

කාමරයෙන් කාමරයට යමින් එබෙමින් උන් මා දිහා සුදාරක බලා උන්ගේ හරියට පොඩි එකෙකුගේ දඟ වැඩක් රකිනා තාත්තා කෙනෙකු වාගේය.

"මානවී...."

මම එක තැනම නතරවීමි. සුදාරකගේ දිගු දෑත් මගේ බඳ වටා යැවිණි. හිත හිගඩු පුබුදු කරවන සුවඳක් සුදාරකගේ පපුතුරේ සැඟව තිබිණි.

"මේ ගේ මං ගත්තේ ඔයාට.... ඔයාට මෙමහ හොඳද මානවී...?

මම හොඳයි කියන්නට හිස ඉහළ පහළ වැනීමි. මා අනාථයෙකි. මට අම්මෙක් නැත. තාත්තෙක් නැත. උන්නේ පුංචම්මා පමණි. පුංචම්මා ළඟ දහදුක් විඳි ජීවිතයට මේ සැප ඕනාවටත් වඩා වැඩිය.

"මං අහන ප්‍රශ්න වලට බයවෙලා වගේ ඔළුවෙන් උත්තර දෙන්නෙපා කියල මං කියල තියනවනේ. කට ඇරලා කියන්න. මේ හොඳද? නැත්ද?

"හොඳයි"

තිගැස්සුන මට කියැවිණ. විටෙක මට සුදාරක තේරුම් ගන්නට අමාරුය. මට වඩා වසර නමයක් වැඩිමහල් වූ හින්දාදෝ සුදාරක ළඟදී ආදරය රැකවරණය සේම මට බියද යනමින් දැනිණි.

"බඩු මුට්ටු නම් ටිකයි ගන්න පුළුවන් උනේ මේ ගෙදෙට්ට මං හිතුවට වඩා ගාණක් යට කරන්න වුණා. තව මාසයක් දෙකක් ඕරිමහ ගමු.... ඉන් පස්සේ මං ඔයාට අඩුවක් තියන් නෑ."





"මට මෙහෙම හොඳයි."

මට ඔහු ගැන දුකය. අනාථ කෙල්ලක හින්දා අම්මා තාත්තා ඔහුට නැති විය. නෑ සනුහරය නැති විය. පෙලපත පමණක් නොව උරුම වෙන්නට තිබූ හැමදේම අහිමිවිය.

සුදාරක රාමනායක ඒ හැමදේ ළඟදී නොසැලිණ. ඔහු සැලුණෙ මා ළඟදීය. මගේ නෙත් ළඟදීය. නැති වූ හැමදේම නොතකා ඉන්නට ඔහුට හැකිවූයේ ඒ හින්දාය.

වෙල්යායකට පිටුපස හරවා හැදූ වෙන්දේසි ගෙවල් පේලියේ කොණේම ගෙදර සුදාරකගේත් - මගේත් කැදැල්ල ඇරඹිණි. අඳුර අනවසරයෙන් අප අතරට රිංගාවිත් තිබිණ. එය සුදාරකත් - මාත් එක ගෙදර ගතකරන පළමු රැය විය. වැඩි බඩුමුට්ටුවක් නොවූ කාමරයේ තිබූ එකම ඇඳේ මම සුදාරකට ගුලිව නොකු පියා උනිමි.

"මානවී නිදිමතද?"

බර හාදුවක් මගේ ඇස් පෙති වලට වැටිණ. සැණින් මම ඇස්පියන් නැගිමි.

"හොර කෙල්ල...."

සුදාරකගේ ලොකු ඇස් අඩවන්ව තිබිණ.

"හෙට උදෙන්ම මම නැගිටින්නෝන බබී."

"ඇයි ?"

"හෙට ඉඳලා මං ඔෆිස් යන්නෝන."

දුකක් - තිගැස්මක් හිතට ගොඩවිය.

"එතකොට මං ?"

"අනේ බබෝ මට ඔයාවත් ඔෆිස් එක්ක යන්න බැනේ..."

"මං එනකන් ඔයාට ගෙදර ඉන්න වෙනවා."

"මං කොහොමද තනියෙන් ඉන්නෙ මහත්තයා, මට බයයි."

මම සුදාරකගේ උරහිසේ නහය හප්පා ගතිමි. මගේ බඳ වටා තිබූ සුදාරකගේ අත තදව ගියේය.

"බයවෙන්න දෙයක් නෑනෙ වස්තුව. හය විතර වෙද්දී මට ගෙදෙට්ට එන්න පුළුවන්."

"ඔයාගෙ තාත්තා හොයාගෙන ආවොත්..."

මම හැඬුම්බරව කීවෙමි.

ඇත්තවම මගේ නෙත්වල කඳුළු වැඩිවී තිබිණ. මට සුදාරකගේ තාත්තා සිහිවිය. දවසක් ඔහු පුංචම්මාගේ ගේ දොරකඩටම විත් කෑගෑවේය.

"හිතාගෙන ඇති මගෙ කොල්ලව අල්ලා ගන්න. හරිහමන් ජාතකයක් නැති හිඟන බැල්ලි. උඹ ආයෙ මගෙ කොල්ල ඉන්න පැත්තක්වත් බලල තිබ්බොත්... මං උඹව මිනිස්සු දම්මල උසස්නවා. අන්න ඒක දැනගනිනං."

ඒ ගොරහැඩි වචන සිහිව මේ මොහොතේත් මා වෙව්ලා ගියේය. මම තව ටිකක් සුදාරකගේ සිරුරට ගුලිවීමි.

"ඔයාගෙ තාත්තා මාව හොයාගත්තොත් මරයි."

මම ඇහෙන නෑහෙන ගාණට මිමිණීමි. එහෙත් සුදාරකට එය හොඳින් ඇසිණ.





"තාත්තලට දැන් කිසිදෙයක් කරන්න බෑ මානවී. දැන් ඔයා මගේ වයිෆ්. අපි නීතියෙන් කසාද බැඳලයි ඉන්නෙ. අනික අපි මේ හරියේ පදිංචි වෙලා ඉන්න බව ඔය කවුරුවත් දන්නෑනෙ."

බාධක වැඩිවූ තරමට සුදාරක මට ළං වූයේය. ආදරය ගැන - විවාහය ගැන අප අතර වැඩිපුර කතා නොවිණ. හිත් වලින් දුරදිග යන්නට තරම් කාලයක් අප ඇසුරු කළේ නැත. බාලිකාවේ ගේට්ටුව ළඟදී පාර මාරුවෙන්න ගිය මා සුදාරකගේ ෂෙරිනාවේ හැපී කකුල කඩා ගත්දා සිට ගෙවුණු තුන් මාසයට සුදාරක මා නාමින් ජීවත් වෙන්නට පටන්ගෙන තිබිණ.

"ඔයා මගේ වෙන්න කැමතිද මානවී..."

මුලින්ම සුදාරක ඇහුවේ ඔහොමය. අඩි හයයි දෙකක් උස සිරුර දිහා මම නිකට උස්සා බැලීමි. රැකවරණයක් ආදරයක් නොදැක ගෙවුණු ජීවිතයට ඔහු පෙම්බර වූවා නොවේද? ඒ ලොකු විවෘත ඇස්වල උතුරා ගිය ආදරයට මං ලෝබවීමි.

"ඔයා මාව බඳිනවද මානවී...."

"හාං...."

දෙවරක් නොහිතා මම කීවෙමි. සැනසිල්ලේ ජීවත් වන්නට මට ඕනැකොට තිබිණ. පුංචම්මාගේ ගෙදර රගපෑ අවුරුදු දහසයේ කුස්සි අම්මාගේ චරිතයෙන් අත් මිදෙන්නට මට ඕනෑවිය.

"අපේ මූණෙ දැලිගාන්න ඉපදිච්ච බැල්ලියක් උඹ. බලපන් උඹ හින්දා අපි එක එකාගෙන් විඳින අවනම්බුව. කවදහරි මගේ ළමයි කොහොමද පාරෙ බැහැල යන්නේ? උඹ වහාම ඔය සම්බන්ධෙ නතර කරන්නෝන. හෙටම උඹ ඉස්කෝල ගමන නවත්තන්නෝන."

පුංචම්මා සුදාරකගේ තාත්තාට දෙවෙනි වන්නට කැමති වූයේ නැත. පාසල් ගමන නැවතිණ. සුදාරක නොදක දින ගෙවිණ. සතියක් - දෙකක් වැඩිම උනොත් සති තුනක් ඉකුත්ව යන්නට ඇත. සුදාරක උන්හිටි හැටියේ පුංචම්මාගේ ගෙදර මිදුලේ රිය නතර කොට බැස්සේය.

මම හඬා ඉදිමුණු මුහුණින් මගට දිවුවෙමි.

"මානවී..."

ඔහු මගේ හිසකේ අතගෑවේය. තෙත කම්මුල් පිසලෑවේය.

"මේ ඔක්කොම දාල මා එක්ක යන්ද?"

සුදාරක ඇහුවේය.

"මානවී ගෙට පලයං"

දැත ඉනට තියාගෙන පුංචම්මා දොරකඩ උන්නාය. බාප්පා - දරු තිදෙනා ඈ පස්සේ විය.

"මානවී මා එක්ක යන්න එනවද?"

සුදාරක නැවත ඇසුවේය.

"ඔව්."

මම ආයේමත් අහන්න ඉඩ නොතැබීමි. සුදාරක සවිමත් අත් දෑඩු ඉගටිය හරහා යවා උස්සා මා මෙරීනාවේ වාඩිකොට ගත්තේය. පුංචම්මාගේ විලාප හඬ මැද්දේ මෙරිනාව ඉගිලිනි. සුදාරකට ඉඩදී මා ආ ඒ ගමන අද මා ඔහුගේ බිරිඳ වී අපේ ම කියා මිලට ගත් පුංචි ගෙදරක නතර වී තිබේ.





අළුත් බිරිඳක වූ මම විවාහය - පවුල් ජීවිතය ගැන දැන ඉන්නේ මොනවාදැයි මම සිතීමි. දන්නදා සිට පුංචම්මාගේ ගෙදර ළමා මෙහෙකාරියගේ චරිතය රඟපෑ හින්දා උයන පිහනදේ පිළිබඳව මට සෑහෙන දැනුමක් තිබිණ.

"උයන දේවල්වලට මෙයාකාර ලුණු මිරිස් කපලා දාන්නෙපා බං. අද කාලෙ ලූනුගෙඩියක් මිරිස් කරලක් කීයක් වෙනවා කියලද?"

"පොල් පිරිමහලා උයන්න පුරුදු වෙයං. දැන් පොල් ගිණිගණන්."

පුංචම්මාගේ මෙවැනි පාඩම් හින්දා රසට උයන්න පිහින්න සේම පිරිමහගන්නත් මට දැනුමක් තිබිණි. මට නොවූයේ බිරිඳක විදිහට ලිංගිකව තිබිය යුතු අවබෝධය පමණි.

අවුරුදු දහසයක සාමාන්‍ය යුවතියක් තුළ ලිංගිකත්වය පිළිබඳව වන්නේ අල්ප දැනීමකි. ඉදහිට සිංහල හෝ හින්දි චිත්‍රපටයක් නරඹා ලත් දැනුමෙන් ගැහැණියක් හා පිරිමියෙක්ගේ ලිංගික එක්වීම යනු ගැහැණිය පිරිමියාගේ කයට යටවී හිඳීම යැයි මම හිතාගෙන උනිමි. නැත්නම් ලිංගික ජීවිතය ඇරඹෙන්නේ ගැහැණිය පිරිමියාට තමන්ගේ කයමත වැතිරෙන්නට ඉඩදීමෙන් යැයි මම අවබෝධ කොටගෙන උනිමි.

නමුත් ගැහැණුන් හා පිරිමින් අතර වන ලිංගික ජීවිතය ඊට වඩා අර්ථවත් හා සංකීර්ණ වූත් - සුන්දරවූත් දෙයක් බව සුදාරක රාමනායක අතින් අවුරුදු දහසයේ ගැහැණියක වී මම අවබෝධ කොට ගතිමි.

"මානවී ඇයි...."

සුදාරක දෙස කෙලින් නොබලා හංගාගෙන රකින ඇස්වලින් හිදි, පලමුදා රැය ගෙවී එළඹුන උදයේ සුදාරක ඇහුවා මතකය.

"මානවී ඇයි මගෙන් ඇස් හංගන්නේ? උදේ ඉඳලා මං දිහා කෙලින් බලන්නෑ."

පස්සේ පන්නා මා අල්ලාගෙන සුදාරක ඇහුවේය. මා තුළ වූයේ උතුරා පිටාර ගලන ලැජ්ජාවකි.

"මං මහා නරක මිනිහෙක් කියල හිතෙනවද ඔයාට?"

ඔහු මෙමිහිට ඇහුවේය.

"නෑ දෙයියනේ..."

"එහෙනං...."

"මට ඔයා ළඟ හැමදාම ඉන්න හිතෙනවා. හැම වෙලාවකම ඉන්න හිතෙනවා."

මම හඬමින් කීවෙමි. ඇත්තය. ලිංගික සංවාසය ඇරඹෙන්නට පෙරාතුව මා ළඟ ඔහු ගැන වූයේ ආදරයක් - බියක් හා මගේ අනාථ ජීවිතයට පිළිසරණ වූ පිරිමියා ගැන ඇතිවිය යුතු අප්‍රමාණ වන්දනීය බවක් පමණි.

එහෙත් දැන් ඒ සියල්ල පරදා මගේ හිතේ සුදාරක රාමනායක ගැන වන්නේ ඉවවහා ගිය ලෝබකමකි. බැඳීමකි. අඹු සැමියන් අතර බැඳීම ශක්තිමත් වන්නේ ලිංගිකත්වය හරහාය යන ඇත්ත මම පතපොතකින් නොකියවාම අත්විඳ අවබෝධ කොටගෙන උන්නෙමි.





"දැන් ඉතින් හැමදාම ඔයා මාළඟ තමා මානවී..."

සුදාරක මා තුරුළු කොට ගත්තේය.

"ඇති යන්තං. මං හරි බයේ උන්නේ."

සුදාරක සුසුමක් හැර කීවේය.

"ඇයි?"

"නෑ ඔයා තාම පුංචි කෙල්ලෙක්නේ. ඊයෙ රෑ අපි අතරේ සිද්ධ වෙච්ච දේවල් හින්දා ඔයාට මාව එපාවෙලා ඇති කියලා මට හිතුනේ."

"එහෙම නෑ."

මම ලැජ්ජාවෙන් මිරිකී කීවෙමි.

"එහෙනං මොනාද හිතුනේ ?"

"මං දන්නෑ."

මම ලැජ්ජාවට නෙත කඳුළු පුරවාගෙන කීවෙමි.

"මගෙන් ඕව අහන්නෙපා. මට ලැජ්ජයි."

මම බොරුවට සැරවීමි.

"ඇයි ලැජ්ජා වෙන්නෙ? දැන් මං ඔයාගෙ මහත්තයනෙ. හස්බන්ඩ් ඇන්ඩ් වයිෆ් උනහම ගොඩක් කිට්ටුයි මානවී. ඒ දෙන්නට දෙන්නා කතා නොකරන දෙයක්වත් ඒ දෙන්නට කතා කරන්න බැරි දෙයක්වත් නෑ."

ඇත්තය. ඔහු ඉදිරියේ කයින් නිරුවත් වන්නට පුළුවන් වූ මට හිතින් ඔහු ඉදිරියේ නිරුවත් වන්නට බැරි ඇයි?

"ඔයාට ඒ වෙලාවෙ මං ගැන මොනාද හිතුණෙ මානවී ?"

"ආදරේ...."

"ආදරේ...."

"ඔව්, මට ඔයා ගැන ආදරේ හිතුණා, ආස හිතුණා, ඔයා ගැන ලෝබ හිතුණා."

මම ඇත්තම කීවෙමි. සුදාරකගේ ඇස් බබලන්නට පටන් ගත්තේය.

"ලෝකෙ ඉන්න හැම පිරිමියෙක්ම තමන්ගෙ බිරිඳගෙන් ඔය වචන ටික අහගන්න ආසයි මානවී. ආදරේදී ප්‍රේමය රාගයෙන් තොර සඳ එළියසේ පවිත්‍රයි කියලා කිව්වට ඔය වචන ටික විවාහයෙදි වලංගු නෑ. විවාහය රඳා පවතින්නෙ අඹුසැමි දෙන්නාගෙ ලිංගික සබඳතාවයෙ ශක්තිමත්කම උඩයි. ඔයා මට කොයිතරම් ආදරේ කළත් ඒ පැත්තෙන් ඔයාගෙ හිතේ මා ගැන ආසාවක් ඇති කරන්න බැරි උනානං මං සාර්ථක පිරිමියෙක් වෙන්නෑ කෙල්ලේ. එහෙමනං අපේ මැරේජ් ලයිෆ් එකට වැඩි ආයුෂ තියෙයි කියලා මට හිතන්නත් බෑ."

සුදාරක ලොකු කතාවක් වචන දෙක තුනකින් කීවේය. හිතින් ගතින් ඉතින් මා ඔහුට විවාහ බිරිඳක විය යුතුමය. මම එක හිතින් හිතාගතිමි.

"කෙල්ලේ..."

සුදාරකගේ සුසුමක් කන්පෙති මත වැටිණි. ඒ හඬ මෙතරම් උණුසුම් වන්නේ මා ඔහුට ඕනෑ කළ විටය.

"හැමදාම මා එක්ක ඉන්නවා නේද බබී ?"

"මට ඔයාව ඕනේ."





ඔහු ගැන මට හිතෙන හැමදේම එකට ගොතා මම කීවෙමි. ඇත්තය. මට ඔහු ඕනෑය. දූන් ඉතින් මගේ ඉරත් ඔහුය. සඳත් ඔහුය. අහසත් ඔහුය. මට විශ්වයක් වේ නම් ඒ විශ්වය මගේ සුදාරකය.



## 02

ගෙමිදුලේ මල් කොහොඹ ගහක් තිබිණ. කොළ තරමට හෝ ඊට වැඩියෙන් මල් තිබූ ඒ ගහ දුකුම්කළුය. දවසේ ඉස්සරෝම එළිය වැටුනේ මල් කොහොඹ ගහටය.

"එනකොට මේ බඩු ටික ගේන්න. හෙට ඉඳල මං උයල දෙන්නං ගෙනියන්න."

උයන්න පිහන්න උවමනා කළ අත්‍යාවශ්‍ය දෑ ලැයිස්තුවක් ලියා මම සුදාරකගේ සාක්කුවට දැම්මි. වෙනදා කරේ දාන ටයි පටිය අද සුදාරක නවා සාක්කුවේ දමාගෙන උන්නේය.

"ටයි එක දාන්නැ?"

"බෑ කෙල්ලේ බස් එකේ යන්න ඕනනේ."

සුදාරකට තමන්ගේ කියා තිබුණේ මෙරීනාව පමණකි. මා කසාද බැඳගන්නට ඔහු මෙරීනාව වික්කේය. මේ ගෙයත් - බඩුමුට්ටු ටිකත් ගත්තේ ඒ මුදලෙනි.

"මං හිත්දා දුක් විඳිනවා."

මට කියවිණ. මගේ ඇස් පෙඟී තිබිණ.





"නෑ බබී."

සුදාරක මගේ කම්බුල් දෝතින් ගුලිකොට උස්සා ගත්තේය.

"බොරු කියන්නෙපා... ඇයි මේ හිගන්නිව කරේ එල්ල ගත්තේ?"

"අඩන්නෙපා. මට පේන්න ආයෙ කවදාවත් අඩන්නෙපා. කඳුළු දෙන්න නෙමේ මං ළගට ගත්තේ. මානවී.... වස්තුව.... මේ අහන්න.... මගෙ ජීවිතේ තියෙන්නෙ ඔය ඇස්දෙක ඇතුලෙ හැංගිලා. ඒකයි මෙච්චර කරදර විඳලා හරි අයිතිකර ගත්තෙ. ඒ ජීවිතේට ඔහොම ඔය විදිහට ඇස් වලින් දියවෙලා යන්න ඉඩ දෙන්නෙපා."

සුදාරක තොල්තියා මගේ නෙත කම්බුල් උණුසුම කළේය. මම දෝත ඉගටිය හරහා යවා ඔහුට තුරුළු වීමි.

"වැඩට නොයා ඉන්න හිතෙනවා."

සුදාකර රහසින් කීවේය.

"අනේ යන්න. කම්මැලි වෙන්න හදනවා." මම හිනැහෙමින් ඔහුගෙන් මිදුණෙමි.

"මේ කෙල්ල තමා මාව කම්මැලියෙක් කරේ."

සුදාරක අතින් ඇඳ නළල සිඹබේය.

"එළියට පහලියට යන්නෙපා බබී. අපි තාම අහල පහල අයව අඳුරන්නෙත් නැනෙ. දොර වහගෙන ඇතුලට වෙලා ඉන්න. මං පුළුවන් තරං ඉක්මණට එන්නං."

"තෙරුවන් සරණයි. පරිස්සමිං..."

සුදාරක ගේට්ටුවෙන් එහාට යනතුරුත් බලා හිඳ මම දොර වසා දැමීමි. මහා පාළුවක් ගෙය පුරවා දමා තිබිණි. අපේ කාමරය පුරා පිටව ගිය සුදාරකගේ "පිරිමි සුවඳ" තවමත් රැඳී තියේ. කාමර දෙකක් - මැද සාලයක් - නාන කාමරයක් - පුංචි කුස්සියක් වූ මේ ගෙයි පිහිටීම හුරුබුහුටිය. මම කුස්සියේ ජනේලයක් හැර දැමීමි. වෙල්යාය පිස හීත හුළගක් ඇදී ආවේ ඉක්මණිනි.

"වෙනුර බෝල් කරපං..."

"අඩෝ බෝක්කුවා... හරියට රැකපං.... බෝක්කු එපා."

ඇර දැමූ ජනේලයෙන් පිරිමි කටහඬවල් රැසක් කැලනී ආවේය. මම ජනේලයෙන් එබී බැලීමි. ඉපනැලිව ගිය කුඹුරු යායේ පිරිමි ළමෝ රැලක් බෝල ගසමින් උන්හ.

මට පාසලත් මිතුරියනුත් සිහිවිය. සුදු ගවුමට සමුදී සති තුනකින් මා පතිනියක වූ වග අදහන්නත් අමාරුය. ශාලිකා, ඔල්ගා, චිරන්ති තාමත් පාසල් යනවා වන්නට ඇත.

සුදාරකගේ ප්‍රේමයේ අඩුතැන් නොවූ වග ඇත්තය. එහෙත් පාසලත් - පොතපතත් - මිතුරියනුත් සිහිව මගේ පපුව දැවේය.

"දඩාස්"

කම්පනයක් - බියක් - තැතිගැන්මක් එකවිට හිත ළඟ පිපිරිණි. ඇරදමා තිබූ ජනේලයෙන් ගෙට ඇතුළු වූ ලෙදර් බෝලයක් බිත්තිය ළඟ වැටී උඩපැන්නේය.

"ජලා හුටා බෝලෙ ගියා නෝද ගේ ඇතුලට."

"මළෙස්ක... දොරවල් ජනෙල් මහගත්තු මේ හුත බංගලාවල කවුරු ඉන්නවද මංදා."





"කව්ද දැන් බෝලෙ ගේන්නේ...?"

පිරිමි ළමෝ රැළ කම්බි ගැසූ වැට ළඟ වටවී වන්නට එබිකම් පෑහ. මම බිත්තියට පිටදී හිට ගතිමි. හිත නොනවත්වාම ගැහුණේය. ඒ උවමනාවට වඩා සියදහස් ගුණයක් වැඩියෙනි.

"වෙණුර උඹටනෙ පුළුවන් මේ වැටට උඩින් පනින්න. පොඩ්ඩක් පැනල බලපංකො."

"හොරකං කරන්න ආව කියල පොලිසියට අල්ලල දෙයිද දන්නෑ බං."

"එච්ච කොහෙද අපි ඉන්නකං."

මම හොරැහින් එබී බැලීමි. ඩෙනිම් කොට කලිසමක් - කහපාට බැනියමක් හැඳ උන් උසම උස කොල්ලෙකු වැටට අත තියා එල්ලී වන්නට පැන්නේය. මටත් වඩා උස වැටට උඩින් මිනු වන්නට පැන්නේ බොහෝ සැහැල්ලුවෙනි.

"මෙහෙ බෝලෙ නෑ මචං."

"ඔය ජනේලෙන් ඇතුලට ගියේ."

අඩි හඬ ළං ළංව ඇසිණි. මම අතකින් ජනේලය අල්ලා ගෙනම බිත්තියට මුවාවීමි. බිත්තිය කොණේ ගුලිව ගිය ළා කොළපාට ලෙදර් බෝලය මට රවාගෙනම උන්නේය.

"ගෙදර කව්ද?"

ඒ හඬ ගැඹුරුය. හිත හිරිවට්ටන සුළුය.

"ගෙදර කව්රුත් නැද්ද බං?"

වැටට එහා පැත්තේ වූ තඩය කෑගෑවෝය.

"ගලක් අල්ලපු රත්තරන් මුද්දක් දාපු අතක් නම් පේනවා."

මම ජනේලය අල්ලාගෙන උන් මගේ අත දෙස බැලීමි. මේ මුද්ද මගේ අත පැලඳුවේ සුදාරකය. මම වහා අත ඇතුළට ඇද ගතිමි.

"අපේ බෝලෙ ගේ ඇතුලට ආවා. ඒක ගන්න පුළුවන්ද?"

මගේ මූණ නොදැක්කත් ජනේලය ළඟ කෙනෙකු ඉන්නා බව වටහාගත් තරුණයා කීවේය. බෝලය අහුලාගත් මම ජනෙල් රෙද්දට උඩින් හොරෙන් බැලීමි. මැදින් බෙදා කඩා හැලෙන කෙස් කළඹක් - සනව වැඩුණු ඇහි බැම්වලින් වැසී ගිය හීනි දෑසක් ඇති සොඳුරු මුහුණක අයිතිකරුවකු ජනේලය ළඟ සිට උන්නේය. ඔහු ජනේලය දෙස බලා උන්නාට - අස්සෙන් එබී බලන මාව දක්කේ නැත.

"ප්ලීස් අපේ බෝලෙ දෙනවද?"

ඔහු නැවත ඇසුවේය. මසිත ගැස්සිණි. ඒ ඇස් දැක - මුහුණ දැක - කටහඬ අසා මගේ පපුවට මොනවාදෝ විණ. සුදාරක ළඟදීවත් මා මෙයාකාර සැලුනේ නැතොවේද?

මම අත පමණක් එළියට දමා බෝලය පෑවෙමි.

"තැන්ක්ස්."

මගේ අත තිබුණේ වෙව්ලමිනි. වෙව්ලන අත දෙස මොහොතක් බලා බෝලය උදුරාගත් ඔහු අඩියට දෙකට වත්ත පියමං කළේය. තවත් අඩියකින් වැට පැන මිතුරන් අතරට වැටුණේය.





"අපි උන්නෙ උඹ එහෙ බින්න බැස්ස කියලා."

"අනේ මන්ද බං.... සිරාමයි මේ ඇත්ත කියන්නේ. සුදුම සුදු බෝල අතක් ආව එළියට බෝලෙත් එක්ක... සට සට ගලා ඒ අත වෙව්ලනවා... මං බෝලෙ අරන් ආවා."

ඔහු මිතුරන්ට රඟදක්වාම කීවේය.

"හොල්මන්ද?"

"මංදා.... සුදු අත දැකලා මාවනං හොල්මං...."

මගේ සිතේ සියුම් තැනක් පිපිරිණ.

"ම... රතු ගලක් අල්ලපු මුද්දක් තිබ්බා අතේ."

කොලුකමට ඔහු කී හැමදේ මගේ හිතේ ඇතුළු තැනක තැන්පත් විණ. මම ඔහු සුදු බෝල අත යැයි කී මගේ අත පපුවට තබා ගතිමි. හයියෙන් හයියෙන් පපුව ගැහිණ. හරියට ඇතුලේ සිදුවෙන මේ හාස්කම දරාගන්නට බැරුව වාගේය. අනවසරයෙන් වත්තට පැනගත් මේ ආගන්තුකයා අර කොලු රෑනේ දඩබ්බරයා මගේ හිතේ මතක හිටින යමක් අතපසු කොට දමා ගොස් තිබිණ.

දහවල් දවස පාළුවේ ගෙවන මට සවස් වන්නේ පමාවීය. හවස තුන වෙද්දී ඉර හැරෙන්නට පටන් ගනී. ඈත පොල්රුප්පාවට බැහැගෙන යන ඉරේ රත වදින වෙලාවට නොවැරදීම පෙරදා මෙන්ම තරුණයින් පිරිස වෙල් ඉපැනැල්ලට රොක්වේ. අප මෙහි පදිංචියට එන්නට පෙරදී පටන් එය ඔවුන්ගේ පිට්ටනිය බවට පත්ව තිබෙන්නට ඇත.

"බෝක්කුවා.... හරියට රකින්න බැරිනං ගෙදර පලයං."

"මූ ගෑණියෙක්නේ... අතට ආව බෝලෙ අතෑරියා."

ඔවුන් එල්ලේ හෝ ක්‍රිකට් ගහන්නේ උපරිම විනෝදයෙනි. දවල් දවසේ මොනා කළත් හවසට කුස්සියේ ජනේලයෙන් රහසේ මේ පිරිස සෙල්ලම් කරන දෙස බලා ඉන්නට මම හුරුවීමි.

"ඒයි නිකං වනන්නැතුව බෝලෙට ගහපං."

"ඔකා ඉන්නෙම බඩුව ගැන හිත හිතා. ඉතින් බෝල ගහයිද?"

"කව්ද බං මූගේ අළුත් කෑල්ල?"

"අර ආව් ක්ලාස් එකට අළුතින් ආව කොට එක."

"නයි කයිද රෝස්පාන් කිව්වලු.... සයන්ස් එකේ රොෂානයත් ජකිට ට්‍රයි..."

මෙ සෙල්ලම අතරදී කොල්ලන් සමහර විට කතාවෙන දේවල්ය. මම සිතින් ඔවුන්ගේ වයස මැනීමි. කලාව හා විද්‍යාව පන්ති ගැන කතා කළ හින්දා ඔවුන් උසස් පෙළ හදාරන්නන් විය යුතුය. ඒ කියන්නේ මා වයසින් මේ තරුණයින් සැමටම වඩා බාලය. පෙනුමින්ද එහෙමය. ඔවුන් හැමදෙනාම වාගේ මට වඩා උස මහත අයය.

"දඩස්"

ඇර දමා තිබුණ ජනෙල් පලුවෙන් අදත් බෝලය කුස්සියට වැටිණ.

"මූ අදත් බෝලෙ ගැහුව නේද හොල්මන් ගෙදරට."

හොල්මන් ගෙදර. ඔවුන් මගේත් - සුදාරකගේත් ගෙදරට නමක්ද දමා තිබේ.





"මූට අදත් අර රතුගල් මුද්ද තියෙන අත මිරිකන්න හිතලද කොහෙද?"

"මෙහෙ හොල්මං නෑ බං."

උස් සෑපු ඇඟ රිද්මයට පද්දාගෙන අර කඩවසම් තරුණයා වත්තට පැන්නේය. පෙරදා වාගේම ඔහු ජනේලය ළඟට ඇවිද ආවේ බයක් හැකක් නැතුවය. නමුත් මගේ හිතනම් බයින් පිරි ගැහෙමින් තිබිණ.

වෙණුර - කොළු නඩේ දඟයා මගේත් සුදාරකගේත් ගෙදර මායිමේ හිටගෙන උන්නේය. මම හොරෙන් එබී බැලීමි. ඔහුට වූයේ කෙල්ලන්ගේ කතාවට ලක්වන සිරුරකි. හීන් උස් සිරුර - දරදඬු අතපය මගේ හිතේ ඇති කළේ ගැස්මකි.

"ගෙදර කව්ද?"

වෙණුර කුස්සිය මිදුලේ හිද කෑගැහුවේය. මම උත්තර නොදී බෝලය අහුලා ජනේලයෙන් එළියට පෑවෙමි. බෝලයත් සමග ජනේලයෙන් එළියට වැටුණු මගේ අත දෙස බැලූ ඔහු බෝලය ගත්තේය. ඒ අතේ ඇඟිලි දෙකක් මගේ අතේ ඇතිල්ලිණ. හිත මට කතාකොට මොනවාද කීවේ ඒ මොහොතේය.

"මේ.... මට වතුර එකක් දෙනවද?"

වෙණුර ඊළඟ විනාඩියේදී ඇහුවේය. ඔහු වතුර ඉල්ලන්නේ උවමනාවකට නොවේ. ඔහුට උවමනා වන්නේ මේ අත අයිති මගේ මූණ බලාගන්නය. වතුර ටිකක් ඉල්ලූ කෙනෙකුට නොදී අහක බලන්නත් බැරිය. මම දෙගිඩියාවට පත් හිතින් වීදුරුවක් සෝඩා වතුර එකක් පුරවා ජනේලයෙන් ඔහුට පෑවෙමි. වෙණුරට

සිදුවිය. එදා වගේ අදත් මගේ අත පමණක් බලා සැනසෙන්නට සිදුවිය.

"පූල් ට්‍රයි කරා.... ඒත් මූණ බලාගන්න බැරි උනා."

"හැමදාම රතුගල් මුද්ද දාපු බෝල අත විතරයි එළියට දාන්නේ."

වෙණුර - ඔහු මා දකින්නට - මගේ මූණ දැක ගන්නට ලොකු උවමනාවකින් උන්නේය. මම ජනේලය වසා දැමීමි. එහෙත් කළුවර වැටෙනතුරුත් මට කොල්ලන්ගේ කරච්චලය වෙල් ඉපනැල්ල දෙසින් ඇසිණ. කැප් තෝප්පිය ඉස්සරහ පස්සට දමාගෙන බෝල පිත්ත කර තබාගෙන වෙණුර ගෙදර ගියේත් හොරැහින් අපේ ගේ දිහා බල බලාය.

කළුවර අහුමුළු හොය හොයා වැතිරිණි. මම බුදු පහන තියා රෑට කන්නට බත් උයා කරවල තෙල්දමා පරිප්පු හැදුවෙමි. සුදාරක මට ගෙදරට උවමනා කළමනාදිය ගෙනැවිත් දුන්නේ පෙරේදාය. කඩෙන් කන කෑම නවතා ඔහුට හැකි අයුරින් උයා පිහා දෙන්නට මම කැමැත්තෙන් උනිමි.

වෙනදා සුදාරක ගෙදර එන වේලාව පරක්කු වද්දී මට බියක් දැනිණ. සුදාරක හැරෙන්නට මට දැන් මෙලොව පිහිටක් නැති වග මට අවබෝධ වූයේ ඒ මොහොතේය. යතුරු පැදික් විත් ගෙමිදුලේ නතර විය. මගේ හිත ගැහෙන්නට පටන් ගත්තේය. මට සුදාරකගේ පියා සිහිවිය. පුංචම්මා සිහිවිය. දැන් මේ කොයි කාගෙන්වත් මට යහපතක් වන්නේ නැත. මේ පැමිණියේ ඒ අයගෙන් කවුරු විය දැකිද?

"මානවී..."





ඒ සුදාරකය. මම ඉගිලී ගොස් දොර හැරියෙමි.

"කොහොමද කෙල්ලේ ?"

සුදාරකගේ උස මහත සිරුර දොරකඩ අවුරාගෙන සිටගෙන උන්නේය. මම ඔහුගේ අත අල්ලාගෙන මිදුලට එබී බැලීමි. මිදුලේ පසෙක ලයිට් එලියෙන් ඔපවැටී නතර කොට තිබුණේ යතුරු පැදියකි.

"කාගෙද?"

මා ඇසුවේ සුදාරකගේ දකුණතේ එල්ලුණ හෙල්මටය දෙසද බලාය.

"මං ගත්තා හොඳද?"

සුදාරකගේ ඇස් ආඩම්බරයෙන් බබලමින් තිබිණ.

"මේ වේලාවේ ?"

"ඔව් බබී.... බස්වල හිරවෙලා තෙරපිලා ගිහින් මට දැන් එපාවෙලා කෙල්ලේ... බස් එකේ ඔෆිස් ගිය මේ දවස් දෙක තුනට මට එපා උනා. කොච්චර උදෙන් ගියත් ට්‍රැෆික් හින්දා වේලාවට ඔෆිස් එකට යාගන්නත් බෑ."

දනිමි. සුදාරක දුක් විඳ හුරුපුරුදු කෙනෙකු නොවේ. බස්වල ගමන් බිමන් ගිහින් පුරුදු නැති ඔහුට එයට හුරු වෙන්නත් අමාරුය. ඔහු මෙරීනාව විකුණුවේ මා හින්දාය. මට මේ ගේත් බඩුත් අරන් දෙන්නට ඔහු මෙරීනාව විකුණා මුදල් කළේය.

"ඒත් මේ වේලාවේ සල්ලි කොයින්ද?"

"මං ලෝන් එකක් දැම්මා. ටික ටික පඩියෙන් කැපේවි."

සුදාරකට ඇඳුම් මාරු කරන්නට ඉඩහැර මම කුස්සියට ගොස් හිටරය ගැසීමි. තුවායක් ඉනවටා දවටාගෙන ආ සුදාරක කුස්සියේ කුඩා මේසය මත තබා තිබූ හට්ටි එකිනෙක වැහුම් ඇර බැලුවේය.

"දැන් ලොකු ගෑණියෙක් වෙලා නේද?"

ඔහුගේ මුහුණේ සතුට - ආදරය උතුරමින් තිබිණ.

"ම්... ඇත්තටම රසයි මානවී...."

ඔහු තෙල් දැමූ කරවල කෑල්ලක් කටට දා ගත්තේය.

"ගිහින් ඇඟහෝදගෙන එන්න. මං තේ එකක් හදලා දෙන්නං. රෑ වෙලා බත්කමු."

සුදාරක පැමිණ මගේ හිසකේ මෘදුවට අතගෑවේය.

"මගේ ඇගේ දාඩියනේ.... නැත්තං මෙහෙම්මම තුරුල් කරගන්නවා."

ඔහු හොඳය. ඒ හිතේ මට ආදරය මහමෙරකට තිබේ. ජීවිතේ මුල් අවදිය පුංචම්මලාගේ ගෙදර වැටී අපා දුක් වින්දත් මෙහෙම පිරිමියෙකු ලබන්නට මා පින්කොට තිබේ.

"මං හෙට නිවාඩුවක් දැම්මා මානවී. බයිසිකලේ ඉස්සරවෙලා අපි කැලණි යං."

සුදාරක එදා රෑයේ කීවේය.

"හෝක් අනේ මෙහාට ආවත් හරි මට නාම බැරි උනා මේ ගෙදරින් එළියට යන්න."

මම සතුටින් කීවෙමි.





"අපි පරිස්සං වෙන්න ඕන මානවී. අඩුම තරමෙ තව අවුරුදු දෙක තුනක්වත් යනකං මාත් එක්ක මිසක් ඔයාව තනියම කොහෙවත් යවන්නෑ මං. තාත්තගෙ මැරයො මේ රටේ හැම අහුමුල්ලකම ඉන්නවා. අපි උන්ගෙන් පරිස්සං වෙන්න ඕනේ."

"පුංචම්මාට හරි බාප්පාට හරි අහු උනොත් මට කරන්නෙත් ඔයාගෙ තාත්තට මාව අහුඋනොත් කරනදේම තමයි."

මගේ කටහඩ බිඳී තිබිණි. කොයි මොහොතක හෝ මේ නපුරු මිනිස්සුන්ගෙන් කෙනෙක් පැමිණ මගෙන් මගේ සුදාරකත් මේ විඳින සොම්නසත් උදුරාගන්නට පුළුවන.

"මං ඉන්නකං අපි දෙන්නව වෙන් කරන්න කාටවත් බෑ මානවී. අනික අපි දෙන්නා දැන් නීතියෙන් කසාද බැඳලා."

"ඒත් මහත්තයා අපි බැන්දේ මට බොරු වයසක් දාලනේ."

නීතියෙන් ඔහුගේ බිරිය වන්නට මා වයස සම්පූර්ණ කොට තිබුණේ නැත. ඒ නිසා සුදාරක මා කසාද බැඳගත්තේ බොරු වයසක් දමාය.

"ඒක දන්නෙ ඔයයි මමයි විතරනෙ බබෝ..."

සුදාරක මගේ කන් පෙත්තක් මෘදුවට මිරිකාගත්තේය.

KATHAPOTHAK.BLOGSPOT.COM

## 03

සුදාරකගේ බිරිය වී ලොවට රහසේ ජීවත් වූ මම සුදාරකගේ ළඟින් වාඩිවී යතුරු පැදියක නැගී රවුමක් යන්නට යටි හිතින් බොහෝ ලොබ වීමි. තරමක් තරබාරු වීද උස් වූ සුදාරකගේ දේහය කඩවසම්ය. විසිහත්වන විය පසුකරමින් උන් හන්දාදෝ ඔහුගේ බඩද තරමක් ඉදිරියට නෙරා තිබිණි. හරියටම කිව්වොත් මා යන්තමින් සුදාරකගේ පපුවට පමණ උසය.

"මේක දැම්මම ඔයාව කාටවත් අඳුරගන්න බැරිවෙයි."

සුදාරක මගේ ඔළුවට හෙල්මටය දමා එහි ඉදිරිපස වීදුරුව පහතට හෙලුවේය. ඇත්තය. අඳුරු හෙල්මටය තුළින් මට හාත්පස පෙනුනේද අපැහැදිලිවය.

"මට මොකුත් හරියට පේන්නැනෙ."

"ඒකට කමක් නෑ. ඩ්‍රයිවින් කරන්නෙ මංනෙ. ඔයාට තියෙන්නෙ මගෙ පිටි පස්සෙන් ඉඳන් හිරකරලා මාව බදාගන්න එකයි."





මම ඔහු කිවා වාගේ කළෙමි. සුදාරක බයිසිකලය පණගන්වාගෙන පාරට වැටිණ. නුහුරු නුපුරුදු මංමාවත් ගහකොළ හා මිනිසුන් අපට පසුවිය. මේ ගමේ පදිංචි වුවාට මා නාමත් මේ පරිසරයට නුහුරුය. කැලණි වෙහෙරේ රථගාලේ මලින් පිරුණු මැයි ගහක් පාමුල සුදාරක බයිසිකලය නතර කළේය.

"මට නිල් මානෙල් මල් අරන් දෙන්න."

නේක වර්ණ මල් පිරුණු මල් කඩ පෙරහැර දෙස බලා මම සුදාරකට කීවෙමි. ඔහු වයසක අම්මා කෙනෙක් උන් කඩයකින් මට මල් මිටියක් අරන් දුන්නේය. අපි පිළිවෙළින් දාගැබට, බෝධියට හා විහාර ගෙයට මල් පූජා කළෙමු.

"මානවී..."

විහාර ගෙයින් එළියට බැස්සා විතරය. ඒ හඬට මාත් සුදාරකත් හැරී බැලුයේ තිගැස්මෙනි. වින්දයා, අමායා, මධුවන්ති හා ශාරිකා මගේ පන්තියේ මිතුරියන් ඊලම වින් මා වටකොට ගත්හ.

"අනේ මානවි දැක්ක කල් ඇයි දූන් ඉස්කෝලෙ එන්නැත්තේ?"

"අපි ඔයාව හොයන්න දවස් දෙකක් පුංචි අම්මලාගෙ ගෙදරටත් ගියා. ඒ ගොල්ල කිව්වා ඔයා දූන් එහේ නෑ කියලා."

"ඔයා දූන් කොහෙද ඉන්නෙ මානවී?"

මිතුරියන්ගේ ප්‍රශ්න අතර මගේ හිත අතරමංව ගියේය. මෙයැයි පැහැදිලි කල නොහැකි ගින්දරක් මගේ හිත පිරිණ. මම අසරණව ගිය ඇසින් සුදාරක දෙස බැලීමි. මා සමඟ තවත් කෙනෙකු වූවග මිතුරියන්ට අවබෝධ වූයේ ඒ ඇසිල්ලේය.

"උඹ බැන්දද?"

වින්දහා මගේ කනට කොට ඇසුවාය. මම 'ඔව්' යි කියන්නට හිස සෙලවීමි.

"අපරාදෙ බං උඹට කොච්චර හොඳට ඉගෙනගන්න පුළුවන්ද?"

ඈ ඊළඟට කීවාය.

"අපේ පන්තිභාර ජයතිලක සර් ඊයෙත් කිව්වා මානවී හිටියනම් ඒ දහයක්ම ඔලෙවල් වලට ගනියි කියලා."

අමායාත් කීවාය.

මගේ ඇස්වලට කඳුළු පිරිණි. ඇත්තය. පාසලේ ළමුන් පමණක් නොවේ. ගුරුවරු පවා මට ආදරය කලා නොවේද? ඒ සියල්ල නැතුව යාමේ දුක පළමු වරට මට දැනුණේ මේ මොහොතේය. සුදාරක වැනි පිරිමියෙකු ලැබීමේ සතුට මාළඟ වීද, බාලිකාවක ලෙස මගේ වයසට මා දකි සිහින සියල්ල හදිසියේ උරුම වූ ප්‍රේමයක් හෝ විවාහයක් නිසා අමතක කර දැමිය හැකිද?

"උඹට තව ටිකක් ඉවසන්න තිබ්බා බං."

අමායා කීවේ කණට කොට වීද එය සුදාරකට ඇසිණ. ඔහුගේ ඇස්වලට අර අඳුරත්, දුකත් ආවේ ඒ හන්දාය.

"අපි යනවා මානවී... අද සිංහල ක්ලාස් එක ටිකක් වෙලාසන ඇරියා. ඒකයි අපි කැලණි ආවේ."

මිතුරියන් මගෙන් සමුගත්හ. ලෙදර් බෑග් කරේ එල්ලාගෙන පාට පාට කොට ඇඳුම් ඇඳගෙන - කඩල උරයක් බෙදා කමින් යන ඔවුන් දෙස මම මොහොතක් නතරව බලා උනිමි. ඒ දවස්වල මාද ඔහොමය. ලෝබකමක් - දුකක් සැණින් මගේ හිතට ගොඩවිය.





"දුකද?"

"ඇයි ?"

"අර ජීවිතේ මං හින්දා ඔයාට නැති උනාට..."

"නෑ..."

"එහෙනං ඇස්වල මේ කඳුළු?"

"මට ඒ කාලෙ මතක් උනා මහත්තයා. මාත් ඔහොමයි. ක්ලාස් ඇරිලා යාළුවො එක්ක රංචු ගැහිලා පරක්කුවෙලා ගෙදර යනවා. ඒ ගිහින් පුංචි අම්මගෙන් ගුටිකනවා."

"මටත් මතකයි. කොටම කොට සුදු ගවුමක් ඇඳගෙන සුදුපාට කකුල් දෙක එළියෙ දාගත්තු කෙල්ලෙක් පිටේ ලොකුම ලොකු බෑග් එකක් එල්ලගෙන ඇවිත් හන්දියෙදී මගේ මෙරීනා එකට පැන්න."

සුදාරක හිනැහෙමින් කීවේය. මට ඔය දවස හොඳාකාරවම මතකය. මට හාහා පුරා කියා සුදාරක හමුවූයේ එදාය.

"මං බයවුණා එදා මාව යටකලා තමා කියලා."

"පාරෙ යන හොඳ වාහනයක් හොය හොයා කුරුමානම් අල්ල අල්ල ඉඳලා අන්තිමේදී මගෙ මෙරීනාවටම පැන්න නේද?"

සුදාරක ඔය හදන්නේ මා අවුස්සන්නය.

"අනේ යන්න අනේ..."

මම සුදාරකගේ උරයට සෙල්ලම් පහරක් ගැසිමි. ඔහු මගේ අත හිරවෙන්නට අල්ලාගෙන වෙහෙරේ මකර තොරණ පසුකොට බැස්සේය.

"කොහෙද මේ යන්නේ බයික් එක අනික් පැත්තෙන් නතර කළේ."

මම ඇසීමි.

"ගඟ පැත්තට යං.... හුලං ටිකක් වදින්න."

සුදාරකත් මමත් ගං ඉවුරු බැම්මේ තණ තිල්ල මත වාඩි වීමු. මම සුදාරකගේ බාහුවේ කම්බුල අතුල්ලාගෙන ගංදිය දෙස බලා උනිමි.

"මානවී..."

බැරෑරුම් යමක් කියන්නට සුදාරක කට හැදුවේය.

"මානවී මට හිතෙනවා මං ඔයාට වරදක් කළා කියලා."

"ඇයි ඒ ?"

මම මවිතයෙන් දෙනෙත් උස්සා බැලීමි.

"ඔයා තාම පුංචි ළමයෙක්. ඉස්කෝලෙ යන වයසෙ පොඩි කෙල්ලෙක්. මං ඔයාව බැඳගෙන ඔයාගෙ ඔළුවට වගකීම් පැටෙව්වා. මං ඔයාව බැන්දෙ නැත්තං ඔයා තාමත් ඉස්කෝලෙ යනවා. ඔයාගෙ ඉගෙනීම කඩාකප්පල් වුනේ මං හින්දා."

"මොනාද මේ කියන්නේ ?"

මම සුදාරකගේ කම්බුල මා දෙසට හැරවීමි. ඒ නෙත්වල පුංචි පුංචි කඳුළු කැට ඉහිරී තිබිණ. අදහන්න - මගේ ගැහැණු ආත්මය මොහොතකට සසල විය.





"යාළුවෝ කියපු දේවල් අහල ඔයාට හිත රිදුනාද? එහෙම හිතන්න එපා අනේ. මගෙ යාළුවෝ දන්නේ මගේ ජීවිතේ එක පැත්තක් විතරයි. මං පුංචම්මගෙ ගෙදර කොයි තරම් නම් දුකක් වින්දද? ඔය කවුරුවත් දන්නේ නෑ. මට ඉගෙනීම අත්අරින්න වෙච්ච එක ගැන දුකක් නෑ කියලා මං ඔයාට බොරු කියන්නෑ. ඒත් මහත්තයෝ මට ඊට වඩා සතුටු වෙන්න දෙයක් දැන් ලැබිලා තියෙනවා. ඔයා තරම් මට ආදරේ කරන කෙනෙක් මට කවදාවක් ලැබිල තිබුණේ නෑ. ඉතින් ඔයාව මට අයිති වෙච්ච එකම මොනතරම් දෙයක්ද?"

මා මේ සියල්ල කීවේ ඔහුගේ හිත සනසන්න විතරක්ම නොවේ. මේ මගේ හිතට දැනුණු ඇත්තය.

"ඒත් මානවී.... ඔයා වගේ ඉගෙනගන්න දක්ෂ ළමයෙක් මෙහෙම ඉගෙනීම කඩාකප්පල් කරගත්ත එක හොඳ නෑ. අඩුම තරමේ ඒ ලෙවල් කරනකන්වත් ඔයාට ඉස්කෝලෙ යන්න තිබ්බනම් හොඳයි.

සුදාරක කීවේ සුසුමක් හෙළාය.

සුදාරක හා විවාහයෙන් පසු මා පන්සලකට කියා ගියේ කැලණි විහාරයටය. සුදාරක මා හා ආපසු එද්දී පවා උන්නේ කල්පනාබරවය. මගේ මිතුරියන් හමුවී කතාබහ කළ දේවල් හන්දා ඔහුගේ හිත කැලතී තිබූ බව මම වටහාගතිමි.

"මහත්තයා හෙමින් යමු."

මම පස්සේ හිඳ ඔහුට කීවෙමි. වරෙක සුදාරක අතින් බයිසිකලයේ වේගය ඒ තරමට වැඩිවේ. අපි වෙන්දේසි වත්ත පාමුලට කිට්ටු කළෙමු. වංගුව ගනිද්දී ඉදිරියෙන් ආ කාරය පළමුව අපේ නෙත ගැටුණේ නැත.

සුදාරකට වාහනය පාලනය කර ගැනීම අසීරු විය. ඔහු පාරේ අයිනට වාහනය ගත්තේ වේගයෙනි. පාර අයිනේ නතර කොට තිබූ පාපැදි කීපයක්ද හප්පාගෙන ගොස් සුදාරක යතුරු පැදිය නතර කොට ගත්තේය.

"අනේ දෙයියනේ"

මට කෑගැසිණි. සුදාරක පවා තැතිගෙන උන්නේය.

"අඩෝ මොකාද ඒ..?"

"අන්න අපේ බයික් ටික යට කළා."

"වරෙල්ලා බලන්න චණ්ඩියා කවුද කියලා."

පාර අයිනේ පිට්ටනියේ වොලිබෝල් සෙල්ලම් කරමින් උන් තරුණයින් රැන සැණින් අප වට කොට ගත්හ. වෙණුර - අර දාංගල් කාරයා ඒ රැනේ පෙරමුණ ගෙන උන්නේය. අනෙක් මුහුණු මට ඔහුගේ මූන තරමට මතකයක් නැතුවත් මේ අර ඔහුත් එක්ක අපේ වෙල පහල හවසට එල්ලේ ගහන රංචුව වන්නට ඇත.

"උඩ බලන්ද එලවන්නෙ මිනිහෝ.."

වෙණුර පැන සුදාරකගේ කමිස කොලරයෙන් අල්ලා ගත්තේය.

"මෙච්චර පාර ඉඩ තියෙද්දි අයිනෙ නතර කරල තියෙන සයිකල් ටික උඩින්ම ගියා. මොකද උඹට කෙල්ල දාගත්තම බයිසිකලේ යන්නෙ පොලව උඩින් කියලා අමතකද?"

"කෙල්ල දාගත්තම මුත් යන්නේ අහසින්.."





මම ඇත මැත බැලිමි. අප හප්පන්නට වාගේ ඉදිරියට ආ වාහනය දූන් පේන්නට නැත. එය වංගුව පසුකොට ගිහින්ය. ඉතින් සුදාරකටත් - මටත් වූ ඇබැද්දිය තේරුම් කරවන්නේ කොහොමද?

"ඇදල ගනින් දෙකක් නෙලමු ආයෙ මෙහෙම නොකරන්න."

එකකු වෙණුරට කීවේය. වෙණුර එක අතකින් සුදාරකව බයිසිකලයෙන් අදින අතර අනිත් අත ඔහුට පහර දෙන්නට උඩට එසවිය.

"අනේ එපා.... එපා...."

මට කෑගැසිණ.

නොදැනුවත්වම මගේ අතින් මම වෙණුරගේ අතේ එල්ලිමි. වෙණුර සැණින් හිස හරවා ඔහුගේ අත මිරිකාගත් මගේ අත දෙස බැලීය. ඔහු බැලුවේ සැලෙන මගේ අතැඟිලි දෙස නොවේ. මා අතේ වූ රතුගල් ඇල්లු මුද්ද දෙසය.

විශ්වාසය - වෙණුර ගැස්සිණ. ගැස්සුණ ඒ ඇස් ඉස්සී මගේ මූණට විසිවිණ. ඔහු සැඟව ගිය යමක් හොයන්නා වාගේ කළුපාට ආවරණයක් යෙදූ හෙල්මටය අස්සේ මගේ නෙත් හෙව්වේය.

මට වෙණුරගේ අතත් - වෙණුරට සුදාරකගේ කමිස කොලරයත් අතහැරිණ.

"යන්න...."

වෙණුර සුදාරකට කීවේය.

ඔහුට මා මතකය. ඔහුගේම භාෂාවෙන් කියනවා නම් හොල්මන් ගෙදරදී බෝලය දුන් අත ඔහුට මතකය.

"වෙණුර උඹට මොක උනේ? බලපං මේ යකා අපේ සයිකල් ටික හප්පල තියෙන හැටි. හන්දියෙ වින්කලේ සිරි අයියට මේ ටික ගොඩගන්න තව අවුරුද්දක්වත් යයි."

මිතුරෙකු වෙණුරට කීවේය. මම ද හැරී බැලීමි. ඇත්තය. සුදාරකගේ බයිසිකලයට යටවූ ඔවුනගේ පාපැදිවලට සෑහෙන අලාභහානියක් සිදුව තිබේ.

"කමක් නෑ අදට යන්න දෙමු."

වෙණුර මිතුරන්ට කීවේය.

"දැන් මෙතනින් මාරුවෙන්ඩ... හැබැයි ආයෙත් මේ වගේ වැඩ කරන්නෙපා."

වෙණුර සුදාරකට කීවේය.

"හිතල කලා නෙමෙ මල්ලී.... මාත් කොල්ලෙක් මං එහෙම වැඩ කරන්නෑ. ඉස්සරහට ආව වාහනේ බේරල අරින්න ගිහිල්ලයි මෙහෙම උනේ."

සිද්ධියෙන් අන්දමන්දව උන් සුදාරක පළමු වරට කතාකළේ දැන්ය. ඔහුට සිද්ධිය තේරුම් කරවන්නට අවස්ථාව ලැබී තිබේ.

"ඔය ටික මුලින් කීවනම් මේ ආබාධයක් නැනෙ අයියේ. අපිත් වෙච්ච සිද්ධියක් දැක්කෙ නෑ. දැක්කෙ ඔයා අපේ බයිසිකල් ටික උඩින් යනවා විතරයි."

වෙණුරගේ මිතුරකු සුදාරකගේ පිටට අත තිබ්බේය.



"මේ හරියේ දැකල පුරුදු මුහුණක් නෙමෙ... කොහෙද ඉන්නේ?"

තවත් අයකු සුදාරකගෙන් ඇහුවේය.

"වෙන්දේසි වත්තෙ."

සුදාරක උත්තර දුන්නේය.

"වෙන්දේසි වත්තෙ කොහෙද?"

"හරි.... හරි... බං.... මං දන්නවා තැන.... අයියා දැන් යන්න."

වෙණුර යළි සුදාරකට කීවේය.

"තැන දන්නවනම් ඉරිද දවසක කට්ටියම ඒ පැත්තෙ එන්න. තේ එකක් බීල යන්න පුලුවන්."

සුදාරක විවෘත ආරාධනයක් කළේය.

වෙණුරගේ ඇස් නැටවිණ.

ඔහු කෙලින්ම බැලුවේ මා දෙසය. මේ හෙල්මටය ඔහුට වදයක් වන්නට ඇත. මා හිස පලදා උන් එය නින්දා වෙණුරට මගේ මුහුණ පැහැදිලි නැත.

"අපි දවසක එන්නංකෝ..."

වෙණුර අර කුරු කොණ්ඩය ගස්සා කීවේය.

"ආ තවත් දෙයක් ඔය සයිකල්වල රෙපයාස් වලට යන වියදම මට කියන්නෝන. මං නොවරදවාම ඒක මල්ලිට ගෙවනවා."

සුදාරක නැවත කීවේය. මට සතුටක් දැනිණි. සුදාරක මගේ පිරිමියාය. ඔහු මෙලොවේ අනික් හැම පිරිමියෙකු ළඟදීම ඔළුව කෙලින් තියාගෙන ජීවත් විය යුතුය.

"අන්න එහෙම එමුකෝ. ෂේප් නම් ෂේප්. වලිනං වලි."

වෙණුරගේ මිතුරකු සුදාරකගේ පිටට තට්ටුවක් දමමින් කීය.

සුදාරක හිනැහෙමින් බයිසිකලය ස්ටාට් කර ගත්තේය.

"එහෙනං අපි ගිහින් එන්නං. ඉරිදට නොවරදවාම ඒ පැත්තෙ එන්න ඕන."

සුදාරක මා රැගෙන ඉගිලෙද්දී මම වරක් හැරී බැලීමි. වෙණුර ඔහු මිතුරන් හා එකතුව පිටුපා යන අප දෙසම බලා උන්නේය. ඔහු මිතුරන්ට මා ගැන කියාවිද? මම සිතීමි. ඔහු සමහර විට මිතුරන් හා මා ගැන කියන්නට පුළුවන. නොකියන්නටද පුළුවන. වෙණුර මේ දෙකින් කොයික කරාවිදැයි මා දන්නේ නැත.



# 04

විවාහයෙන් පසු ගෙවන පළමු මාසය වූ මේ කාලයේ සුදාරක උන්නේ බොහෝ සතුටිනි. සතියේ දවස් පහ ඇතුළත දවල් කාලයේ සුදාරකට මා ළඟින් ඉන්නට බැරි උනත් රාත්‍රියේ ගෙවෙන හැම තත්පරයක්ම සුදාරක මා ළඟින් තියාගන්නට ආසා කළේය. එහෙත් වෙණුර හා ගැටුම ඇතිවූදා රැයේ සුදාරක තුළ පැහැදිලි වෙනසක් තිබිණි.

"මහත්තයා ඇයි.....?"

මා තුරුළු කොට ගෙන හිඳීමෙන් පමණක් එදා රැය සැනසීමට හිත හදාගෙන උන් සුදාරකගෙන් මම ඇසුවෙමි.

"මුකුත් නෑ...."

"මුකුත් නෑ නෙමේ. ඔයා මොනා හරි කල්පනා කරනවා."

"මං ඔයා ගැන කල්පනා කරනවා මානවී"

ඒ සවිමත් පපුතුරේ හොවාගෙන උන් හිසෝසවා මම සුදාරකගේ දෑසට එබීමි.

"මං ගැන මොනාද කල්පනා කරන්නෙ..?"

"ඔයා අයෙ ඉගෙනගන්න ඕන මානවී."

මට පුදුමු හිතිණි. නැත මට විශ්වාස කරන්නට බැරිවිණි.

"ඔයා කියන්නෙ මට ආයෙ ඉස්කෝලෙ යන්න කියලද?"

මම දෙඇස ලොකු කොටගෙන කෑ ගැසුවෙමි. මගේ දෑස දෙස බලා උන් සුදාරකට ලොකු හිනාවක් ගියේය.

"මෝඩ කෙල්ල... ඔයාට ආයෙ ඉස්කෝලෙ යන්න බෑ කියලා මං දන්නවා"

මම ඇදේ ඉඳගතිමි. සුදාරක කියනා දෙය හොඳින්ම අහගන්නට මට ඕනෑ කොට තිබිණි.

"ඔයාට පුළුවන් බාහිරව උසස්පෙළ කරන්න."

"මට බෑ."

මම මා අසල වැතිර උන් සුදාරකගේ පපුවේ ඇඟිල්ලෙන් ඉරි ඇන්දෙමි.

"ඇයි බැරි...?"

සුදාරක මගේ ඒ අත අල්ලා ගත්තේය.

"මට බබෙක් හදන්න ඕන."

උන්හිටි ගමන් මා කී ඒ දේ සුදාරකට බර වැඩි වෙන්නට ඇත. ඔහු ඉබේම ඉඳගත්තේ ඒ හින්දාය.

"දැන්ම බබෙක් හදන්න මගේ කල්පනාවක් නෑ මානවී."

"ඔයාට තව වයස තියෙනවා."





"ඒ උනාට මං දැන් බැඳපු ගෑණියෙක්. ඉස්කෝලෙ යන ළමයෙක් නෙමේ. ඒ හින්දා මට ඕනෙ බබෙක් හදාගන්න."

මම ජීවිතයේ පළමු වතාවට සුදාරකට මුරණ්ඩු වූයෙමි. සුදාරක බඳවටා අත දමා මා තුරුලට ගත්තේය.

"මානවී මේ අහන්න දරුවෝ."

ඔහු හැමදාමත් යමක් තේරුම් කරවන්නට ඕනෑ වූ විට කතා කළේ ඔය විදිහටය.

"ඔයාට ඉගෙන ගන්න බැරි උනානං මං ඔයාට බලකරන්නෑ. ඒත් ඔයාට හොඳට ඉගෙන ගන්න පුළුවන් කියලා මං දන්නවා. ඒකයි මෙහෙම කියන්නේ."

"ඒත් මං ඔයා එක්ක ආවේ ඒ ඔක්කොම අමතක කරලා. දැන් මට ඕනේ ඔයාට හොඳ බිරිඳක් වෙන්න විතරයි. ආයෙ පොත් පාඩම් කරන්න මට හිත හදාගන්න බෑ."

මම සුදාරකට කීවෙමි. උදේ ඉඳන් කළුවර වැටෙනතුරු ඇඟිලි ගනිමින් සුදාරකගේ උණුසුමට තුරුළු වෙන්නට කල් මරන හිත යළිත් ඉගෙනගන්නට යොමු කරන්නේ කෙසේද?

"හොඳයි... ඔයාට ඒ බැරිනං ඉංග්ලිෂ් ටිකකුයි කම්පියුටර් ටිකකුයි ඉගෙන ගන්න පුළුවන්නේ."

සුදාරක යළිත් මා දිරිගන්වන්නට උත්සාහ කළේය.

"මා ගැනවත් හිතලා හා කියන්න දරුවො."

"ඔයා ගැනවත් හිතලා ඇයි?"

"පුංචි අම්මා ළඟ ඉන්න කාලෙ මොන දුක් වින්දත් ඔයාට ඉගෙන ගන්න ඉඩ තිබ්බා. ඔයාව අරගෙන ඇවිත් කසාද බැඳලා ඉගෙන ගන්න එක නැතිකළේ මංනෙ. දූන් නොතේරුණාට අවුරුදු දෙකතුනක් යනකොට ඔයාටම උනත් එහෙම හිතෙයි කියලා මට බය හිතෙනවා. ඔයාගෙ හිතේ මේ දූන් මා ගැන තියෙන ආදරයයි ගෞරවයයි නැතුව යන්න ඒකම උනත් හේතුවක් වෙයි නේද මානවී."

"මං කවදාවත් එහෙම හිතන්නෑ. මට මාව විශ්වාසයි. මාව ඒ දුකින් මුදවගත්තේ ඔයා. ඔයාගේ පය පාමුල වැටිලා ඉඳගෙන මං ඒ ණය ගෙවනවා."

"ඒත් මං සතුටින් ඉන්නෙ හිතේ නිදහසින් ඉන්නෙ ඔයා මොනාහරි යමක් ඉගෙන ගත්තොත් විතරයි කියලා මගේ හිත කියනවනම් මානවී..."

"හොඳා.... මං කම්පියුටර් ටිකකුයි, ඉංග්ලිෂ් ටිකකුයි ඉගෙන ගන්නං."

සුදාරක රැකියාවට ගිය පසු මට ගෙදර දොරේ වැඩ කරන්නට ඕනෑ තරම් කාලය ඉතිරි වේ. උදෙන්ම නැගිට සුදාරකට ගෙනියන්නට බත් සහ ව්‍යංජන තුනක් හදාගන්නා හින්දා උදේටත් දවල්ටත් මට අමුතුවෙන් උයන්නට උවමනා නැත. ඒ බත්ම දෙවේලට කා මා රාත්‍රියට උයන්නට ගන්නේ හවස පහට විතරය. සුදාරක කොහොමත් ආසා කළේ කෑම බීම උණුවෙන් තියෙන විටදීය.

කීවා වාගේම සුදාරක මට ටියුටරියක් හොයාගෙන තිබිණ. "ස්පෝකන් ඉන්ග්ලිෂ්" වලට රට තුළ නම ගිය ඇදුරකු එහි ඉගැන්වීම කළේය. මෙය සුදාරකගේ වංදන් පොරෙන් බේරීමට ලකලෑහැස්ති





වූ ගමනක්විද යතුරු පැදියේ ගොස් ක්ලාස් එක ළඟින් බහිද්දී මට දැනුනේ මා ආයෙත් ජීවිතය ලැබුවා වාගේය.

"මානවී බහින්න."

සුදාරක මට කීවේය. මට පයක් බිමට තියා සුදාරකගේ උරිස්සට බරදී ඉස්සෙනගමන් ඉදිරිය බැලීමි. සිමෙන්ති ගලින් කොට තහඩු සෙවිලිකළ ශාලාවේ කෙටි බැම්මට බරදී උන්නේ වෙණුරය. සුදාරකගේ බයිසිකලයත්, ඔහුත් හඳුනාගත් වෙණුරගේ ඇස් ඊලඟට නතරවූණේ මා වෙතය.

"ක් කෝ.... ඉන්න මං හෙල්මට් එක ගලවන්න."

සුදාරක මගේ හිසින් හෙල්මටය මිදූවේය.

හිස ගස්සා මුදාහල කොණ්ඩය සකසමින් මගේ ඇස් වෙණුර වෙතට විසිවිණි.

වෙණුර - ඔහු ඇසිපිය නොහෙලා මා දෙසම බලා උන්නේ අදහාගන්නට බැරිව වාගේය. ඇත්තය - ඔහු මගේ මූහුණ දක්කේ අදය.

"මානවී"

සුදාරකගේ කටහඬින් මම පියෙවි ලොවට ආවෙමි.

"ඔයා මැරිකරලා කියලා මෙහෙ කාටවත් කියන්න ඕනනෑ."

"ඇයි ඒ.....?"

මා සුදාරකට ළංවෙන්නට ඇත්තේ තිගැස්සීය.

"මෙතෙන්ට ඔයා ඉගෙනගන්න ළමයෙක් විතරයි. සමවයසෙ ළමයි අතරෙදී ඔයාට කොන්වෙලා ජීවත් වෙන්න සිද්ධවෙයි."

සුදාරක මට තේරුම් කළේය.

"කවුහරි ඇහුවොත් කියන්න මං ඔයාගෙ අයියා කියලා."

"නෑ... මං කියනවා ඔයා මගෙ අන්කල් කෙනෙක් කියලා."

මම විහිළුවට කීවෙමි.

"පිටින් බලන අයට සමහර විට එහෙමත් හිතෙනව ඇති මානවී..."

සුදාරක කීවේ දුකින් වාගේය. මහිත පැලිණි.

"මං විහිළුවටනෙ කිව්වෙ අනේ..."

අවංකවම මම පසුතැවිලි වීමි.

"ඔයා යන්න ඇතුළට.... හවසට මං එන්නං එක්කං යන්න."

මම සුදාරකගෙන් සමුගෙන ශාලාවට ආවේ මිතුරන් අතරේ උන් වෙණුරව පාස් කොටගෙනය. වෙණුරගේ ඇස් මගේ මුහුණ මතම ඇලවී තිබිණ.

වෙල් ඉපනැල්ලේ බෝල ගැසූ අර දගයා - වෙණුර බුද්ධිමත් ශිෂ්‍යයෙකි. ඔහු ඉගෙනීමට දක්ෂම පෑවේය. මාදිවෙල සර් ඇසූ බොහෝ ව්‍යාකරණ පැන වලට උත්තර දුන්නේ වෙණුරය. පන්තිය තුළ ගතකළ කාලය කොයිතරම් ඉක්මණින් ගෙවී ගියාදැයි සිහිවූයේ ශාලාවෙන් එළියට ආ පසුවය. සුදාරකගේ රුව හාත්පස නොවූ නිසා මම බස් නැවතුම තෙක් මහපාරට පයින්ම ඇවිද ආවෙමි.

"අළුත් මූණක්"

"තනියෙන්ද යන්නේ....?"



"මේ ඔයා කොයි පැත්තෙද අනේ..."

බස් නැවතුමේ රංචු ගැසී උන් කොල්ලන් හතර දෙනෙක් මට නානාදේ කීහ. මට එදවස පාසල් කාලය සිහිපත් විය. එකල නම් මේ දේවල් මට අරුමයක් නොවේ. එහෙත් බිරිඳක - විවාහක කාන්තාවක වන මම මනසින් සියල්ල වින්දේ බලවත් නොසන්සුමෙනි.

"බ්‍රාස්..."

මවුන්ටන් බයිසිකලයක් මා ළගම නතරවිය.

මම ඇස් නැගීමි. වෙණුර - ඔහු සැහැල්ලු පොත් බෑගයක් කරේ එල්ලාගෙන මා ඉදිරිපිට බයිසිකලයේ උන්නේය.

"කොහොමද?"

කලක පටන් දන්නා හඳුනන කෙනෙකුට වාගේ වෙණුර මට කීවේය. මා වාගේම මා පස්සේ උන් රැළද අන්දමන්දව ගියා සිතුරුය.

"බස් එකේද යන්නේ...?"

වෙණුර එහෙම අසාගෙන බයිසිකලයෙන් බැස්සේය. කැප් එක ඇති අත්දිග ටී ෂර්ට් එකක් හැද උන් වෙණුර උසට උසේ මා ළග හිටගත්තේය. ඔහු කඩවසම්ය. ආගකාරය. බාලිකා හිතක් වශීකරණ සුළුය. මගේ ගැහැණු හිත අවංකවම මට කීවේය.

"මොකද බයවෙලා වගේ... මං ඔයාව ගිලින්නෑ. මේ පිටිපස්සෙ ඉන්න කට්ටිය ඔයාව ගිලී කියන බයට මං ළගට ආවේ..."

වෙණුර හිනාවී කීවේය.

මටද සිනා නැගිණි. ඔහු ආ එක ඇත්තටම හොඳය. පස්සේ ඉද මට අනම් මනම් කි රංචුව විසිර ගියේ තත්පරයෙනි.

"මාව මතකයි නේද? මට නම් ඔය රතු ගල් අල්ලපු මුද්ද ජීවිතේට අමතක වෙන්නෑ."

මට මගේ දකුණත දෙස බැලිණ. අර රතුගල් මුදුව ඒ වේලාවේත් මගේ ඇඟිල්ලේ තිබිණ.

"ඔයාව අර එක්ක ආවේ අයියා නේද?"

වෙණුරට සුදාරක කව්දැයි දැනගන්නට ඕනෑ කොට තිබිණ.

මම "ඔව්" යි කීවෙමි. එහෙත් ඒ පසුවෙන් පිච්චෙමිනි. කසාද බැඳගෙන ඉන්න හිටින්න දූන් - කන්න බොන්න අඳින්න දූන් පිරිමියාට වංචා කළා වාගේ ගතියක් යටි හිතට දැනිණ. එහෙත් මට එහෙම කියන්නැයි කීවේත් සුදාරකම නොවේද? මම නිවැරදි වන්නට වෙර දැරුවෙමි.

සුදාරකගේ රතුපාට බයිසිකලය ළංවෙනවා මා දැකියේ මේ නොසන්සුන්කම හිත පෙලද්දීය.

"හලෝ මල්ලියා.... මට ඒත් එකපාරටම අඳුරගන්න බැරි උනා."

සුදාරක දුරතියාම වෙණුරව හඳුනා තිබිණි. දෙදෙනා කතාවට වැටුණේ බොහෝ කලක් හිට දන්නා හඳුනන අය වාගේය. සුදාරක වෙත වන තැන්පත් පෙනුමත් - වෙණුර වෙත වන සැහැල්ලු දඟකාර බවත් අතර පැහැදිලි වෙනස වැඩි අහසක කෙටූ අකුණු පරහක් තරම් වී මගේ හිතට වැටිණි.



# 05

වෙණුර ප්‍රියශාන්ත මගේ ජීවිතයට - හිතට ගැලුවේ දොරගුළු නැති ගෙදරකට රිංගා යන හුලං පොදක් වාගේය. සතියට දවසක් විද්‍යුෂන් පන්තියේදී සිදුවන මේ පෙරලිය තුළ බාලිකා මසින හිරිවැටිවූ තරම පහදා දෙන්නට මා දන්නා අක්ෂර මදිය.

"හරි මහන්සියි මානවී."

හැමදා රෑට ඔහොම කියාගෙන ගෙට ගොඩවෙන, ඒ ඕනාට, මගේ උණුසුමට වඩා නින්දට පෙම්බඳින සුදාරකට වඩා තදින් වෙණුර එකම එක බැල්මකින් පවා මගේ හිතේ හැම අනුමුල්ලම අතගෑවේය.

"ක්ලාස් එකේ සමහරක් උන් උඹට ඊරිසියයි මානවී."

මාදිවෙල සර්ගේ පන්තියේදී හඳුනාගත් මිතුරී - කුමුදු මට කීවාය.

"ඇයි?"

මා ඇසුවේ පුදුමවීය.

"මේකෙ හුගාක් කෙල්ලො වෙණුරට ප්‍රියි. වෙණුර ප්‍රියි උඹට. ඒකයි හේතුව."

ඒ කතාව ඇත්තය. වෙණුර මා පස්සේ ඇවිත් කතා කළාට - වෙණුර පස්සේ ගොස් කතාකරන කෙල්ලන් කොතෙකුත් මා දැක තිබේ. වෙණුර ඉගෙනීමට දක්ෂය. හැඩය. දඟය. එහෙත් දඟ වූවාට මා දන්නා තරමින් නරකයකු නොවේ. එහෙම කොල්ලෙකු ලබාගන්නට ආසා නොකරන ගැහැණු ආත්මයක් වේද?

මහිත හිරිවැටිණ. සුදාරකගේ අහිංසක මුහුණ ඇස් ඉදිරිපිට මැවිණ. මට ජීවිතය දුන් ඔහුට පණ දී ආදරය කිරීම මගේ යුතුකම නොවේද?

"මානවී...."

කල්පනා කරමින් බස් නැවතුමේ උන් මාළඟ වෙණුර නතර විය.

"දූත් ඔය මුද්ද දාපු අත දකින්න ලැබෙන්නෙ ක්ලාස් එකේදි විතරයි. එග්සැම් ළඟ නිසා අපි වෙලේ බෝල ගහන එක නතර කළා."

වෙණුර කීවේය. ඔහු ටවුමේ ප්‍රසිද්ධ පිරිමි පාසලක උසස් පෙළ විභාගයට මුහුණ දෙමින් උන්නේය.

"අඩෝ... වෙණුරයා. උඹ දූත් ඕන වේලාවක ප්ලග්වෙච්ච ගමන්මයි නේද?"

වෙණුර මෙන්ම මාද තිගැස්සී ගිය බව නිබොරුය. වෙණුරගේ මිතුරන් තිදෙනෙක් පාරේ නතරව උන්න.

"අයියට කියපන් උඹ දූත් නංගිගෙ වගකීම බාර ගන්න කැමති කියලා."

"ඒ ලෙවල් වලට කලින් අපිට කේක් කෑහැකි එතකොට."





"මදෑ උඹත් ඉදලා ඉදලා හොයා ගත්තෙම අක්කල නංගිල නැති තැනකින්."

නානාප්‍රකාර දේ කී ඔවුහු විසිර ගියේ මගේ හිත ගිනිවද්දාය.

"උන්ගෙ හිතේ... අපි ලව් කියලා."

දුර යන මිතුරන් දෙස බලා වෙණුර කීවේ හිනාවීය. මහිත ගිනිගෙන තිබුණ බව ඔහු දන්නේ නැත.

"මානවී"

ලොකු කතාවක් කියන්නට වාගේ වෙණුර කටහැදුවේය.

"මානවී ඇත්තටම මේ ටික මෙහෙම අහන්න මං ගොඩක් කල් බලා උන්නා. මානවී... මං.... මං ඇත්තටම ඔයාට ආදරෙයි. ඔයාට කැමතියි. ඔයා කියන්නෙ මොකද?"

වෙණුර මට ළංව කීවේය. මගේ බාලිකා හිත ඔය වචන වලින් ඉරී කීතු වෙන බව වෙණුර නොහිතන්නට ඇත.

"මානවී කතා කරන්න. මට හරි උත්තරයක් දෙන්න ළමයෝ."

"මං... මං..."

මගේ වචන දෙතොලින් පිට නොවන ගානය.

"මං ඒවගේ දේකට කැමති නෑ. කවදාවත් ඕක වෙන්නෑ."

මා කීවේ ඔච්චරය. වෙණුරගේ ඇස් මැලවිණ. දෙතොල වෙව්ලිණ. දෙකොපුල් රතුවිණ. මා ඔහුට කිසිදාක අකමැති වෙතැයි හැඟීමක්වත් ඔහු තුළ නොතිබෙන්නට ඇත.

"ඒත්.... ඇයි...?"

ඔහුට කියා කටගන්නට ඉඩ නොවීය. බස් රථයක් නැවතුමට ආවේය. පාපුවරුවට රොක්වූ ළමුන් අතරින් රිංගා පළවෙනියාට එයට ගොඩ වූයේ මාය. බසය අද්දද්දී පවා වෙණුර අදහාගන්නට බැරිව හුන් තැනම ගල්වී ඉන්නවා මම හොරැහින් දුකියෙමි.

දැන් දවස ගෙවෙනවා මට දැනෙන්නේත් නැතිගාණය. දවස තිස්සේම හිතන්නට හිත හිතා හීන දකින්නට ඕනෑතරම් දේවල් මට තිබිණ. හිතට නිතරම උවමනා කළේ පැත්තකට වී කල්පනා කර කර ඉන්නය. මේ පුරුද්ද හන්දා දෛනිකව මගෙන් ඉටුවිය යුතු සමහර දේද මාතින් මගහැරී තිබිණ.

"මානවී ඇඳුම් හේදුවෙ නැත්ද? හෙට ඔෆිස් අඳින්න හෝදපු කමිස එකක්වත් නෑ."

කිලිටි රෙදි දමන වේවැල් කූඩය පිරී ඉතිරෙද්දී සුදාරක ඇහුවේය.

"මානවී හරියට වැලි පෑගෙනවා..... අද ගේ අතුගෑවේ නැත්ද?"

"මානවී අද නම් කෑම සවුත්තුයි. හරියට ඕනෑවට එපාවට උයලා වගේ."

සුදාරක හරිය. බිරිඳක් විදිහට මා අතින් සියල්ල කෙරුණේ මේ දිනවල ඕනාවට එපාවටය. මා සුදාරකට එක හිතින් පෙම් කරනවානම් - ඒ හන්දාම වෙණුරව සෘජුව ප්‍රතික්ෂේප කළා නම් මට හිත හදාගන්නට බැරි ඇයි? මා මේ විදිහට හිතින් අලස වී ඇත්තේ වෙණුරට කැමැත්තක් මගේ හිත තුළ ඇති හන්දාද? මේ පැණය මගේ හිත මගෙන් ඇසූ හැම වරෙකම මම වෙව්ලා ගියෙමි. පතිනියක වන මට දැන් කොහෙත්ම වෙණුර ගැන හිතන්නට අයිතියක් හෝ යුතුකමක් නැති වග මම මගේ හිතට ඒත්තු ගන්වන්නට සෑහෙන්නට මහන්සි ගතිමි.



මා වෙණුර මගහරින්නට උත්සහ කළ තරමටම වෙණුර මා කොටුකරගන්නට උත්සහ කළේය. සුදාරක ලවා හරියටම වේලාවටම පන්තියට ඇරලවා ගන්නා මා යළිත් ඔහු පන්තිය ළඟටම ආපසු එයින් එළියට එන්නට පටන්ගත් හින්දා වෙනදා සේ මට ළංවෙන්නට වෙණුරට ඉඩක් නොවීය.

මාර්තු මස අග අවුරුද්දේ වැහි කාලය ආරම්භ වූ පසු දවසක වෙණුරට මට ළංවන්නට ඉඩක් ලැබිණ. ඇදහැලුණ ධාරානිපාත වර්ෂාව හන්දා උගන්වනවා තබා හිතන්නවත් ඉඩක් නොවූ හන්දා මාදිවෙල සර් පන්තිය වේලාසනින් නිම කළේය. මට සුදාරකට පණිවිඩයක් දෙන්නට ක්‍රමයක් නොවිණි. කෙටි තාප්පය කොණටම වී මම වැහිකුණාටුවට දෙස බලා උනිමි.

"මානවී"

අගුපිලේ හිරිකඩ අස්සේ වෙණුර මට ළංවී හිටගෙන උන්නේය. මෙතන දෙදෙනෙකුට ඉන්නට ඉඩ මදිය. වෙණුරගේ උස් සුසුම් හඬ පවා වැස්සේ ගෝරණාඩුව අස්සේ ඇසෙන තරමට වෙණුර මට ළංව උන්නේය.

"ප්ලීස් මානවී... ඔය විදිහට මාව රිද්දන්නෙපා."

දැඩි බැගෑබර බවක්... දුකක් ඒ හඬේ කැටිවී තිබුණා විශ්වාසය. මා වෙනකෙනෙකුගේ නොවී තිබුණා නම් මා වෙණුරව පිළිගන්නේත් මේ මොහොතේය.

"මට ඔයාගෙ වෙන්න ඉඩ දෙන්න මානවී... මං ඔයාට කවදාවත් දුකක් දෙන්නෑ."

"ඒක කවදාවත් සිද්ධ වෙන්නෑ වෙණුර. නොකෙරෙන දේවල් ගැන හිතල වද වෙන්නෙපා."

අප දෙදෙනාගේම යහපත ගැන හිතා මම වෙණුර ප්‍රතික්ෂේප කළෙමි.

"ඇයි එහෙම කියන්නේ....?"

"එහෙම කියන්නේ අපිට කවදාවත් ඒ විදිහෙ දෙයක් ගැන හිතන්න බැරි හින්දා."

"ඔයා ඔය කියන්නෙ බොරු මානවී. ඔයා මට කැමතී. ඔයාගෙ ඇස් දිහා බැලුවම මට තේරෙනවා ඔයා මට ගොඩක් ආදරෙයි කියලා. ඒත් මට තේරෙන්නෑ ඔයා ඔය විදිහට තමන්ටම බොරු කරගන්නෙ ඇයි කියලා?"

මම තිගැස්සී ගියෙමි. මගේ දෙනෙතින් ඇත්තටම එහෙම දෙයක් කියැවෙනවාද?

"මානවී..."

වෙණුර තවත් අඩි කීපයක් මට ළං විය.

මම කඳුළු පිරුණු ඇහිපිය ගසමින් ඈත මැත බැලීමි. මීට යාර ගණනකට එහා ගාලාවේත් ළමුන් කීපදෙනෙක් රැඳී සිටියත් වැස්සත් - අඳුරත් නිසා ඔවුනට අපවත්, අපට ඔවුන්වත් පැහැදිලි නොවීය.

"මානවී..."

දැන් වෙණුරගේ හුස්ම මගේ මුහුණට වැටෙන නොවැටෙන ගාණය.

"මානවී.... මං දන්නව ඔයාව කැමති කරගන්න හැටි."

වෙණුර රහසින් කීවේය.





මගේ මුහුන එසවුණේ ඒ ඇසිල්ලේය. ඒ එකම තත්පරයට දෝනට මගේ මුහුණ මැදිකරගත් වෙණුර පිස්සෙකු වාගේ දෙතොලින් මගේ කම්බුල් සිපගෙන සිපගෙන ගියේය.

මට ඇහිපිය ගසන්නට පවා අමතක විය. වෙණුර මා අතහැරි මොහොතේ මට දැනුනේ කිසිදු ප්‍රතිචාරයක් කළ නොහැකි සේ මගේ ඇඟපත ගල්වී ඇතිවාක් මෙන්ය.

එහෙත් ඇසිල්ලකින් මම පියවි තත්වයට ආවෙමි. දුක් - පසුතැවීම - පරාජය හිතට දුන් ආවේගය වෙණුරගේ කම්බුලක් හරහා දැඩි අතුල් පහරක් දෙන්නට තරම් මා සවිමත් කොට තිබිණ.

"චටාස්..."

මල්ග අතුල් පහර වැදී බිත්තියට ඇලවුණු වෙණුර දකුණතින් කම්බුල අල්ලාගෙන හැරී බැලුවේය.

පුදුමය - වේදනාව ඒ ඇස්මත විය.

වේගයෙන් හුස්ම ඉහළ පහළගත් මගේ ඇස්වල මොන විදිහේ හැඟීමක් තිබෙන්නට ඇත්ද? දෙවරක් නොහිතාම මම වැස්සට පැන තෙමි තෙමීම මහපාර තෙක් දිව්වෙමි.

ත්‍රීරෝද රියකින් නිවස තෙක් ආ මම ගෙට ගොඩවුණේ විලාප දී හඬාගෙනමය. මගේ විලාපය අහන්නට මේ ගෙදර කවුරුවත් නැතිවූ එකම හොඳය. පොත් මිටිය ඇඳට විසිකොට නාන කාමරයට වැදුන මම ඒවන විටත් තෙත්ව තිබූ ගවුම පිටින්ම නෑවෙමි.

මම හඬමින් වෙණුර ස්පර්ශ කළ මුහුණ සබන් ගා සේදීමි. සුදාරකගේ කම්බුල් රිදෙනතුරු නැවත නැවතත් සබන් ගා සේදීමි. සුදාරකගේ හැඹුල් පතිනිය වූ මා මේ කර ගත්තේ කුමන පාපයක්ද? වෙණුර

අතින් කිලිටිව ගිය මේ කඹුල් මා යළි සුදාරකට පිළිගන්වන්නේ කොහොමද? වැස්සට දෙවෙනි නොවී මගේ විලාපය පාලු ගෙදර බිත්තිමත දෝංකාර දුන්නේය.

"මානවී.... මං ක්ලාස් එක ළඟටත් ගියා. ක්ලාස් එක අද වේලාසනින් ඇරිය කිව්වම මං බයවුනා. දැන් තමා මගෙ ඇඟට පණ ඩිංගක් ආවෙ. ඔයා කරදරයක් නැතුව ගෙදර ආව එක කොච්චර ලොකු දෙයක්ද?"

හවස මම සුදාරක වෙතින් මූණ හංගාගන්නට දැඩි වෙහෙසක් ගතිමි.

"මානවී... මක්වෙලාද ඔයාට? ඇස් රතුවෙලා - මූණ ඉදිමිලා. ඇයි මේ.... ඒ මදිවට හවස නාලා..."

සුදාරක මා කොටු කරගෙන ඇසුවේය.

"මං මහපාරට ආවෙ තෙමි තෙමි. ඒ ඇවිත් ත්‍රීවිල් එකක ගෙදර ආවෙ. තෙමුණ නිසා නෑවා. දැන් ඔළුව බරයි වගේ."

"පැනඩෝල් දෙකක් බොමු. වැස්සට තෙමිච්ච නිසා හෙම්බිරිස්සාව හැදෙන්න පුළුවන්."

සුදාරක මට පැනඩෝල් දෙකක් පොවා ඇදට යවා මගේ හිස සිද්ධාලේප ගා අතගෑවේය. ඔහුගේ මේ සියලු සත්කාර මා ඉවසා උන්නේ ගිනිගත් හිතෙනි.

"මහත්තයා..."

මං සුදාරකගේ අත අල්ලා ගතිමි.

"ඇයි රත්තරං"





"මං ඔයාට ආදරෙයි මහත්තයා."

"මං ඒක දන්නව පැටියෝ... මාත් ඔයාට ආදරෙයි."

"මං ඔයාට ගොඩක් ආදරෙයි මහත්තයා...."

මම නැවත නැවතත් ඒ ටිකම සුදාරකට කීවෙමි. මට ඕනෑකොට තිබුණේ සුදාරකට මා අදරය කළ බව ඒත්තු ගන්වන්නද? නැත්තං ඒ බව මගේ හිතටම ඒත්තු ගන්වා ගන්නදැයි දන්නේ දෙවියන් විතරය.

kathapothak.blogspot.com

## 06

ඊළඟ සතියේ මම පන්ති වර්ජනය කළෙමි. වෙණුරට මුහුණ දෙන්නට ඇති අකමැත්ත හෝ නොහැකියාව පන්ති නොයන්නට මට බල කළේය.

"මට හෙට පන්ති යන්න කම්මැලියි වගේ අනේ."

මම සුදාරක ළඟ හුරතල් වෙමින් කීවෙමි.

"පන්ති යන්න බැරිනං අපි හෙට ෂොපින් කරමු."

මගේ පුදුමයකට වාගේ සුදාරක මට පන්ති යන්නට බල කළේ නැත.

"ඔයාටත් ළඟකදී අළුත් ඇඳුමක් දෙකක් ගත්තෙ නැතෙ. හෙට අපි ටවුන් ගිහින් දෙන්නටම ඇඳුම් ටිකක් ගම්මු."

සුදාරක මට යෝජනා කළේය.

පසුදා අපි ප්‍රදේශයේ තිබූ සුපිරි පැලැන්තියේ විලාසිතාගාරයකට ගියෙමු. ගැහැණු පිරිමි ඇඳුම් සපත්තු පමණක් නොව සුවඳ විලවුන් පවා එහි තිබිණ.

"ඔච්චර ඕන්නෑ අනේ.... මට සූට් දෙකක් තිබුණම ඇති."



අලුත් විලාසිතාවේ ඇඳුම් කිපයක්ම මා වෙනුවෙන් තෝරාගත් සුදාරක නිර්ලෝභීව මුදල් ගෙවා ඒ සියල්ල වෙන්කොට ගත්තේ මගේ අකමැත්ත නොතකාය.

ඊළඟට අප පිවිසුනේ පිරිමි ඇඳුම් රැඳි කොටසටය. සුදාරකට ඇඳුම් තේරීම මම පවරා ගතිමි.

"අර කැප් එකත් එක්ක තියෙන ටීෂර්ට් වලින් එකක් ගන්න."

ටී ෂර්ට් එකේම පිටුපස කොටසින් හිසට කැප් එකක් ලූවිත ආකාරයට මසා තිබූ ටී ෂර්ට් තොගයක් පෙන්වා මම සුදාරකට කීවෙමි. නවීන විලාසිතාවේ වූ මේ ටී ෂර්ට් වලින් කිල්පාට හා කහපාට දෙකක්ම වෙණුරට තිබිණ. වෙණුර ඒවා ඇඳ පන්තියට ආ හැම්දාකම ඔහුගේ කඩවසම් බවත්, දඟකාර කමත් වැඩියෙන් කැපී පෙනිණ.

"ඒවා මට ගැලපෙන්නෑ මානවී...."

සුදාරක ගත් කටටම කීවේය.

"ඇයි?"

"ඒවා හොඳ අවුරුදු දහඅටේ විස්සෙ කොල්ලන්ට දූන් මේ තිහටත් කිට්ටු කරපු මට ඕවා ගැලපෙන්නෑ...."

සුදාරක හා වෙණුර අතර පැහැදිලි වෙනසක් වූ වග සුදාරකගේ වචන වලින් මට වැටහිණ.

"ඇයි නොගැලපෙන්නේ.... ඇඳල බලන්න... ලස්සනට තියෙයි."

"මානවී මිනිස්සුන්ට විහිළුවක් වෙන්න මං කැමති නෑ."

මසිත කඩා වැටිණ. සුදාරක වෙතින් මා තවත් වෙණුර කෙනෙක් සොයන්නට පටන් ගෙන තිබූ බව මට ඒ මොහොතේත් නොවැටහිණ.

අමතක කළා යැයි හිතුවාට දවස ගානේ සිදුවූයේ මට වෙණුර වැඩි වැඩියෙන් සිහිවීමය. සුදාරක වෙතින් වෙණුරගේ ඇවතුම් පැවතුම් බලාපොරොත්තු වන්නට පටන්ගත් තැන් පටන් මේ වෙනස මට දැඩිව දැනිණ.

තදින් වැසි වැටුණ හැම දවසකම මට වෙණුර සිහිවිය. මහ සුදාරක ළඟ හිටියා නොහිටියා කියා එහි වෙනසක් නොවිණ. මහ රැයක වුවද තද වැස්සක් වැටුණෙත් මගේ නෙත් ඇහැරෙන්නේ ඉබේටමය. යාබදව නිදන සුදාරක දෙස බලා මට හීල්ලෙන්නේ නොදැනුවත්වමය.

සුදාරක වෙනුවට අද වෙණුර මෙතන හිටියානම් ඔහු නිදනවා තබා මට නිදාගන්නට හෝ ඉඩක් දෙන්නේ නැත. සුදාරක ළඟදී මට කම් සැපතේ අඩුවක් නොතිබුණා ඇත්තය. එහෙත් ඔහු සමඟ යහන්ගතවී වත් නොලද ආශ්වාදයක් වෙණුර වෙතින් ලත් බලහත්කාර හාද්දේ වූ වග බොරුවක් කියන්නේ කෙසේද?

"මං දන්නවා ඔයා මට කැමති මානවී.... ඔයාගෙ මූණ දකින හැම පාරම මට තේරෙනවා ඔයා මට ආදරෙයි කියලා."

වෙණුර කී මේ වචනත් - අහම්බෙන් ලද ඔහුගේ ස්පර්ශයත් රහසින් යටි සිත අවුස්සා දමා තිබිණ. යළි වෙණුරගේ මුහුණ දකින දැඩි ආශාවත් පිපාසයක් සේ මගේ හිතේ දලුලා වැඩුණේ ඒ ඔස්සේය.

යළි මා පත්තී ගියේ ඒ ආශාවෙන් පිබිදුන හිහිනි. එහෙත් වෙණුර රොෂානාට ළංවී හිද ඉන්නවාත් - ඔවුන් අතිනත පටලවා ගන්නවාත් දැකී මොහොතේම මහිත කඩා වැටිණ.





"ගිය සතියෙ ඉඳලා දෙන්න එකටමයි ඉන්නේ. රොෂානා කොහොමත් මාස ගණනක් වෙණුරට ට්‍රයි කළානේ. මට හිතෙන්නේ දුන් දෙන්නා ලව්."

කුමුදු මට කීවාය.

නැත. ඔය රඟපෑමකි. වෙණුර ඔහොම රඟපාන්නේ මට රිද්දන්නය. රොෂානාට තුරුළුව හිද ගෙනත් ඔහු හොරැහින් මා හිටි පැත්ත බලනවා දැකි හැම වරෙකම මම හිතට කීවෙමි.

කොහොම වුනත් මහිත තිබුණේ දැකින් ආතුරවිය. වටිනා දෙයක් දෝතේ තිබී ඇඟිලි මතින් ගිලිහී ගියා වාගේ දුකක් - හින්දරක් හිත පුරවා දැමීය.

"වෙණුර ආදරේ මට. එයාට මට ඇරෙන්න වෙන කාටවත් ආදරේ කරන්න බෑ."

මම හිතට ඒත්තු ගන්වන්නට දැඩි උත්සාහයක් ගතිමි. රොෂානා බසයට ඇරලවා ඇදී යන බසයට අත වනමින් උන් වෙණුරට මා ළංවූයේ දෙවරක් නොහිතාමය.

"වෙණුර"

හැරී බැලුවාටත් වඩා සැරෙන් මා ඔහු ළඟ හිටගෙන ඉන්නවා දැක වෙණුර තිගැස්සිණ.

"එක එකීලට තුරුළු වෙලා ඉන්න ලැජ්ජ නැද්ද?"

කටින් පිටවූ වචනවල තේරුම අවබෝධ වන විටත් මා මේ වචන ටික දොන් ගා කටින් පිටකොට හමාරය. මේ සුදාරකගේ උණුහුමට ගුලිවන මමද? මට අදහාගන්නත් අමාරුය.

"සතියකට කලින් ඔයා මෙතනදීම මට ආදරෙයි කිව්වා. ඒත් සතියක් යන්නත් කලින් ඔයා රොෂානට ආදරේ කරනවා. මට ඇත්ත කියන්න? ඔයා බොරු කිව්වේ මටද? නැත්නං රොෂානටද?"

වෙණුර අදහා ගන්නට බැරුව. වාගේ මොහොතක් මා දෙස බලා උන්නේය.

"ඇයි උත්තර දෙන්න අමාරුද?"

"මං ඔයාට බොරු කිව්වේ නෑ මානවී.... මං ඔයාට ඇත්තටම ආදරෙයි. ඒත් මාව එලවගත්තෙ ඔයා. මාව පන්නගත්තෙ ඔයා. මට ආදරේ කරන ගමන් ආදරේ නෑ කියලා හිතට වංචා කරගත්තේ ඔයා."

වෙණුර කියවාගෙන ගියේය.

"එහෙම කරන්න මට හේතු තිබුණා."

මගේ ඇස් බිමට බර විය. නෙතු මත කඳුළු බොඳ විය.

"මටත් දැන ගන්න ඕන අන්න ඒ හේතුවම තමා."

"මට පොරොන්දුවක් වෙන්න. දැන් මං ඔයාට මේ කියන දේ මොනම හේතුවක් හින්දාවත් වෙන කාටවත් කියන්නෙ නෑ කියලා."

මම වෙණුරට අත්ල පෑවෙමි.

"ප්‍රොමිස්"

ඔහු මගේ අත මත අත තැබීය.

මම සියල්ල ඔහුට කියන්නට හිත හදාගතිමි. අඩුම තරමේ ගිනිගත් මගේ හිත - වෙණුර හා සුදාරක අතර දෝලනය වෙමින





තැලී පොඩිවෙන, පව් පුරවාගන්නා මගේ ආත්මයවත් මෙයින් පසු නිවී සැනසෙනු ඇත.

"අයැම් අ මැරිඩ් වුමන්."

මම හැකිතාක් බර අඩුකොට තිත්ත ඇත්ත එළියට දැමීමි.

"මොකක්...."

වෙණුරට නම් එය නෑසුන ගානය.

"මං බැඳපු ගෑණියෙක්."

මම නැවත තේරුම් කළෙමි.

"විහිළු කරන්නෙපා."

වෙණුර මා නොතැකුවේය.

"වෙණුර.... වෙණුර... ප්ලීස් මාව තේරුම් ගන්න. මං මේ විහිළු කරනවා නෙමේ. ඇත්තටම මම කසාද බැඳපු කෙනෙක්."

"මොනා..."

වෙණුර පුදුමයෙන් නළල රැලි ගැස්වීය.

"ඔව්. ඒක ඇත්ත. අර බයිසිකලේ හැමදාම මාව එක්ක යන්න එන්නේ මගේ අයියා නෙමේ. එයා තමා මගේ මහත්තයා."

මම වෙණුරට කියාගෙන ගියෙමි. ඔහු ඇරුණු මුවින්ම බලා උන්නත් එක වචනයක් වත් කටින් පිට කළේ නැත.

සුදාරකගේ බයිසිකලය ඈත එනවා මා දකියේ වෙණුර ඔහොම පුදුමව මා දිහා බලා ඉන්නා අතරේය. හනික මගට දිව ගිය මම බයිසිකලයට ගොඩවීමි. සුදාරක එය හරවා ගන්නා අතරේත් වෙණුර උන්තැනම ගල්වී ඉන්නවා මම හොඳින්ම දකියෙමි.

සියල්ල එතෙකින් අවසන් වෙතැයි මම හිතුවෙමි. වෙණුර ගැන හිතේ ඇතිවූ පිබිදීම අකුලා හිතේ මුල්ලකට විසිකොට ගෙවුණ ඊළඟ සතිය පුරාම මම සුදාරකගේ හුරතල් බිරියම වීමි. වෙනදාටත් වඩා ආදරයක් ලෙංගතු කමක් මා වෙතින් සුදාරකට විදා දැක්වුණාට කිසිදු සැකයක් නැත. එහෙත් ඒ උද්යෝගය හිස් බැලුමක් පමණක් වග මට අවබෝධය වූයේ යළිත් පන්තියේදී වෙණුරගේ මුහුණු මුණ ගැසුණ විටදීය. වෙණුර කෙරේ හිත තුළ වූ අකුලාගත් හැඟීම පිබිදි අවුත් සුදාරක කෙරේ හිත තුල වූ පුම්බාගත් සෙනෙහස හුලං ගිය බැලුමක් වාගේ අකුලා දැම්මේ එක තත්පරයක් තුළදීය.

"මානවී...."

මා හා කතා කරන්නට ලොකු ඕනෑකමක් වෙණුරගේ පියකරු ඇස් මත තිබිණි.

"මට මේ කිසි දෙයක් තේරුම් ගන්න බෑ මානවී."

අසරණ ලෙස වෙණුර කීවේය.

"මං ඔයාට හැම්දේම කියන්නං. එතකොට ඔයා තේරුම් ගනියි." මා කීවේ ඔහු ගැන උපන් හැබෑම අනුකම්පාවෙනි.

අම්මා තාත්තා අහිමි මා පුංචම්මා ළඟ ගත කළ කටුක ජීවිතයත් - සුදාරක මට හමුවූ හැටිත් - ඔහු මා රහසේ පැනවිත් විවාහ වූ හැටිත් මම වෙණුරට අකුරක් නෑර කීවෙමි.

"මානවී..."

සංසුන්ව සියල්ල අසා හිඳ වෙණුර කට හඬ අවදි කළේය.

"සුදාරකට කලියෙන් මට ඔයාව ලැබුනානං"





මේ මා හීනෙනත්වත් අහන්නට බලා උන් දෙයක් නොවේ.

"අපි මුණ ගැහෙන්න කලින් ඔයා සුදාරකට ලැබිච්ච එක ඉරණමේ සිද්ධ වෙච්ච ලොකු වරදක් මානවී...."

"විකාර කියවන්නෙපා."

"විකාර නෙමේ මං කියන්නෙ ඇත්ත. මොකද සුදාරකව බැඳලා උන්නා කියලා ඔයාට පුළුවන් උනාද මං ගැන ඔයාගෙ හිතේ ආදරයක් ඇතිවෙන එක වලක්ව ගන්න. බෑ නේද? අන්න ඒ වගේ තමා... ඔයා සුදාරකට අයිතිය කියලා දැනගත්තට පස්සෙත් මට උනත් බෑ ඔයා ගැන මගෙ හිතේ ඇතිවුණ ආදරේ මරාගන්න."

"මාව අමතක කරන්න."

මම වෙණුරට පැහැදිලිවම කීවෙමි.

මාත් සුදාරකත් ගැන සියල්ල දැනගත් පසු මා හිතා උන්නේ වෙණුර මා අමතකරාවී - හිත හදාගනීවි කියාය. එහෙත් සිදුවූයේ වෙණුර පිස්සෙකු වාගේ මා පස්සේ පන්නා ඒමට පටන් ගැනීමය.

"මානවී මට ඔයත් එක්ක කතා කරන්නෝන."

ඊළඟ සති දෙකතුනම මා ගත කළේ වෙණුර මගහැරය. එහෙත් මා නොතැකූ තරමටම ඔහු මා සොයා ආවේය.

"මට ඔයත් එක්ක කතා කරන්න දෙයක් නෑ."

ඔහුගේ ඇස් මගහැර මහපාර දෙසම බලා මම කීවෙමි.

"ඔයාගෙ ඇස් දිහා බැලුවනම් ඔය කතාව ඇත්ත කියලා හිතෙන්නෙ නෑ. ඔයා මා එක්ක කතා කරන්න හිතින් මැරී මැරී බලා ඉන්නවා කියලා තමා ඔය ඇස් මට කියන්නේ."

"මං බැඳපු ගෑණියෙක්."

මම බිඳුණු හඬින් කිවෙමි.

"කසාද සහතිකේට අවංක වෙන්න ගිහිල්ලා තමන්ටම ඔච්චර දුක් දීගන්න එපා. හිතට අවංක වෙන්න බලන්න."

වෙණුරගේ ඒ වචනත් එක්කම හිතේ ඔහු තමන් වටකොටු බැඳ රොක් කර සිරකර රැකි ආදරයම ඉවුරු බිඳ නෙතට ගැලුවේය.

"ඔයා මොනාද දෙයියනේ මට කරන්න කියන්නේ."

මම කඳුළු පිරුණු දෑසින් ඇසීමි.

"ප්ලීස් මානවී මෙතන අඬන්නෙපා. මං දන්නවා මේ ප්‍රශ්නෙ නිසා ඔයා ගොඩක් දුක් විඳිනවා. අපි කතා කරමු. එතකොට ඔයාට සහනයක් දැනෙයි. කතා නොකර මග ඇරලා කිසි ප්‍රශ්නයක් විසඳන්න බැහැ."

මා එදා ගෙදර ආවේ ඊළඟ සතියේ පන්තිය මගහැර වෙණුර හා කොහේ හෝ නිදහස් තැනකට ගොස් මේ ගැන කතා කරන්නට පොරොන්දු විය.



## 07

සුදාරකගේ පතිනිය ලෙස ඔහුගේ කුලගෙයට ඇතුල් වූ දැන් පටන් මගේ හිතට දැනුණේ දැඩි වරදකාරී හැඟීමකි. මට ඕනෑ කළේ සුදාරකට උතුම් පතිණියක වන්නය. ඒ වෙනුවෙන් හදිසියේ හිතට ගොඩවූ ආදරයක් පමණක් නොව ඊට වැඩි යමක් උවත් කැපකල යුතු නොවේද? වෙණුර හමුනොවන්නට මම තීරණය කළේ දුරට දිගට හිතාය. ඔහු මගහරින්නටම බැරි උනොතින් පන්තියෑම පවා අතහැර දමන්නට මම හිතාගතිමි. මගේත් - සුදාරකගේත් කුලගෙය රැකගන්නට මම දැඩිව හිතට ගතිමි.

"ට්‍රිං..... ට්‍රිං....."

ඔය සතියේ සුදාරක මිලට ගත් ජංගම දුරකතනයට රැයේ පවා ඇමතුම් ආවේය. මම කල්පනා ලොවින් මිදී එය අතට ගතිමි.

එය නොනවත්වාම නාදවෙයි. සුදාරක උන්නේ නාන කාමරයේය.

"හෙලෝ..."

මම ඇමතුමට පිළිතුරු දුනිමි.

"හෙලෝ..."

මගේ පුදුමයකට වගේ එහා පසින් ඇසුනේත් ගැහැණු කටහඬකි.

"සුදාරක නැත්ද?"

හුරුපුරුදු කෙනෙකු වාගේ ඇය ඇසුවාය.

"එයා බාත්රූම් එකේ."

"ආ.... එයාට කියනවද ආවගමන් මට කෝල් එකක් දෙන්න කියලා..."

ලොකු අයිතියක් සුදාරක කෙරේ ඇති කෙනෙකු වාගේ ඈ කීවාය.

"කව්රු කතා කළා කියලද කියන්නේ?"

"සින්තියා කෝල් කරා කියන්නකො."

මම ඇතුළතින් දූවී ගියෙමි. සුදාරක කවදාවත් එහෙම කෙනෙකු ගැන මට කියා නැත. සුදාරකට නමින් කතා කොට රැයේ පවා ඔහු අමතන මේ සින්තියා කව්ද?

"මානවී..."

දුරකතනය අතේ තබාගෙන කල්පනාවට වැටී උන් මා ළඟ සුදාරක හිස තුවායෙන් පිසදමමින් හිට උන්නේය.

"සින්තියා කියල කෙනෙක් කෝල් කරා..."

මා කීවේ ඔහු දක්වන ප්‍රතිචාරය දැඩිව අල්ලා ගන්නා තරම් විමසිලිමත්වය.

"සින්තියා කතා කළාද?"





මා බලාපොරොත්තු වූ තරම් තදින් ඔහු තිගැස්සුනාදැයි සැක සහිතය. එහෙත් ඔහු බෙහෙවින් කලබලවිය. මගේ අතින් දුරකතනය අතටගත් සුදාරක එහි අංක කීපයක් එබුවේය.

"හෙලෝ සින්තියා.... මං මේ කතා කරනකල් බල බලා උන්නේ."

හිනා කටක් පුරෝගෙන සුදාරක සින්තියා හා කතාවට වැටිණ.

"ඔව්... ඔව්.... ඔයා ඔක්කොම උවමනා දේවල් රෙඩි කරගෙන එන්න. මාත් මෙහෙන් හෙට ටිකක් වේලාසනින් එන්නං."

සුදාරකගේ කතාබහින් මට වැටහුනේ ඔහු සින්තියා සමග දුර ගමනක් යන්නට සැලසුමක් හැදූ බවය. මා ගෙදර තනිකොට දමා සුදාරක පිටගැණුන් හා රවුම් ගසනවාද? දැඩි ගින්දරක් හිතේ ඇවිලිණි.

"කව්ද ඒ ?"

මම කෙලින්ම සුදාරකගෙන් ඇසීමි.

"ආ... ඒ අපේ ඔෆිස් එකේ ලේඩි කෙනෙක්."

"ඔෆිස් එකේ ඔහොම නම තියෙන කෙනෙක් ඉන්නව කියල කලින් ඔයා මට කියලා නැනෙ."

මම සිදුරක් අල්ලාගන්නට උත්සහ කරමින් සුදාරක වෙතින් ප්‍රශ්න කළෙමි.

"ළමයෝ... ළමයෝ.... සින්තියා ඇවිත් තාම දවස් දෙකයි."

සුදාරක කීවේ හිනාවී මගේ ගෙල වටා අතක් දමාය.

"දවස් දෙකට මෙච්චර ළංවෙලාද?"

මගේ හිත එහෙම ඇහුවත් ඒ ටික මම කටින් පිට නොකළෙමි.

"එයා තමා බොස්ගෙ අලුත්ම ඇසිස්ටන්. ඒ විතරක් නෙමෙ මගෙ වැඩ වලටත් දූන් උදව් කරන්නෙ එයා."

"ඕගොල්ලො ඔෆිස් එකෙන් පිටත් යනවද?"

"රාජකාරියේදී ඔෆිස් එකේ ඇතුළ පිට කියලා බේදයක් නෑ මානවී.... හෙට නුවර බ්‍රාන්ච් එකේ වැඩකට අපි දෙන්නටම නුවර යන්නවෙලා."

මගේ හිත බිඳිණ. උතුම් පතිනියක වන්නට මා පිරිමි ඇසුරින් වෙන්ව හිඳින්නට උත්සහ කළත් සුදාරක ළංව ස්ත්‍රීන් ඇසුරු කයි. ඔවුන් හා ගමන් බිමන් යයි. මා වෙණුර හා ඇසුරු කිරීම හෝ ගමන් බිමන් යාම ඉතින් වරදක් වන්නේ කෙසේද?

ක්ෂණිකවම වෙණුර හා ඇවිදින්නට එනවායි වූ පොරොන්දුව ඉටු කරන්නට මම තීරණය කළෙමි. මේ අවධිය වන විට මගේ හිත තිබුණේ දෙකඩවය. එහි සුදාරකගේ පතිනිය ලෙස පෙනී සිටි කොටස සිත්තියාගේ පැමිණීමෙන් ගිනිවැදුනත් වෙණුරට පක්ෂ වූ කොටස සිත්තියාගේ පැමිණීමෙන් ලැබුයේ දැඩි අස්වැසිල්ලක් හා සැහැල්ලුවකි. සුදාරක සිත්තියා ඇසුරු කරතැයි යන සිතුවිල්ල මට වෙණුර ඇසුරු කරන්නට ලබාදුන් ඉඩ හසරක් ලෙස තීන්දු වූයේ මගේ හිත ඒ හැඟීම වලකන්නට කිසිදු උත්සාහයක් නොගෙන අලසව හිඳියදීමය.

මගේ සිත තුළ සුදාරක කෙරේ සහජයෙන්ම තිබූ භය පක්ෂපාතී බව වෙණුර කෙරේ නොවීය. ඒ හන්දාම වෙණුර කෙරෙක්





ඇතිවූ නිදහස් ක්‍රියාශීලීත්වය වඩා වැඩි සැහැල්ලුවක් මා කෙරේ ඇති කළේය.

"මානවී..."

මාත් වෙණුරත් උන්නේ පන්තිය මගහැර විත් එක් ප්‍රසිද්ධ උද්‍යානයක මල් පිරුණු ලොකු මැයි ගහක් පාමුලය.

"මානවී මං මේ දේවල් ඔයාට කියන්නෙ වැරදි අදහසකින් නෙමෙ. මුලින්ම ඔයා තේරුම් ගන්න ඕනෙ අන්න ඒක."

වෙණුර - අර මාදිවෙල සර්ගෙ පන්තියේ දක්ෂතම සිසුවා - කෙල්ලන් වශීකල දඟකාරයා තට්ට තනියම මගේ අත අල්ලාගෙන මා ළඟින් හිඳඋන්වග විටෙක මට අදහාගන්නත් අමාරුය.

"බැඳපු ගෑණුන්ට නරක අදහසින් ළංවෙන කොල්ලොත් ඇති. ඒත් මට ඔයාගෙන් එහෙම තාවකාලික සැපතක් ඕනෙ නෑ මානවී. මං ළඟ ඒ වගේ බලාපොරොත්තුවක් තිබ්බනම් මං ඔයාව අද අරන් එන්නෙ මේ වගේ සෙනඟ ගැවසෙන තැනකට නෙමේ. හෝටල් කාමරේකට... මට ඕනෙ මුළු ජීවිත කාලෙටම ඔයාව අයිතිකරගන්න."

වෙණුර මගේ අත දෝතින් මිරිකා ගත්තේය.

"මං බැඳපු ගෑණියෙක් කියල අමතක කරන්නෙපා."

"ඔයා බැඳපු ගෑණියෙක් කියල මට කවදාවත් හිතන්න බැරිවෙයි මානවී. මට හැමදාමත් ඔයාව පේන්නෙ මම ආදරේ කරපු පුංචි කෙල්ල හැටියටයි. ඔයා සුදාරකව කසාද බැන්දා කියන එක මට ප්‍රශ්නයක් නෙමේ. ඔයා මට වචනයක් දුන්නොත් මං ඔයාව බාර ගන්නවා. සත්තයි කෙල්ලේ..."

මගේ හිත තැවිණ. වෙණුර ඇත්තටම මට පෙම් කරනවා වෙන්නට පුළුවන්. එහෙත් සුදාරක? මගේ ජීවිතයට පිළිසරණ වූ ඔහුව කොහොම අමතක කරන්නද?

"සුදාරක මට පිහිට උනා. පුංචි අම්ම ළඟ අපා දුක් වින්ද මට මේ නිදහස - සතුට දුන්නෙ සුදාරක."

මම වෙණුරට පැහැදිලි කළෙමි.

"මානවී තේරුම් ගන්න. ඒක ඒ අවස්ථාවෙ තමන්ගෙ කෙල්ලට අවංකවම ආදරය කරන ඕන කොල්ලෙක් කරන දෙයක්. සුදාරක නෙමේ මම එදා එතන හිටිය නම් අනිවාර්යයෙන්ම මං කරන්නෙත් ඒ ටිකමයි."

"ඒත් සුදාරක මං හින්දා එයාට තිබ්බච හැමදේම නැතිකර ගත්තා. අම්මා - තාත්තා - දේපල - නෑදෑයො පවා එයාට නැති උනේ මං හින්දා."

"ඔයා වගේ කෙල්ලෙක් ලබන්න ඔයිට වඩා වැඩි දෙයක් උනත් නැතිකරගන්න කැමති කොල්ලො තාමත් ඕනතරම් ඇති මානවී. ඒ දේවල් නැති කරගත්තා කියලා අද සුදාරකට පාඩුවක් වෙලා නෑ. ඔයා වගේ ලස්සන - අහිංසක - හුරතල් - චූටි කෙල්ලක් ජීවිත කාලෙම ළඟ තියාගන්න ලැබිච්ච එකම මොනතරම් වාසනාවක්ද? ඔයා නොදන්නවට ඔයාගෙ වටිනාකම සුදාරක හොඳට දන්නවා මානවී. ඔයා මඩේ තිබ්බච මැණිකක්. සුදාරක ඒ මැණික ඔපදාලා එළියට ගත්තා. ඒක ඔය තරමටම ඔයා වෙනුවෙන් කරපු පරිත්‍යාගයක් කියලා හිතන්නෙපා. ඒක සුදාරක එයා වෙනුවෙන් කරපු සාර්ථක ආයෝජනයක් වගේ."

වෙණුර මේ කතා කරන්නේ සුදාරක කෙරේ උපන් ඉරිසියාවෙන් - වෛරයෙන් පමණක්ම කියා මට ඔහු කිව් කිසිම





දෙයක් අහකට දමන්නට පුළුවන් වූයේ නැත. ඒ හැම අකුරක්ම හිතට වැටී අළුත් බීජ ලෙස රෝපණය විය. රෝපිත අළුත් අදහස් මට වෙණුර ආශ්‍රය කරන්නට සාධාරණකරණීය හේතු දක්වාලිය. එපමණක් නොව සුදාරකගේ සෙනෙහසට පව් කරන්නට හිත තුළ වූ බිය මා වෙතින් දුරස් කරන සුළු විය.

"දැන් ඔයා මොකද මට කරන්න කියන්නෙ?"

මම වෙණුර වෙතින් විචාලේ මේ අලුත් සිතුවිලි වලින් ලත් පන්නරය ඔස්සේය.

"ඔයාට මං ඉන්නවා කියලා හිතේ තියාගන්න."

වෙණුර කීවා වගේ මා වෙනුවෙන් ඔහු කැපවී ඉන්නා බව හිතට දැනෙන හැම මොහොතකම මගේ හිතට දැනුනේ ශක්තියකි. රහස් වින්දනයකි. පෙරදී සුදාරක නමට කැපවූ තරමටම ඉන්පසු වෙණුර නමට වෙන්ව හිඳින්නට මගේ හිත කැපවූයේ නිරායාසයෙනි.

ඉන්පසුව මම බෙහෙවින් මගේ ඇඳුම් පැළඳුම් ගැන සැලකිලිමත් වීමි. හිස පීරන්නට - මුහුණේ වත්සුණු තවරන්නට පමණක් නොව කණ්ණාඩිය ඉදිරිපිට හිඳ හැඩ බල්නනට පවා මට බොහෝ කාලයක් ගතවිය. වෙණුරට වඩාත් ලස්සනට පෙනෙන අයුරින් හැඩවීමට මා ගත් උත්සාහය වැඩිය.

"ඔයා දැන් ඉස්සරට වඩා ලස්සනයි මානවී.... මට වෙලාවකට හරි බයකුත් හිතෙනවා... කවුරු හරි කොල්ලෙක් ඔයාව දාගනියි කියලා"

පන්ති යන්නට හැඩවැඩවී මා බයිසිකලයට ගොඩවෙද්දී සුදාරක කියන්නේ බයකින්ම නොවේ. මා වාගේ පියකරු බිරියක අයිතිවීමේ ආඩම්බරයත් - ආසාවත් ඒ ඇස්මත වූ වග ඇත්තය.

"විකාරද අනේ..."

යටි හිතින් ගැහෙමින් කියා මා සුදාරකව නොතකාහරින්නේ ඔහොමය.

සුදාරක පමණක් නොවේ වෙණුරත් මා ළඟින් ගැවසුණේ යටපත් කොට නොගත් ආඩම්බරයකින් හා ආසාවකින් බව මට විශ්වාසය. වෙණුර මට ඔහුගේ ළඟම ඉඩක් හැමදාමත් වෙන්කොටගෙන උන්නේය. ශාලාව තුළදී පමණක් නොව පන්තිය අතරමැද කෙටි විවේකයේදී පවා කැන්ටිමට ගොස් අපි යමක් කෑවෙ බිව්වේත් එකටමය.

"ලැජ්ජ නැද්ද අනේ අනුන්ගෙ කොල්ලො දලේ දාගන්න."

එකම පෝවෙලෝ බෝතලයට ස්ටෝ දෙකක් දමාගෙන උරාබොමින් උන් මමත් වෙණුරත් හැරී බැලුවේ තිගැස්සීය. කැන්ටිමේ අපට යාබද මේසයේ රොෂානාත් - ඇගේ මිතුරියනුත් හිද උන්හ. සුරේඛා - රොෂානාගේ යාවජීව මිතුරිය ශබ්දනගා ඒ කීවේ මට ඇහෙන්නය.

"ලැජ්ජ තියෙයි නං එහෙම කරයිද අනේ"

"අපට ඉතින් බයක් නැතුව ඔහොම ඇගේ ඇතිල්ලි ඇතිල්ලි ඉන්න බැනෙ අනේ. ලැජ්ජාවයි - බයයි දෙකම නැති අයනම් කොල්ලෙක් දාගන්න ඕන දෙයක් කරයි."

මේ ඇනුම්පද සියල්ල මටය. මගේ හිතට දැනුණේ දුකක්වත් තරහාවක් වත් නොවේ. සියල්ල ජයගත්තා වාගේ ආඩම්බරයකි. ඒ ආඩම්බරය මුවට ගෙනා මිද හසරැල්ල නොසගවාම මම වෙණුර දෙස බැලීමි.

"ඔයාගෙ හිත රිදුනද මාහවී"

වෙණුර ඇසුවේය.





"නෑ අනේ... එයාගෙ හිත රිදිල හින්දනෙ ඔහොම කියනව ඇත්තෙ. මං බය නෑ ඕවට"

වෙණුර බීල ගෙවා නැගිට ගත් මොහොතේ මම ඔහුගේ දකුණතේ එල්ලීමි. අප රොෂානලා හිද උන් මේසය පහුකරද්දීත් ඒ අත ඒ විදිහටම බදා ඉන්නට මම අමතක නොකළෙමි.

"රොෂානලා මුකුත් පාටි එකක් දම්මද?"

පන්තිය අතරවාරේ වෙණුර මදක් ඈත් මෑත් වෙනතුරු හිද කුමුදු ඇසුවාය.

"නෑ... ඇයි ?"

"මං අහගෙන උඹට හොදවයින් දෙකක් කියන්න ඕන කියලා එයාලා කතා වෙනවා."

වට පිට බලා කුමුදු කීවේ රහසිනි.

"එයා ඊරිසියාවෙ පැලෙන්න යනවා."

මා කීවේ හිනාවීගෙනමය.

"තිකන් ප්‍රශ්න ඇතිකරගන්න එපා මාහවී. ඔයාට වෙණුර ගැලපෙනවා කියලා හිතෙනවානං වෙණුරට කියන්න කලින්ම අයියත් එක්ක මේ ගැන කතා කරන්න කියලා. එතකොට ඔය කවුරුවත් දගලන්නෑනෙ."

අනික් හැමකෙනෙකුම වාගේ කුමුදුත් හිතා උන්නේ සුදාරක මගේ අයියා කියාය.

"අපි හරියටම ගැලපෙනවද කියලා කොහොමද තවම හරියට කියන්නෙ කුමුදු ?"

මම ඇගේ ප්‍රශ්නය මග අරින අදහසින් කීවෙමි.

"මොකද උඹලා නොගැලපෙන්නෙ. ගතිගුණ, රූපෙ, වයස මේ හැමදේම හොඳට ගැලපෙනවා. උඹලා දෙන්නා එකට ඉන්නවා දකිනකොට කාට උනත් හිතෙනවා ඇති හොඳට ගැලපෙන ජෝඩුව කියලා"

මගේ හිතට එක් අතකින් සොම්නසකුත් - අනික් අතින් දැඩි සන්තාපයකුත් දැනිණ. සොම්නස දැනුණේ වෙණුර වාගේ කෙනෙකු මට දැඩිව ආදරය කිරීම ගැනය. සංතාපය හිතට ආවේ මේ එනවිටත් මා සුදාරකට අයිතිව හිඳීම ගැනය. වෙණුර වාගේ කෙනෙකුගේ අතේ එල්ලී යායුතු මා වාගේ කෙල්ලක සුදාරක වන් මැදිවියේ පිරිමියෙකු අතේ එල්ලී යනවා දකින ලෝකයාට මොනවා හිතෙනවා ඇත්ද?



## 08

"මානවී..

වෙණුර ලොකු කතාවක් කියන්නට කට හැදුවේය. අප උන්නේ වෙරලාසන්නයේ ගල්පරයක් මත හිඳගෙනය. මසකට වතාවක් දෙකක් පන්තිය මග හැර කොහේ හෝ ඇවිද යන්නට අප පුරුදු වූයේ නිකම්මය. කොහේ ගියත් පන්තිය ඇරෙන වේලාවට - හරියටම කිව්වොත් සුදාරක මා එක්කාගෙන යන්නට එන වේලාවට වෙණුර මා බස් නැවතුමට ඇරලුවේය.

"මානවී.... මට ඊට හරියට තින්ද යන්නෑ."

වෙණුර කීවේ ලොකු දුකකිනි.

"ඇයි ඒ...?"

ඔහු දිගු හුස්මක් පිට කළේය. මහිත දැවිණ. ලොකු වේදනාවක් ඒ හිත ඇතුලේ වද දෙනවා නොවේද?

"අනේ වෙණුර කියන්නකෝ? ඇයි ඒ ?"

"ඔයා වෙන පිරිමියෙකුට තුරුළු වෙලා නිදියනවා කියලා දැනෙන කොට මං කොහොමද මානවී සැනසීමෙන් නිදාගන්නෙ.

තමන් ආදරේ කරන කෙල්ල වෙන පිරිමියෙක් එක්ක ඇඳක නිදා ගනිද්දී කොයි කොල්ලටද රෑට සැනසීමෙන් නින්ද යන්නේ?"

මගේ හිත ගිනි ගත්තේය. වෙණුර මේ හෙලි කරන්නේ මා මෙතෙක් හිතෙකින්වත් හිතූ පැත්තක් නොවිය.

"ඔයාට පුළුවන්ද මං වෙන ගෑණියෙක් එක්ක තුරුල් වෙලා ඉන්න බව දන දන සැනසීමෙන් නිදාගන්න?"

"මම විදවලම මැරෙයි."

මට කියැවිණ.

"මටත් ලගදිම වෙන්නෙ ඒටික තමා මානවී."

වෙණුරත් මාත් අහිංසක සිපවැළඳ ගැන්මකට එහා නොගිය බව ඇත්තය. එහෙත් ඔහු මට පෙම කරන හින්දා මා ගැන එහෙම හිතන්නට ඔහුට අයිතියක් තිබේ.

"මං ඔයාට පොරොන්දු වෙන්නං වෙණුර.... මීට පස්සෙ ඔයාගෙ හිතට වේදනාවක් දෙන දෙයක් මාත් සුදාරකත් අතර සිද්ධ වෙන්නෙ නෑ කියලා."

"සුදාරක ඔයාගෙ හස්බන්ඩ්.... ඉතින් ඔයා කොහොමද...?"

"සුදාරක ඔයා වගේ පිස්සෙක් නෙමේ හලෝ.... එයා හරි නිව්ච්ච කෙනෙක්."

මම වෙණුරට කතා කරන්නට ඉඩ නොතියාම කීවෙමි.

වෙණුරට පොරොන්දු වූ ලෙසම සුදාරක වෙතින් හැකිතාක් ඈත්ව හිඳින්නට මම වෙර ගතිමි.

"මානවී..."





සුදාරකගේ අතක් මහ රෑයේ පවා මගේ බඳ වටා වැටිණ.

"මානවී... සුදූ..."

උණුසුම්ව මගෙ දෙකන්පෙති අද්දරට වැටෙන සුදාරකගේ කටහඩින් කියැවෙන්නේ කුමක් දැයි අඳුනාගන්නට බැරි තරම් මම ඒ වන විට ළාබාල පතිනියක නොවීමි.

"මට නිදිමතයි."

නිදිමතක් අහලකවත් නොවූ මම කීවෙමි. මා හිතුවා වාගේ සුදාරක බලකරන්නට ආවේ නැත. එහෙත් දැඩිව මා වැළඳ ගෙන නිදන්නට සැරසුන ඔහු නොකියා කීවේ මා නැතුව බැරි බව නොවේද?

"දාඩියයි අනේ..."

මම සෙමෙන් ඔහුගේ දෑත් මෑත් කර පසෙකට වීමි. මා දන්නා හැටියට හැම මනුෂ්‍යයෙකුම උත්සහ ගන්නේ නිවැරදිව ජීවත්වන්නය. වැරදි මිනිසෙකු වන්නට කිසිවෙකුටත් උවමනාවක් නැත. එහෙත් ඔවුහු නිවැරදිව ජීවත් වන්නට හදන්නේ තමන්ගේ දැනුම - බුද්ධිය හා රුචිකත්වය අනුවය. කෙනෙක් හරි පාරේ යන්නත් තව කෙනෙක් වැරදි පාරේ යන්නත් හේතුව ඒකමය. වැරදි කරන උන් පවා තමන් හරි යැයි හිතන්නේ ඒ හින්දාය. මටත් සිදුවූයේ ඒ දේමය. වෙණුරට අවංක වෙන්නට ගොස් මා අතින් සුදාරකට පවක් වෙන වග මගේ හිතට අවබෝධ වූයේ නැත. ඒ වනවිටත් මා කල සෑම සියලු දේ මගේ පැත්තෙන් ඉතාමත් අවංකවූත් නිවැරදි වූත් කාරණාම විය.

මුලින් මුලින් මා ඔහු හා සංවාසය නොතකා හරින බව නොතේරුනත් තවත් මසක් පමණ ගතවද්දී සුදාරක ඇත්ත තේරුම්

ගත්තේය. එහෙත් ඔහුට අවබෝධ නොවූයේ මා ඒ තරම් වෙනස් වන්නට හේතු වූ කාරණාවය. ඒ අතින් සුදාරක මටත් වඩා නොමේරූ එක්කු විය.

"මානවී...."

රැයට ඇදව වැටෙන සුදාරක කතා කරන්නේ අඬන්නා වාගේය.

"ඇයි මට මෙහෙම කරන්නේ?"

මගේ හිත කඩා වැටිණ. මොනවා උනත් මේ මට ආදරය කළ - තවමත් මට කිසිත් වරදක් නොකල පිරිමියාය...

"මං වෙනස් වෙලා නෑ... වෙනස් වෙලා ඉන්නෙ ඔයා.."

මට ඕනේ ඔහු තරහගස්සන්නය. ඔහු මට බැනවදිනවානම් දොස් කියනවානම් මට මගේ හිත හදාගන්නට පුළුවන.

"මොනාද මගේ වෙනස් වෙලා තියෙන්නේ?"

සුදාරක අහන්නේ පුදුමයෙනි.

"හැන්ඩ් ෆෝන් ළඟ තියාගෙන රට වටේ ඉන්න ගෑණුන්ට කතා කරන්නෙ මං නමෙ ඔයා..."

මම සුදාරකගේ මුහුණට කියමි.

"ම්... මොනා...?"

සුදාරක අහන්නේ අදහාගන්නත් බැරුවය.

"දවාලටත් මොනා කරලා එනවද කවිද දන්නේ? රෑ තිස්සෙත් ගෑණු ෆෝන් එකට කෝල් කරන්නේ?"





මම උස් හඬින් දොස් කියන්නේ ආවේග වී වාගේය.

"ඔයා ඔය වැරදියට හිතාගෙන ඉන්නෙ සින්තියා කෝල් කරන එකට නේද? අපි අතර එහෙම දෙයක් නෑ මානවී... මා ගැන ඔහොම හිතන්නෙපා පව්."

මගේ කටහඬ උස් වූ තරමටම ඔහු පහත් හඬින් කතා කළේය. අනේ මෙහෙම නොවී ඔහු මට බනිනවානම් - අඩුම තරමේ එක පහරක් වත් ගසනවානම් මට හිත හදාගන්නට පුළුවන. එහෙත් මගේ පපුවට ඉහිලුම් නොදෙන්නේ ඔහු හුල්ලමින් අතින් පැන්ක හැරී තිදා ගැනීමය.

"මං දවසගානෙම බලා ඉන්නෙ ඔයා මං ළඟට එනකම් මානවී...."

ඒ වනවිටත් උසස් පෙළ ලියා තාවකාලිකව ඇඟලුම් කම්හලක තත්වපාලක රැකියාවක් කළ වෙණුර මට හමුවූ හැමදාම කීවේය.

"මගෙ පඩිය ඇති අපි දෙන්නටම ජීවත් වෙන්න. තවත් ඉගෙනගන්න මගෙ බලාපොරොත්තුවක් නෑ. අපිට පුළුවන් ඔය කොහෙන් හරි කුලියට ගෙයක් හොයාගන්න."

වෙණුර රැකියාව ලැබුනදා පටන් අනාගත සැලසුම් හැදුවේය. ඔහුට තිබූ එකම නොඉවසිල්ල මා තවමත් සදහටම සුදාරක හැරපියා ඔහු වෙතට නොයාමය.

හීනෙන්වත් තමන්ට වරදක් නොකළ පිරිමියෙකුව අතහැර දමා යාම ඔහුට පතිනිය වූ ගැහැණියකට ලේසි පහසු කරුණක් නොවන බව මේ වන විටත් මට තේරී තිබුණද වෙණුරට එය අවබෝධ වූයේ නැත.

දවසගාතේ බොරු හේතු හදාගෙන සුදාරකට බැන අඬගහන - රණ්ඩු දබර කරන මගේ අරමුණ ඔහු අවුස්සා ගැනීමය. අඩුමගානේ ඔහු මට එකපහරක් වත් ගසනවානම් එයම හේතු කොට මම මේ කුලගෙය හැරයන්නට පුළුවන. එහෙත් මගේ වෙනස්වන ඇවතුම් පැවතුම් සියල්ලම සුදාරක නිහඬවම විඳදරා ගත්තේය. එහෙත් ඔහු දෙස බලන කවරකුට උවද ඔහු උන්නේ හිතින් මැරී මැරී වග අවබෝධ කරගන්නට අපහසු වූයේ නැත.

සුදාරකට රැවුල කපන්නට - හිස පීරන්නට අමතක විය. පිරිසිදුව පිළිවෙලට ඇඳුම් හැඳ පිටව ගිය ඔහු සමහරදාට කමිසය පවා මැද්දේ නැත. ඔප නොදමන ලද සපත්තු - සති ගණන් එක දිගටම දමන සෝදා නැති මේස් මේ සියල්ල කීවේ ඔහුට ජීවිතය එපා වී ඇති වගය.

"බ්‍රාස්..."

ඒ හවස සුදාරක පරක්කු වූ හින්දා මා උන්නේ දොරකඩට වී මග බලාගෙනය. මිදුලටම විත් නතර කල සුදු පාට කාරයෙන් පළමුව බැස්සේ කාන්තාවකි. ඊළඟට අනෙක් පසින් බිමට බැස්සේ සුදාරකය.

"මානවී.... අද ටිකක් ලේට් උනා. බයික් එකත් පොඩ්ඩක් ලෙඩ දුන්නා. මං බස් එකේ එන්න හදනකොට මේ මිස් සින්තියා මට ලිෆ්ට් එකක් දුන්නා. එන්න සින්තියා ගෙට."

මම ඔහුට ඉඩදී පසෙකට වීමි. සුදාරක වෙතින් ජීවිතයේ පළමු වරට මත්පැන් ගඳක් මට ඒ මොහොතේ දැනිණි.

"වාඩිවෙන්න මිස් සින්තියා."

මා හරියටම ඇය දුකියේ මැද සාලේ විදුලි බුබුලේ එළියෙනි.





කොණ්ඩය සුදු පැහැයට හැරෙමින් තිබූ ඇය වයසින් සුදාරකගේ අම්මාගේම තරමේ එකියකි. මෙතෙක් කලක් සුදාරකට ඇගේ නම පාවා දෙමින් බොරුවට රන්ඩු ඇල්ලූ මා ගැනම මට උපන්නේ තරහවකි.

"සුදාරකගෙ කටේ තියෙන්නෙම මානවී... මානවී... මානවී...ම තමයි. මමත් හරී ආසාවෙන් උන්නෙ මෙච්චර මේ වර්ණනා කරන වයිෆ්ව බලාගන්න."

මිස් සින්තියා කීවාය.

"ඔයා හරී වාසනාවන්තයි දුවේ... සුදාරක කියන්නෙ ;;හකිණ්වත් හොයාගන්න බැරි විදිහේ පිරිමියෙක්."

ඈ පිටව යන්නට පෙර මට පමණක් මිදුලට කතාකොට කීවාය.

මගේ හිත දැවේය. ඔවුන් ගැන අහේතුකව සැක සිතා මා වෙණුර හා ගිය දුර දුන් ඉතින් ආපසු හැරෙන්නට පරක්කු වූවා වැඩි නොවීද?

"ඔයා මට පිටුපෑවොත් මං ජීවිතේ නැති කරගන්නවා."

සුදාරක පව් යැයි මා කියන හැම වරෙකම වෙණුර කියන මේ වචන ටික මගේ මතකයට ආවේය.

"ඔන්න මානවී දුන් සියලු වස්දොස් හමාරයි නේද? මං ඔයාගෙ හිතේ තියෙන බොරු සැකේ නැති කරන්න හිතාගෙනම තමා මිස් සින්තියා ගෙදෙට්ට එක්ක ආවේ."

සුදාරක මගේ අතින් අල්ලාගෙන කීවේය.

"හිතාගෙන ඇති දෙන්නම මං රැවටෙයි කියලා."

මම සුදාරකගේ අත ගසා දැමීමි.

"මොකක්...?"

සුදාරකගේ ඇස් නළලට ගියේය.

"ඔව් මාව ෂේප් කරගන්න කතාවෙලා ගෙදෙව්වම ගෙනාවා. හෙට අනිද්දට මෙහේ බිත්ත ගස්ස ගනියි."

"මොනාද මානවී උඹ මේ කියන කැත කතා. මගේ අම්මගෙ වයසෙ ගෑණියෙක් එක්ක නිදිවදින්න තරම් මං පහත් මිනිහෙක් නෙමේ."

සුදාරක කෑගැවේය. ජීවිතේ පළමු පාරට ඔහු මට "උඹ" කියා අමතනවා ඇසී මා වෙව්ලා ගිය බව සැබෑවි. එහෙත් මම වෙණුර වෙනුවෙන් හිතට දිරිගතිමි.

"අම්මගෙ වයසෙ උනාට අම්ම නෙමේනෙ."

මම යළිත් කීවෙමි.

"අවලම් කතා කියන්නෙපා ගෑණියේ. බැඳීම් නැති අහසින් වැටුණු එවුන්ට මොනාද බැඳීම් ගැන තේරෙන්නේ? ඒ වගේ එකියක් හින්දා මාත් අහසින් වැටුණු මිනිහෙක් උනා. අම්ම තාත්තා නංගී අමතක කරලා හිත හදාගන්න මං වින්ද දුක මතක් වෙද්දී දැනුත් මාව පිච්චෙනවා."

නොහිතා උනත් බිමතින් උනත් සුදාරක මගේ ජීවිතයේ දුර්වලම තැනට කදිම පහරක් ගැසුවේය.

"උඹ මගේ ජීවිතේ විනාශ කළා මානවී."

සුදාරක කෑගැසුවේය.





"මානවී මා එක්ක එනවද කියල ඔයා මගෙන් අහනකොට මං උන්නේ විවාහය තියා ආදරේ ගැනවත් හිතන වයසක නෙමේ. වරද අඩු වයසින් ඔයා එක්ක ආව මගේද? නැත්තං අඩු වයසෙ මගෙන් ඒ ප්‍රශ්නෙ ඇහුව ඔයාගෙද?"

මමද එකටෙකම කීවෙමි.

"උඹ ඔය නොකියා කියන්නෙ. මං නාකියෙක් මා එක්ක ඇවිල්ලා උඹේ ජීවිතේ විනාශ උනා කියල නේද? ඔව් බොල මං නාකියා ඉතින් උඹ පලයන් හොඳ එකෙක් හොයාගෙන."

පියෙව් සිහියෙන් උන්නානම් සුදාරක කවදාවත් මට මේ වචන ටික කියන්නේ නැත. එහෙත් ඔහු මට පාර හදා දුන්නේය.

"ඔව් මං යනවා තමා. තවත් මං මෙතන ළැගගෙන දුක් විඳින්නෑ..."

"ඉතින් පල..."

සුදාරක බෙරිහන් දුන්නේය.

මම කාමරයට ගොස් පිටව යද්දී රැගෙන යන්නට කලින් හිතා හිටි හැමදේම මල්ලකට දමාගෙන ගෙයින් පිටවීමි. සුදාරක ඔහු මා වළකන්නද - මට යන්නට ඉඩ හරින්නද කියාවත් හිතාගන්නට බැරිව පුටුවකට කඩා වැටී උන්නේය.

කළුවරේම මහ පාර තෙක් ඇවිද ආ මම ඈතින් පෙනෙන ගෙය දෙස බැලීමි. මොනවා උනත් ඒ සුදාරකත් මමත් ආදරයෙන් ගොඩනගාගත් කැදැල්ලය. මා ගැහැණියක වූයේත් - බිරිඳක වූයේත් ඔය ගෙදරදීය. ඉතින් මේ යන ගමන ආපසු කවදාවත් ඔය ගෙදරට හැරී ඒමක් නැත.

හිත තෙරපාගෙන උඩට මතුව ආ වේදනාව විලාපයක්ව මුවින් පිටවිය. මා කඩයකින් වෙණුරගේ ජංගම දුරකථනයට ඇමතුමක් ගත්තේ හඬාගෙනමය.

"වෙණුර...."

"මානවී..."

මේ රැයේ මගේ කටහඬ අසා ඔහු පුදුම වෙන්නට ඇත.

"වෙණුර මං ඒ ගේ අතෑරලා ආවා.... මං සදහටම ඒගේ අතෑරලා ආවා...."

මම හඬමින් කීවෙමි.

"මානවී... ඔයා දැන් කොහෙද ඉන්නේ?"

මම ඔහුට මා ඉන්නා තැන විස්තර කළෙමි.

"ඔයා කොහෙවත් නොයා ඔතනම ඉන්න. මං විනාඩි දහයෙන් එනවා."

කිව්වා වාගේම මා වෙතට එන්නට වෙණුරට ගතවන්නට ඇත්තේ විනාඩි දහයක් විතරමය.

"නගින්න මානවී."

මම ඔහු රැගෙන ආ ත්‍රීරෝද රියටම ගොඩවීමි. අප රැගත් රිය පාර දිගට ඇදිණ.



kathapothak.blogspot.com

09

වෙණුර හා පලා ආ මට නතර වන්නට සිදුවූයේ බෝඩිම් කාමරයකය. එක පේළියකට සාදා තිබූ පුංචි කාමර පේළියේ හතරවෙනි එක වෙණුරටත් මටත් ලැබිණ.

"ඔය දෙන්න ලගදීද බැන්දෙ?"

යාබද කාමරයේ උන් පුංචි පවුලේ බිරිය මා හාරා අවුස්සන්නට පටන් ගත්තේ පසුදා හිටමය.

"මං හිතන්නෙ බැන්දෙ ලගදී වෙන්නැති."

ඔව් කියන්නද නෑ කියන්නදැයි මට හිතාගන්නට බැරි විය.

"අම්මා තාත්තා අකමැත්තෙන්ද බැන්දෙ? මං ඊත් අපේ රනිල්ට කිව්වා අළුත් ජෝඩුව තනියම පදිංචියට ආවේ මුවර් එකටම ගෙවල්වලට හොරෙන් බඳින්න ඇත්තෙ කියලා."

මා දිගටම නිහඬ වද්දී ඇය කියවාගෙන ගියාය. ගෙවල්වලට රහසේ මා පලා ආවේ වෙණුර සමග නොව සුදාරක සමගය. එකාතකින් රහසේ පලා ආවත් එය මීට වඩා නම්බුකාර විවාහයකැයි මට හිතේ. සුදාරක මා විවාහ කර ගත්තේය. එපමණක් නොව අප පදිංචි වූයේ ද අපේම කියා ගෙදරකය.

"ඔයාගේ ගෙදර අය මේ ගැන දන්නවද වෙණුර?"

මා වෙණුරගෙන් විචාලේ ඔහු තමන්ගේ පවුල හා ගේදොර ගැන කිසිවක් මා හා කතා නොකල නිසාය.

"මං ගෑණියෙක් ගත්තා කියලා අඩබෙර ගහන්න තරම් පවුලක් මට නෑ මානවී."

"ඇයි ඒ?"

මා විමසුයේ පුදුමයෙනි.

"මගේ අම්මා මුළු ජීවිතකාලෙම උන්නෙ රට.... අදටත් එයා ඉන්නෙ රට... තාත්තා මට අවුරුදු පහලොව වෙද්දී නව කසාදයක් කරගත්තා. මට වෙනස්කමක් කලේ නං නෑ. ඒත් දරුවෙකුට ලැබෙන්න ඕන ආදරේ මට ලැබුනෙත් නෑ...."

වෙණුර කියවාගෙන ගියේ දුකින් වාගේය.

මටත් නොදැනීම දිගු හුස්මක් හෙළිණ.

"මානවී..."

වෙණුර මගේ අත අල්ලා ගත්තේය.

"මට නෑදෑයො නෑ කියලා ඔයා දුක්වෙන්නෙපා මානවී. අපේ ජීවිතවලට ඇඟිලිගහන්න කවුරුත් නැති එක ගැන ඔයා සතුටු වෙන්න."

වෙණුර කියන්නේ ඇත්තය. ඔහුගේ ජීවිතය ගැන හොයා බලන්නට නෑදෑයින් කවුරුවත් උන්නානම් මට ඔහු නොලැබෙන්නට පවා ඉඩතිබිණ. විවාහක ගැහැණියක් හා මෙහෙම රහසේ පලා ඒම අනුමත කරන කිසිවෙක් ලොව ඇතැයි සිතිය නොහැකිය.





මුල් දවස් ටිකේ වෙණුර වේලාසනින් ගෙදර ආවේය. ඔහු එනවිට අපට රෑ කෑමත් අරගෙන ආවේය. වෙණුර බොහෝ විට වැඩපලෙන්ම කෑම කෑ අතර මට වේල පිරිමැහුණේ කඩයෙනි.

"මානවී..."

රැයේ ඇඳට වෙන වෙණුර මා තුරුළු කොට ගන්නේ නොඉවසිලිමත් බවකිනි. ඉදින් අර වැහිදා අඳුරේ මගේ යටිහිත කුප්පනු ලැබූ ආශ්වාදය සිත්සේ විඳගනු රිසිව මම ඔහුට ඉඩ දෙමි. වෙව්ලන - කම්පිතව සැලෙන වෙණුරගේ තොල්පෙති වලවත් ඇඟිලිවලවත් සුදාරකගේ ළඟ තිබූ සංයමයවත් - තැන්පත් බවවත් නොතිබූ බව ඇත්තය.

එහෙත්?

සුදාරක ලිංගික ජීවිතයේ සතුට සෙව්වේ ද්වි - පාර්ශ්විකවය. සුදාරක ලිංගිකත්වය තුළින් වෙණුර මෙන් ඒකපාර්ශවික සතුටක් මාහා ගෙවී ගිය අවුරුදු එකහමාරක විවාහ ජීවිතය තුළදී කවදාවත් නොලබා තිබිණි.

ගැහැණියක යනුත් සංවාසය තුළින් උපරිමය කරා යාහැකි සත්වයකු බවත් කෑමෙන් බීමෙන් සම්පූර්ණ වන්නාසේ ගැහැණු සත්වයාගේ ශරීරයටත් ලිංගික අවශ්‍යතාවයන් දැනෙන බවත් වෙණුර නොදැන උන්නාද?

"දවල්ට ඔයාට කෑම එකක් එවන්න කියලා මං පොල්අතු බත් කඩේට කිව්වා. කව්රු හරි කොල්ලෙක් බත් එකක් ගෙනැත් දුන්නොත් බාර ගන්න. රෑට කන්න හවසට මා එනකොට මොනා හරි ගේන්නං."

වැඩට යන්න ලෑස්සි වී මට ඉදිආප්ප පාර්සලයක් ගෙනැවිත් දුන් වෙණුර කීවේය.

"ඇයි වෙණුර අපි උයාගෙන කන්න පටන් ගන්නෙ නැත්තෙ?"

දින දෙක තුනක් පොල් අතු බත් කඩේ දියාරු තිසරු කෑම වේල කා ඇතිවී මම ඇසුවෙමි.

"නිකං මහන්සි වෙන්නෙ මොකටද මානවී.... උයන්න පටන් ගන්න කොච්චර දේවල් ඕනද? ලිප් - දර - වළං ඕව කරදර වැඩ. ඊට හොඳයි මේ විදිහට පිරිමහගන්න එක."

වෙණුර කීවේ හිනාවීය.

"මෙහෙම තුන්වේල කඩෙන් කනකොට මට හිතෙන්නෙ අපි ගතකරන්නෙ හරිම තාවකාලික ජීවිතයක් කියලා වෙණුර. පවුලක් උනාම උයාගෙන කන්න ඕන. එතකොටයි අපි දෙන්නා දූන් පවුලක් කියල දැනෙන්නෙ."

මම වෙණුරට පැහැදිලි කළෙමි.

"දැන් මං හම්බකරන පඩියෙන් නං ඕව ඔක්කොම කරන්න බැරිවෙයි මානවී. පොඩ්ඩක් ඉවසන්නකො කීයක් හරි එකතු කරගන්නකං. ඊට පස්සේ බැරියෑ අපට පවුලක් වෙන්න."

වෙණුර කියන්නේ මගේ කම්බුලකට සෙමින් තට්ටු කොටය. කඩෙන් කනවාට වඩා ගෙදර උයාගෙන කන්නට ඇත්තං හොඳය වෙණුර සුදාරක තරම් වගකීමෙන් නොහිතන බව මට අවබෝධ වෙන්නේ දැන්ය.

"අද හවස පහවෙද්දී ලෑස්තිවෙලා ඉන්න. අර ඔයාගෙ රෝසපාට බින්දු සූට් එකත් ඇඳගෙන. මට අද පඩි. වෙනසකටවත් එක්ක අපි හවස කොහෙන් හරි කාලා ටිකක් ඇවිදලා ගෙදර එමු."





වෙණුර මට කියා පිටව ගියේය.

එදා හවස මම ඔහු කී ලෙස රෝස පාට බිංදු තට්ටු තුනේ සායත් එයටම ගැලපෙන ඩී.ඇන්.ජී. ටීෂර්ට් එකත් හැඳ ගතිමි. මේ ඇඳුම මට සුදාරක උපන්දිනයට අරන් දුන් එකකි. ඇඳුම අතට ගත් මොහොතේ පටන් මට සුදාරක සිහිවූයේ වරක් දෙවරක් නොවේ.

"අද අපි චෛනීස් කමු.... ඔයා ආසනේ."

චීන අවන්හලකට ගොඩ වෙමින් වෙණුර කීවේය. කොනේ මේසයකට යන්නට මට ඕනෑ කළත් වෙණුරට උවමනා කළේ සෙනඟ අතර වඩාත් හොඳින් කැපීපෙනෙන මේසයක හිඳගන්නය. ලස්සනට මට අන්දවාගෙන මාත් සමග සෙනඟ අතරට යන්නට වෙණුරට වූයේ ලොකු ආසාවක් බව මා වටහාගත්තේ ඊයේ පෙරේයිදාය.

කෑම බීම ගැනීමෙන් පසු වෙණුර බිලද ගෙවා දැම්මේය.

"විනාඩියක් ඉන්න මානවී.... මං ටක්ගාලා එන්නං."

වෙණුර මා රඳවා අවන්හලේ වැසිකිළිය පැත්තට ගියේය. ලේන්සුව ඇඟිලි අතර පටලවමින් මම පාට බල්බ් රඳවා අලංකාර කළ අවන්හලේ මිදුල දෙස බලා උනිමි. උස් කළු පාට ගේට්ටුව මුළු මතින්ම ඇරදමා තිබුණ අතර නානා මාදිලි වාහන ඉන් ඇතුළු වේ. පිටවයේ. ගේට්ටුවෙන් ඇතුළුව අරලිය ගහ පාමුල නතර කළ සුදු පාට කාරය පෙර හුරු පුරුදු බවක් මට දැනුණේ සැනිණි.

"සින්තියා..."

නතර කළ වාහනයෙන් බැස දූරියකගේ අතින් අල්ලාගෙන අවන්හලට ගොඩවූ ගැහැණිය හඳුනාගන්නට මට එතරම්ම අමාරු වූයේ නැත.

සින්තියා දකීමෙන් මගේ හිතට දැනුණේ සුදාරක දකි තරමේ කම්පනයකි. මගහැර යම්දෝ - ඉවත බලාගම්දෝ නැතිනම් වෙත කුමනා කාරයේ ප්‍රතිචාරයක් දක්වම්දෝ කියාවත් හිතාගන්නට තරම් මට කාලයක් නොවීය.

"මානවී..."

සින්තියාගේ ඇස් වලට මා හසුවිය.

"මානවී ඔයා කොහෙද මේ...?"

ඈ මගේ අත අල්ලා ගත්තේ පුදුමයෙනි.

සිනහවක් මුහුණට නගාගන්නට උත්සාහ කලත් එය කොයිතරම් සාර්තක වූවා දැයි මා දන්නේ නැත.

"මොනවද මානවී ඔයාලට උනේ? මං දන්න හැටියට ඔයාලා ගොඩක් ආදරෙන් නේද උන්නේ?"

සින්තියා ප්‍රශ්න වැලක් ඇසුවාය. ඇය සියල්ල දන්නා බව මට දැන් විශ්වාසය.

"මානවී.... සුදාරක කොච්චර හොඳ කෙනෙක්ද? ඇයි එයාට ඔය වගේ දෙයක් කළේ? ඔෆිස් එකේ හැමෝමත් කතාවෙන්නෙ මේ යන පිළිවෙලට එයාගෙ ජීවිතේ උනත් විශ්වාස නෑ කියලා."

මගේ හිතට දැනුනේ දැඩි ගින්දරකි.

"ඇයි මිස් සින්තියා සුදාරකට මොනවා වෙලාද?"

"මොනා වෙලාද?"

සින්තියා එවර නම් තළල රැළි කොට බැලුවාය. ඒ මද නොරිස්සුමකිනි.





"තමන්ගෙ වයිෆ් දාල ගිය මිනිහෙක් විනාශ වෙනවා ඇරෙන්න තව මොනවා වෙන්නද මානවී? සුදාරක දැන් පැය විසිහතරම ඉන්නෙ සිහිනැතිවෙන්න බීලා. ඔෆිස් එන්නෙත් එහෙමයි. තව කොච්චර දවසක් රස්සාව කරයිද කියලත් විශ්වාස නෑ. ඇඳුම් පැලඳුම් ගැන තියා එයා තමන්ගෙ කෑම බීම ගැනවත් උනන්දුවක් නෑ. ගොඩක් දවසට එයා ඉන්නෙ බඩගින්නෙ."

මගේ බඩපපුව දැවේය. නෙත නිකම්ම තෙමුනේය. අනේ අහිංසක සුදාරකට මේ විනාශය කළේ මා නොවේද?

"ආච්චි අම්මා අපි යංකෝ."

සිඟිති දැරිය සින්තියාට කරදර කළාය.

"මේ මගෙ ග්‍රෑන් ඩෝට මානවී.... හරි ආසයි වෙඩිස් වලට."

දැරියගේ හිස අතගාමින් සින්තියා කීවාය.

"ඔයාල අතර මොනවගේ ප්‍රශ්න තිබුණද කියලා මං දන්නෑ මානවී. ඔයාගෙ පැත්තෙන් බැලුවොත් මේ ප්‍රශ්නෙදි ඔයා සාධාරණ වෙන්න පුළුවන්. ඒත් අපි මනුස්සයො විදිහට හිතුවොත් සුදාරකව මේ විනාශයෙන් ගොඩගන්න ඔයාට යුතුකමක් තියෙනවා."

සින්තියා ඒ ටික කීවේ බොහොම පැහැදිලිවය.

"මානවී..."

වෙණුර පැමිණ මගේ අත අල්ලා ගත්තේය. මිස් සින්තියාගේ ඇස් ලොකුවිය.

"මානවී.... ඔයා සුදාරකගෙන් ඈත් වුනේ මේ වගේ දෙයක් හින්දා කියලා මං කීයටවත් හිතුවෙ නෑ. ඒ අහිංසක මනුස්සයා

තවමත් වැලපෙන්නෙ ඔයාට උනදෙයක් හරියටම හිතාගන්න බැරිව. අනේ මන්දා.... මේවා මාර ප්‍රශ්න... අපි යං බබී..."

මිස් සින්තියා මා ළඟින් ඉවත්ව ගියේ හිත හොඳින් නම් නොවේ.

"මානවී අපි යමුද?"

අතපය තබා ඇඟිපිල්ලමක්වත් සොලවාගත නොහැකිව උන් මගෙන් වෙණුර ඇහුවේය. මගේ අත දැඩිව අල්ලාගත් වෙණුර පස්සේ මා අවන්හලෙන් එළියට ආවේ ගීතෙන් වාගේය.



# 10

විභාගයක් ගැහැණු පිරිමි වෙනතක යන්නේ ලිංගිකත්වය හෝ වෙනයම් හෝ අඩුවක් පාඩුවක් නිසාය. එහෙත් වෙනසක් නොයාත් හිතක් වෙනතක යන්නට පුළුවන් බව මට අවබෝධ වූයේ දැන්ය. සුදාරක රාමනායක අතැර මා වෙණුර හා ආවේ ඒ වෙනස නොයා මිස සුදාරක වෙතින් මට සිදුවූ අඩුපාඩුවකට නොවේ.

"ඔයාලා අතර මොනවගේ ප්‍රශ්න තිබුණද කියලා මං දන්නෑ මානවී. ඔයාගෙ පැත්තෙන් බැලුවොත් මේ ප්‍රශ්නෙදී ඔයා සාධාරණ වෙන්න පුළුවන්. ඒත් අපි මනුස්සයො විදිහට හිතුවොත් සුදාරකව මේ විනාශයෙන් ගොඩගන්න ඔයාට යුතුකමක් තියෙනවා."

වෙණුර හා විසුවත් සින්තියා මුණගැසීමෙන් පසුව හිත හදා ගැනීම මට ලේස් පහසු කරුණක් වූයේ නැත. මිස් සින්තියා කියූ පරිදි සුදාරක බීමට ඇබ්බැහි වූයේ නම් ඒ මා නිසාදාය. ඉතින් ඔහුගේ හිත හැදීමත් කළ යුත්තේ මා නොවේද? සින්තියා මුණ ගැසීමෙන් පසුව මට ළවමනා කළේ කෙසේ හෝ සුදාරකට කතා කරන්නය.

"මිනිහා මැරිච්ච ගෑණි වගේ බලාගත් අත බලාගෙන

හූලන්නෙපා මනාවී.... මං ආසයි ඔයා හිනාවෙලා ඉන්නවා බලන්න."

වෙණුරටත් මගේ වෙනස දැනුණ ගානය. ඒත් සුදාරකට වචනයක් කතා නොකොට මා හිත හදාගත්තේ කොහොමද? වෙණුර රැකියාවට ගිය පසු මම මාරු කාසි කීපයක් අත මිට මොලවාගෙන බෝඩිම කන්ද පල්ලම් බැසීමි. වෙණුර කී පොල්අතු බත් කඩයට මෙහායින් කාසි දමා කතා කළ හැකි දුරකතනයක් සවිකොට තිබිණ.

සුදාරකව මුණ ගැසීමට අවසර නොතිබුණා ඇත්තය. එහෙත් මට ඔහුට කතා කල හැකිව තිබිණි. ජංගම දුරකතන අංකය කීපවරක් නාදවීමෙන් පසු පිළිතුරු ලැබිණ.

"හ්... ලෝ..."

ඒ සුදාරකගේ හඬය. මගේ අතගැලි පවා වෙව්ලා ගියා විශ්වාසය. මේ මා ගැහැණියක බවට පත්කළ මිනිසාය.

"හ්.... ලෝ.... ව්..."

සුදාරක ඒ මොහොතේ නම් බීමත්ව උන්නේ නැත. එහෙත් ඒ කටහඬේ ගැබ්ව තිබූ බලාපොරොත්තු සුන්වීමේ වේදනාව මට හොඳාකාරවම ඇසිණ.

"සුදාරක..."

ජීවිතයේ පළමුවරට මම ඔහුට "මහත්තයා" නොකියා නමින් කථා කළෙමි.

"මානවී..."

මගේ ඒ එකම වදනින් ඔහු මා හඳුනාගත්තේය.





"මානවී... ඇයි මට මෙහෙම කළේ...."

ඔහුගේ හඬ හැඟුම් බරය.

"ඔයා නොදන්නවට මේ සමාජෙ ගැහැණු පිරිමි මිනිස්සු රණ්ඩු වෙනවා. ඒත් එහෙම උනා කියලා ගෑණියෙක් කසාද බැඳපු මිනිහව දාලා යන්නෑ මානවී. හස්බන් වයිෆ් දෙන්නගෙ රණ්ඩු බත ඉදෙනකන් විතරයි කියලා ඔයා අහල නැද්ද මානවී... මාව මෙහෙම දාලා යන්න මං මොකක්ද ඔයාට කරපු වරද?"

"ඔයා මාව ගෙයින් එලෙව්වා..."

මම නිවැරදි වන්නට උත්සහ කළෙමි.

"එකම එක පුංචි වචනෙකට මං අවුරුදු ගාණක් ඔයා වෙනුවෙන් කරපු හැමදේම යට උනාද මානවී. මාව දාලා යන්න තරං ඒ වචනෙ ලොකු උනාද?"

සුදාරකගේ හැම වචනයකම තිබුණේ සාධාරණය නොවේද? සත්‍යය නොවේද?

ගැහැණු පිරිමි අපි දෙපක්ෂයම සැමවිටම හිතන්නේ අත ඇති දෙයට වඩා දුර පෙනෙන්නට ඇති දෙය රසවත් බවත් සුන්දර බවත්ය. ගැහැණියක වූ මගේ හිතත් ක්‍රියා කළේ ඒ පොදු ධර්මතාව ඔස්සේය.

පුංචම්මාගේ ගෙදරින් මිදී සුදාරක හා පැන ඒම නම් විදි දඬුක් ඉවර කරන්නට හිත බල කළා යැයි මට නිදහසට කරුණු තිබේ. එහෙත් සුදාරක අතැර වෙණුර හා පලා ඒම මා සාධාරණකරණීය කරන්නේ කෙසේද?

"ඔයා ඉන්නෙ කොහෙද මානවී? තනියම ජීවත් වෙන්න

තරම් සමාජේ ගැන ඔයා මොනවද දන්නේ? ආපහු ගෙදර එන්න මානවී. නැත්තං ඉන්න තැනක් කියන්න මං ඇවිත් ඔයාව එක්ක යන්නං."

මා වෙණුර හා දිගයක් ඇරඹූ බව සුදාරක තාමත් දන්නේ නැත. ඔහු දන්නේ මා ඔහුත් - ගෙයත් හැරපියා ගිය බව පමණි. එහෙත් මා දැන් ආපසු හැරෙන්නට බැරි තරම් දුරක ගිය බව ඔහුට කියන්නේ කොහොමද?

"බීල ජීවිතේ විනාශ කරගන්නෙපා සුදාරක."

මම මාතෘකාව වෙනස් කළෙමි.

"ජීවිතේම සන්තෝෂෙන් ඉන්න හිතාගෙන මං ලස්සන පුංචි කෙල්ලක් තෝරගත්තා. අම්ම, තාත්තා, නෑදෑයො, ගෙවල් දොරවල්, යානවාහන එපා කියලා ඒ කෙල්ලව මං ළඟට ගත්තා. ඒත් හීනෙනුවත් නොහිතුව විදිහට ඒකිත් මාව දාලා ගියා. දැන් මට කවුද ඉන්නේ? මෙහෙම බීල නාස්ති නොවී වෙන මොනවා කරන්නද මං?"

ඉකිගසා විලාප දෙන්නට නොහැකි බව සැබැවි. එහෙත් ඇස්බැම් කඩාගෙන කඳුළු දෝරෙ ගැලුවේය.

"මානවී.... ඇයි කතා නැත්තේ? කියන්න ඔයා ආයෙ ගෙදර එනවනේද? මට ඔයා නැතුව ජීවිතයක් නෑ මානවී..."

සුදාරක තවත් මොනවදෝ කියාගෙන ගිය නමුත් අතරැදී කාසි කීපය හමාර වී ඇමතුම විසන්ධි විය. කල කතාබහෙන් බලාපොරොත්තු වූ කිසිවක් සිදු නොවූ නිසා රිසීවරය තබන්නට පවා මට හිතක් නොවීය. සුදාරකව මේ දුකින් ගලවාගන්නේ කෙසේද?





දුන් දුන් රිය උදාවද්දී මට දැනෙන්නේ දැඩි සාංකාණුකූල හැගීමකි. වෙණුර හා ඇදට ගොඩවන මට අර ඒකපාර්ශවික ලිංගික සබඳතාව ගැන වන්නේ දැඩි උදාසීන හැගීමකි. මගේ සිත පමණක් නොව කයද පිස්සකු මෙන් දගලන වෙණුරට ඉඩදෙන්නේ අලසකමිනි. දරදඬුව ගිය මගේ සිරුර තුළ ඔහුටත් මුලදී දැනුණ සතුට නොදැනුණා වන්නට ඇත.

"මොකද ඔයි මළමිණියක් වගේ?"

වෙණුර සමහර දවසක මගේ ඇගට කඩා පැන්නේය.

මට සුදාරක සිහිවිය නොමේරූ මගේ හිතත් කයත් පුබුදුවාලීමට සමත්කමක් ඔහුට තිබුණා නොවේද? මට ඒ හැමවිටකම හිතුණේ මට සුදාරක දමා නොඑන්නට තිබුණා කියාය.

වෙණුරගේ ඒකපාර්ශවික සංවාසයෙන් මිදී නෙත පියවා ගන්නට හැදුවා විතරය. මා තිගැස්සී ගියේ අල්ලපු කාමරයේ පිරිමියා - රනිල්ගේ කටහඬිනි.

"පත්තිනි අම්ම වගේ හිටියට මං දන්නව උඹේ හැටි."

"මගේ වැරදි හොයන්න උඹ හරි පිරිමියෙක්ද බං.... අරව දෙන්නං මේව දෙන්නං කියල රවට්ටගෙන ආව. අන්තිමේ ලගින්න උනේ අනුන්ගෙ බෝඩිං කාමරවල."

ඒ රනිල්ගෙ බිරිය රාජිකාය.

"අනේ බං ඉස්කොලේ යන වයසෙදි මගුල් මතේ ඉහට ගහල උඹනෙ මයෙ කරේ එල්ලුනේ. උඹ හරි ගෑණියක් නං සුදු ගවුම පිටින් මා එක්ක එයිද?"

දබරය ඇවිලයන ගාණය. මම වෙණුර පැත්තට හැරීමි.

රතිල්ගෙත් - රාජිකාගේත් දබරය පාරේ එහා පැත්තේ පොල්අතු කඩයට උවද ඇහෙනවා නිසැකය. එහෙත් මෙයාකාර ඝෝෂාවක් තිබියදී වෙණුර නින්දේය.

"උඹ තව වචනයක් හරි කතා කළොත් ගහනවා දත්වික බඩට යන්ඩ."

රතිල් එවර කතා කළේ වෙව්ලන හඬිනි.

"හා... ගහපිය බලන්ඩ... උඹ ගහනකං මං උඩ බලන් ඉදී එහෙනං..."

"මොනාද තෝ කිව්වේ?"

ඊට පසුව ඇහුනේ බඩු පෙරළෙන - කිදෙන - පහරදෙන - විලාපදෙන හඬය. මම දෑතින් කන්වසාගෙන කොට්ටයට මුහුණ ඔබා ගතිමි.

සැණින් මට සුදාරක සිහිවිය.

මාද පාසල් වයසින් පිරිමියෙකු හා රහසේ පලා ආ ගැහැණියකි. එසේ වුවා කියා සුදාරක මට දුක් විදින්නට ඉඩක් තැබුවේ නැත. ඔහු මට මගේම ගෙදරක පතිනියක්ගේ අයිතියත් - ගෞරවයත් ලබා දුන්නේය. තාවකාලිකව අන්ධ වී සිට යළි පණත් ලැබුණා වාගේ මේ මට පෙනෙන්නේ මොනවාද? මේ සියල්ල අවබෝධ වන්නට මට මෙතෙක් කලක් ගතව ගියේ කොහොමද? මා අන්ධ වූයේ වෙණුරගේ පෙනුමටද? වයසටද? සෙල්ලක්කාරකමටද? කෙසේ නමුත් ඒ තිත්ත ඇත්තේ එලය මගේ ගෙල සිරකරවන තරම් වේදනාකාරීය.

"මානවී ඔයා නොදන්නවට මේ සමාජේ ගැහැණු පිරිමි මිනිමරා ගන්නවා. ඒත් එහෙම උනා කියලා ගෑණියෙක් කසාද





බැඳපු මිනිහව දාලා යන්නෑ මානවී. හස්බන් වයිෆ් දෙන්නගෙ රණ්ඩු බත ඉදෙනකන් විතරයි කියලා ඔයා අහලා නැද්ද මානවී."

සුදාරක කී සියල්ල සත්‍යය බව මට අවබෝධ වූයේ පසුදා දහවල්ය. එදා දහවල් එක පමණ වනතුරු බෝඩිම වසා තිබිණි.

"දෙන්නගෙන් එක්කෙනෙකුට කරදයක්ද දන්නෑ."

හිත නිරන්තර මට කීවේය. වෙණුර රැකියාවට පිටත්ව යන්නට සූදානම් වෙමින් සිටියේය.

"අල්ලපු ගෙදර ඊයෙ මහ රෑ ලොකු රණ්ඩුවක් ඇහුණා වෙණුර. ගහගත්තාත් එක්ක. උදේ ඉදල දොරත් වහලා. මට නං මයේ බෑ."

මම වෙණුර හා කීවෙමි.

"අනුන්ගෙ කුණු හොයන්නැතිව තමුසෙ තමුසෙගෙ වැඩක් බලා ගන්නවා."

වෙණුර ගත්කටටම මට කීවේය. ඔහුට දුන් පොඩි දෙයටත් මා හා තරහා යයි. මේ වෙනස්වීම ඇතිවූයේ අප අතරවූ ලිංගික බැඳීම බිඳියාමත් සමඟය. පිරිමින්ට විවාහයේදී ලිංගිකත්වය යනු කොඳුනාරටිය තරම් අත්‍යවශ්‍ය දෙයක් වෙන බව මට සුදාරක හා ගෙවුණු ජීවිතය තුළදී අවබෝධ වී නොතිබුණත් වෙණුර හා වාසයෙන් පසු මම එය මනාව තේරුම් ගතිමි.

## 11

වෙණුර පිටව යාමෙන් පසු මම කීපවරක් මිදුලට ගොස් රනිල්ගේ කාමරය දෙසට එබිකම් කොට බැලීමි. කිසිදු ශබ්දයක් නැත. මට පත්තරවල හා රූපවාහිනියෙන් දුටු එක එක මාදිලියේ අපරාධකතා සිහියට නැගිණි. රාජිකා අතින් රනිල් මියගියා හෝ රනිල් අතින් රාජිකා මිය ගියා වන්නට බැරිද? ඉතිරි වූ පුද්ගලයා විසින් මියගිය කෙනාගේ ශරීරය සගවා පලා ගියා වන්නට බැරිද?

"දඩාස්..."

රාජිකාලාගේ ගෙදර දොර ඇරුණේ මා වලස්වැදිරිය වැටේ රෙදි වනමින් හිටියදීය. දියරෙද්දක් හැද කොණ්ඩය කඩාගත් රාජිකාත් කොට කලිසමක් පමණක් හැදි රනිලුත් එළියට ආවෝය. රනිල් රාජිකාගේ අතින් අල්ලාගත් අතර දෙදෙනා මා පියමංකොට පොදු ළිඳ ළගට යන්නට ආවේ එකිනෙකාට කොඳුරා ගනිමිනි.

"මානවී"

රාජිකා මා ළග මොහොතකට නතරවිය.

"අද දවල් වෙනකම්ම නින්ද ගියා අනේ. රනිල්වත් අද ඔෆ්ඩේ එකනේ."





ඇ කිවේ හිනැහී බලා රනිල්ගේ උරයට ආදරයෙන් අත තබාය.

"අපි නාගෙන එන්නංකො."

කිවයුතු කිසිත්ම මගේ මතකයට නාවේය. සමහරවිට මගේ දෙනෙත් පුදුමයෙන් විවරව තිබෙන්නට ඇත. ඊයේ රැයේ රණ්ඩු කරගත්තේ මේ දෙන්නාමදැයි විශ්වාස නැතිවන ගානට අද ඔවුන් ආදරයෙන් හිඳිති. සුදාරක එදා මට අවබෝධ කරවන්නට උත්සාහ කළේත් මෙයම නොවේද?

එදා වෙණුර වෙනදාට වඩා වේලාසනින් ගෙට ගොඩවිය. හවස ඔහුගේ ජායාව දකිනතුරු පාළුවේ තනිකමින් බෝඩිම කාමරයට කොටුවී හිඳින මට දැනුණේ සතුටකි.

"අද වැඩට ගියෙ නැද්ද?"

මා ඇසුවේ දවල් කෑම වේලාවට ඔහු බෝඩිමට ආ හින්දාය.

"අද අපේ එක්සෑම් රිසාල්ස් ඇවිත්නේ."

"ඉතින් ගියාද බලන්න."

මා ඇසුවේ නොඉවසිල්ලෙනි.

"ඔව්"

වෙණුර උත්තර දෙන්නේ අල්මැරුනගානටය. ප්‍රතිඵල දැනගන්නට මට තිබුණ උවමනාව ප්‍රතිඵල කියන්නට ඔහුට නොතිබුණේය.

"ඉතින් අනේ ඔයා පාස්ද කියන්නකො..."

මම වෙණුරගේ අතේ එල්ලීමි.

"හ්ම්.... ඉකෝන් වලටයි එකවුන්ට්ස් වලටයි ඒ. ලොජික් වලට බී."

මට දැනුණේ උතුරා යන සතුටකි. වෙණුර දක්ෂයෙකි. එය මා නොදැන උන්නා නොවේ. එහෙත් මේ තරම් සාර්ථක ප්‍රතිඵලයක් ඔහු අත්කර ගැනීම මට නිමිහිම නොදෙන සතුටක්ම විය.

"කොච්චර දෙයක්ද වෙණුර.... මටනං හරි සතුටුයි. ඔයාට ජ'පුරෙ ඉල්ලන්න පුළුවන් වෙයි."

වෙණුර ඇඳමත හිඳගත්තේය.

"කොහෙට ඉල්ලන්න පුළුවන් උනත් මොකටද යන්න විදිහක් නැත්තං."

"ඇයි ඒ..."

"බබෙක් වගේ කතා කරන්නෙපා මානවී.... මං කැම්පස් ගියොත් කවද ඔයාට කන්න අඳින්න දෙන්නේ. ඔන්න හිටපු විදිහටම ගෙදර උන්නනං අම්මා තාත්තා වියදම් කරයි."

මගේ පපුව දැවේය.

"ඔයා ඔය කියන්නෙ මං හින්දා ඔයාට කැම්පස් යන්න විදිහක් නෑ කියල නේද වෙණුර? ඔය විදිහට මගේ හිත රිද්දන්නෙපා අනේ."

මම ඇඳ මතට කඩා වැටීමි.

"ඔයාගෙ හිත රිද්දුවා නෙමේ මානවී."

වෙණුර මගේ අතැඟිලි මෘදුව මිරිකීය.





"ඔයා හිතන්නකො දවල් රෑ නැතුව පාඩම් කරලා පාස්වෙලත් කැම්පස් යන්න වාසනාවක් නැතුවම මගේ හිතට දැනෙන වේදනාව කොච්චරද කියලා."

ඔහු කියන්නේ ඇත්තය.

"මං රස්සාවක් හොයාගන්නං වෙණුර."

මා කීවේ එය කරන්නට පුළුවන් යැයි විශ්වාස කල හින්දා නොවේ. අනෙක පාසල් ගමන අතරමග නතරකළ මට ගාමන්ට් රැස්සාවකට යන්නට හෝ සහතික එකක්වත් ළග තිබුණේද නැත.

"ඔයාව රස්සාවකට යවන්න හිතාගෙන නෙමේ මානවී මං ඔයාව ළඟට ගත්තේ."

"ඒත්..."

"එපා.... ආයෙත් ඔය ගැන කතා කළොත් වෙන්නේ අපි දෙන්නගෙම හිත් රිදෙන එක. අපි ඒ අදහස අතඅරිමු. ඒලෙවල් රිසල්ස් හොඳ හින්දා සමහර විට මට මීට වඩා හොඳ රස්සාවක් හොයාගන්න පුළුවන් වෙයි."

වෙණුර ඉස්සර තරම්ම නොවුණත් මට තාමත් ආදරේය. අහම්බෙන් මා ඔහුගේ ජීවිතයට කඩා නොවැටෙන්නට ඔහු සමාජේ ඉහළ තැනකට යනවා නොඅනුමානය. වෙණුර ගැන උපන් අනුකම්පාවෙන් - වේදනාවෙන් මගේ හිත පිරී ගියේය.

## 12

වෙණුර රැකියාවට පිටත්ව ගියායින් පසු දවස මට ගෙවෙන්නේ අලසවය. රෙදි සෝදා නාගැනීම - ගේ දොර අතුගෑම හැරෙන්නට කරන්නට වැඩි යමක් බෝඩිම් කාමරය තුළ නොවිය.

මුලදී වෙණුරටත් පෙරාතුව නැගිටින මා දැන් දැන් අවදි වන්නේ වෙණුර හැදපැලද ගනිද්දීය. ඒනැගිට ගත්තත් ඔළුව කැරකෙන්නා වාගේ - ඇඟපත පණ නැතුවා වාගේ දැනෙන්නට පටන් ගනී. කරන්නට වැඩක් නැතිහින්දා ඇඟපතත් කම්මැලිව ඇති ගාණය.

දහයට පමණ ඉදිආප්ප පාර්සලය ලෙහා පිඟානට දමා ගත් මම කටවල් දෙකක් පමණ කෑවෙමි. බඩ පෙරලී කෑම උගුරට ආවේ නිකම්මය. මිදුලට දිවගොස් ඉදුල් අත පිටින්ම වැටේ එරබදු ගහක් අල්ලාගත් මම කෑ නොකෑ සියල්ල ඔක්කාරය කරන්නට වීමි.

"නංගී ඇයි?"

රාජිකා මා ළඟ හිටගෙන උන්නාය.

"අනේ මන්දා අක්කා.... කෑව ඔක්කොම වමනෙට ගියා."



"උදේට කැරකැවිල්ල වගේ තියෙනවද?"

"ඔව්."

"ඇඟට පණ නැති ගතියකුත් දැනෙනවද?"

"ඔව්."

"කෑමත් අප්පිරියද?"

ඇ මගේ කයට දැනෙන දේ ඒ අයුරින්ම කීවේ බලාහිටියා වගේය.

"යංකෝ කාමරේට."

මද සිනහවක් මුවග තියාගෙන ඇ මගේ අතින් උස්සා ගත්තාය. වත්තං කොටගෙන ඇඳට ගෙනාවාය. ඉක්බිති ඇ මගේ කනට ලංවී රහසින් පැනයක් ඇසුවාය.

මට පුදුමයෙන් ඇය දෙස බැලිණි. ඇය ඔය අහන වෙනස සිදුවන්නට තිබුණේ මීට දින පහලොවකට - දාසයකට පමණ පෙරදීය. එහෙත් අද වනතුරුත් බලාපොරොත්තු වූ වෙනස සිදුවූයේ නැත.

"නෑ අක්කා තාම... දවස පහු වෙලානං දවස් පහලොවක් විතර."

මම ලැජ්ජාවෙන් උත්තර බැන්දෙමි.

"ආ එහෙනං බයවෙන්න දෙයක් නෑ. දූත් ඉතින් ටිකක් පරිස්සං උනානං ඔක්කොම හරි."

රාජිකා හිනැහී කීවාය.

"ඇයි අක්කා..?"

මා ඇය දෙස බැලුයේ නළල රැලි කොටගෙනය.

"ඔයා අම්ම කෙනෙක් වෙන්නයි යන්නෙ ළමයෝ. ඔයාට බබෙක් ලැබෙන්න."

"බබෙක්..."

මගේ ඇඟපත කම්පිතව ගිය තරම පහදා කිව නොහැක.

"මට දරුවෙක්... වෙණුරගෙන් දරුවෙක්."

හිතට දනුණ හැඟීම මා පුදුමකරවන සුළුය. මට සැණෙන් සුදාරක සිහිවිය.

"දෙවියනේ සුදාරක මේ බව දන්නවනං...."

මා බලාපොරොත්තුව හිටියේත් - පැතුවේත් සුදාරකගේ දරුවෙකි. එහෙත් දරුවෙක් තරම් ආදරයෙන් හුරතලයෙන් මා බලාගත් සුදාරක අඩුවයසින් මා අම්මා කෙනෙකු කරන්නට කැමති වූයේ නැත. මුලදී දරුවෙක් ඉල්ලා ඔහු ළඟ රණ්ඩුකරගත් මගේ හිතින් මගේ වයස තාමත් ළාබාල බවත් - විඳින්නට ලෝකයේ ගොඩක් දේ ඇති බවත් අවබෝධවද්දී දරුවෙකු පිළිබඳ හීනය ගිලිහිණ. සුදාරකගේත් මගේත් ඈත්වීමේ ආරම්භයද එයයි.

"එහෙත් අද..?"

නොපැතූ නොසිතූ මොහොතක දරුවෙකු මගේ කුසට ලැබී තිබේ. නොදනුවත්වම මට කුස අතගෑවිණ. මොනවා උනත් ජීවිතයේ පාළුව තනිකම මකා ගන්නට මේ දරුවා මට උදව් වනවා





නියතය. වෙණුරගේ දරුවා වෙනුවෙන් උපන් ආදරයත් - සතුටත් මගේ හිතත් ජීවිතයත් ආලෝකමත් කරවිය.

මා එදා හවස වෙණුර එනතුරු මගබලා උන්නේ උතුරා යන සතුටින් නොඉවසිල්ලේය.

"මොකෝ නිකං මූණ තොරණ වගේ වෙලා."

වෙණුරටත් මගේ වෙනස දනී තිබිණ.

"සතුටු හිතෙන ආරංචියක් තියෙනව වෙණුර කියන්න."

වෙණුර මා දිහාව බැලුවේ පුදුමයෙනි. මම ඔහුගේ කනට කොට අළුත් ආරංචිය කීවෙමි. තිබුණාටත් වඩා පුදුමයෙන් ඒ ඇස් විවරවිය.

"දරුවෙක්..."

වෙණුර ගල්වී වාගේ මොහොතක් ගත කළේය.

"හොඳටම විශ්වාසද?"

මම 'ඔව්'යි කියන්නට හිස සැලීමි. වෙණුර ඇඳේ හිඳගත්තේ දෙදණ මත තබාගත් ඈත් මත්තේ මුහුණ හොවාගෙනය.

"වෙණුර...."

මම ඔහු අසලට ළංවීමි.

"ඇයි මේ ලොකු ප්‍රශ්නයක් වෙලා වගේ."

"ප්‍රශ්නයක් නේන්නං මානවී... අපි දෙන්නටත් තාම හරියට පිළිවෙලක් වෙලා නැතුව කොහොමද අපි දරුවෙක් හදන්නේ?"

"පිළිවෙලක් වෙලා නෑ...."

"ඇයි ඔයාට තේරෙන්නැත්තෙ... අපි පිළිවෙලක් වෙලා නෑ නේන්නං.... ඔයා තාම මගේ වයිෆ් වත් නොවී ඔයා කොහොමද මානවී මගෙ දරුවෙක් හදන්නේ?"

මට දූනුණ පුදුමයේ තරමට කතාකරගන්නට පවා වචන අමතකව මොහොතක් දෙකක් ගතවිය.

"මං තාම ඔයාගේ වයිෆ් වෙලා නෑ කිව්වා. ඇයි දෙයියනේ දූන් මාස හතරක් පහක් තිස්සේ මේ ඇඳේ මා එක්ක නිදාගත්තෙ ඔයා නේද?"

"ගෑණියෙක් මිනිහෙක් එකට නිදාගත්ත පලියට ඒ ගෑණි ඒ මිනිහගේ වෙන්නෑ මානවී. ඒකට රටේ පිළිගත්ත නීතියක් තියෙනවා. ඒ නීතියට අනුව මා එක්ක නිදා ගත්තත් ඔයා තාමත් සුදාරකගෙ වයිෆ්."

හිසට පොල්ලෙන් ගැහුවා වාගේ වෙණුරගේ වචන මගේ මනසට තදට දූනිණි.

"ඔයා මේ මොනාද කියන්නේ වෙණුර."

මගේ නෙත් නෙම් කටහඩ හැඩුම්බරව තිබිණ.

"මේ අහන්න මානවී මං මේ කතා කරන්නෙ ඔයාට ආදරේ නැතුව නෙමේ. ඒත් මගෙ දරුවෙකුට අවජාතකයා කියනවට මං කමැති නෑ. ඔයා නීතියෙන් සුදාරකගෙන් අයින්වෙලා මට අයිති වෙනකන් අපි දරුවෙක් ගැන අදහස හිතෙන් අත්අරිමු."

මට මගේ නෙත් පවා අදහාගත නොහැකි විය.

"එතකොට මේ දරුවා..."

"තාම මාසයක් විතරනේ.... අපි බේත් ටිකක් ගමු."





වෙණුර කීවේ සන්සුන්වය.

"බෑ..."

මා ඇඳෙන් නැගිට්ටේ ක්‍ෂණිකවමය.

"මේ දරුවා මගේ. මට මේ දරුවා ඕන."

මම එකහෙලාම කීවෙමි.

"මානවී කලබලනොවී මේ අහන්නකො..."

වෙණුරත් නැගිට මගේ අතකින් අල්ලාගත්තේය.

"එපා... ඕන් නෑ... ඒ ගැන තව එක වචනයක් වත් කතා කරන්නෙපා. මං දරුවා හදාගන්නවා."

මම දැඩිව තීරණය කළෙමි.

"ආ.... එහෙනං මේකත් මතක තියාගන්නවා. ඔය දරුවා හදාගන්න මගෙන්නං කිසිම උදව්වක් බලාපොරොත්තු වෙන්නෙපා."

වෙණුර කීවේ මගේ මුහුණට දබරැඟිල්ල උඑක්කොටගෙනය.

මින්පෙර වෙණුර හා මා අතර මතභේද තිබුණ බව සැබෑය. එහෙත් අප අතර ඇඩදබර ඇතිවන්නට පටන් ගත්තේ එතැන් පටන්ය. එකාතකින් වෙණුර ගැන පුදුමවන්නට දෙයකුත් නැත. උයාපිහාගෙන කනබොන එක පවා අමතර වදයක් කොට තැකූ ඔහු දරුවෙකු ගැන එහෙම නොසිතන්නේ කොහොමද?

උදේ හවස එකිනෙකාට කයින් නිරුවත්වන ගැහැණු පිරිමි හිතිනුත් ඒ විදිහටම එකිනෙකාට විවෘත වෙනවා නම් ලෝකය මෙයට වඩා සැනසිලිදායක තැනක් වනවා නියතය. වෙණුර මට ඔහු කරන කියන කිසිවක් නොකීවේය. වෙනදාට වඩා ඒ බෙව්

බෝඩිමට ආ ඔහු වෙනදාට වඩා වේලාසනින් පිටව ගියේය. මා සමග ගතකළ පැය කීපය වුවද මා අසන යමකට උත්තර දුන්නා මිස වැඩියමක් කතා බහ නොවිණ.

දිනෙන් දින උස්වන මෝරන කුස අතගාමින් සියලු ශාරීරික වෙනස්කම් පවා තිනව දරමින් මම ඔහේ කල්ගෙවීමි.

"තවම ක්ලිනික් එකකට ගියේ නැද්ද මානවී?"

උයන පිහන දෙයකින් කොටසක් මටත් ගෙනවිත් දෙන්නට අමතක නොකරන රාජිකා අක්කා ඇසුවාය.

"තාම නෑ අක්කා."

"තාම නෑ කිව්වෙ කවද්ද යන්න හිතා ඉන්නේ? දැන් මාස තුනකුත් පහු උනානෙ."

"වෙණුරටත් තවම නිවාඩුවක් හම්බ උනේ නැනෙ."

මා උත්තර දුන්නේ ලැජ්ජාවෙනි.

"එයාට නිවාඩු ලැබෙනකන් බලා උන්නොත් පෙරහැර ගිහින් තියෙයි. ඩොක්ටස්ලා කියන්නෙ මුල් මාසෙම ක්ලිනික් එකකට යන්න කියලා."

මා කොයිතරම තනිව අසරණව ඇද්දැයි හිතී උපන් අනුකම්පාවට මගේ නෙත් තෙමිණ. රාජිකා අක්කා පවා මගේ කඳුළු දකින්නට ඇත.

"නංගිගෙ දැන් වයස කීයද?"

ඇය ඇසුවේ මගේ අතකින් අල්ලාගෙනය.

"මේ අවුරුද්දෙ විස්සට ලඹනවා."





මා කීවේ නෙත කඳුළු අත්ලෙන් පිසදාය.

"මේ කාලෙට අම්මා තාත්තා ළඟ ඉන්න ඕන කියලා කියන්නෙ ඔන්න ඕක නිසා තමා. අම්ම තාත්තා උනත් කොච්චර තරහකින් වෛරයකින් උන්නත් මේ වගේ දෙයක් දැනගත්තම සමාව දෙනවා මානවි."

මා වෙණුර හා වසන්නේ දෙමාපියන්ට අකීකරුව රහසේ පලාවිත් යැයි නිගමණය කොට ඉන්නා ඇය කියන්නක් ඇත්ත විය හැකිය. එහෙත් දෙමාපියන් නැති මට පිහිටට ඉන්නේ කවුරුන්ද?

සැණින් මට සුදාරක සිහිවිය.

දෙමාපියන් වාගේ සමාව දී මට පිහිට උනොතින් ඒ සුදාරක විතරය. එහෙත් මා ඔහුට දුක් දුන් තරම ඇතිය. වෙණුරගේ දරුවෙකු තරපින්නාගෙන මට සුදාරක ළඟට යන්නට බැරිය. අනෙක් අතට මේ දරුවාට ආදරේ නොකලත් වෙණුර මට ආදරේය. කසාද ගැහැණියක වූ මා නමින් වෙණුර කළ කැපකිරීම් මට අමතක කරන්නට බැරිය.

වෙණුර මට ආදරෙයි කීවා පමණක් නොව බොරුවක් වංචාවක් නොකොට මා බාර ගත්තේය. අදටත් ඔහුගේ ලොවේ මා හැරෙන්නට අන් ගැහැණු චරිතයක් නැත. විශ්ව විද්‍යාලයට තේරීත් ඔහු ඒ අදහස අත්හැරියේ මා හින්දාය. එහෙම පිරිමියාට දුකක් දෙන්නට හිත හදාගන්නට බැරිය. මා සුදාරකට වේදනාවක් දුන්නේ නොහිතා නොබලාය. එහෙත් දැන දැනත් වෙණුරට දුකක් දෙන්නට හිත හදාගන්නේ කොහොමද?

"හෙට ලැස්ති වෙන්නකෝ. මංවත් එක්ක යන්නං."

රාජිකා අක්කාට මා ගැන දුක හිතෙන්නට ඇත.

## 13

දරුවෙකු ලැබෙන්න හිදියදී සම්පූර්ණ කරගත යුතු අවශ්‍යතා බොහොමයක් ඇති බව මට දැනෙන්නට පටන් ගත්තේය. කුස මෝරා ඉදිරියට එන හින්දා අඳින ඇඳුම්වල පවා වෙනසක් සිදුකළ යුතු බව මේ වනවිටත් මට දැනී තිබිණ. එහෙත් වෙණුරට ඒ ටිකවත් කියාගන්නට මා තුළ දිරියක් නොවීය.

"අඳින්න තියෙන ගවුම් දෙක තුනම ඉරිලා..."

අවශ්‍යතාව සෘජුව නොකියා මම වෙණුරට කීවෙමි.

"ඔය තියෙන විදිහකට පිරිමහගන්නවා."

වෙණුර කීවේ කිසිදු අනුකම්පාවක් නොමැති ගාණටය.

"පිරිමහගන්න තිබුණා මේ ගෙදරින් පිටට නොගියනං."

ඔහු මට අකාරුණිකවන බව දැනෙද්දී ඔහුට වචනයකින් හෝ විරෝධය පෑමේ ඕනෑකමක් දුන් නිතැතින්ම මගේ හිතට දැනෙයි.

"කටේ රැල් බුරුල් එහෙම ඇරගෙන ඔය එන්නෙ සද්දෙ ගහල."





වෙණුර කීවේ කටකොණද ඇදකොටය.

"මං සද්දෙ ගැහුවෙ නැත්තං දැන් ඔයාට මාව පේන්නෙත් නැනෙ. හෙට අනිද්දා ක්ලිනික් එකට යන්න ඕනෙ. එතකොට මේ ගවුම් කෑලි හිරකරගෙන ගිහින් බැනුම් අහන්න මට බෑ. මට අඳින්න ලොකු ගවුම් දෙක තුනක් ගන්න ඕනෙ."

"මේ මුලින්ම මං කිව්වා. දරුවා හදා ගන්නවා නං ඉතුරු දේවලුත් තමුන්ට තනියෙන් දරාගන්න වෙයි කියලා."

වෙණුර උත්සාහ දරන්නේ මා කටින් බයකොට යටත් කරගන්නය. මේ තරම් ආඩපාලි කියන්නට ඔහුට අයිතියක් නැත. කුසේත් දරුවා ඔහුගේ මිස වෙනකාගේවත් නොවේ.

"බොරුවට කෑගහන්නෙපා වෙණුර... මේ දරුවා මගේ විතරක් නෙමේ. ඔයාටත් මේ දරුවා ගැන අයිතියක් යුතුකමක් තියෙනවා."

මම සන්සුන්ව කීවෙමි. සමහර විට මගේ ඒ සන්සුන් බවම වෙණුර කෝපගන්වන්නට ඇත.

"හා.... මං එපා කියද්දීම බඩ හදාගත්තෙ බයක් නැතුව ඔහොම කියවන්න පුළුවන් හින්ද වෙන්නැති. හැබැයි තමුසෙත් එකක් මතක තියාගන්නවා. ඔය දරුවා මගේ ඕනකමට හදාගත්තු ළමයෙක් නෙමේ."

කෑගසා කියා වෙණුර එළියට බැස්සේය.

දැන් මා වෙණුර හා වසන්නේ කුලගෙයක නොවේ. ගිණි ගොඩකය.

සුදාරක අතැර දමා ආ පව - ජීවිතයේ කිසිදු දිනක කසාද ගැහැණියක නොකළ යුතු වූ ඒ වරද මගේ ආත්මයම විනාශයට ඇද දැමූ බව මට වැටහෙන්නේ දැන්ය. අතීතයේ කළ වරද නිවරද කරන්නට මට තවත් වරදක් කරන්නට බැරිය. නැත්නම් මා කරන්නේ වෙණුර අතැරදමා ගොස් සුදාරක ළඟ වැටී වහලියක සේ හෝ ජීවත්වී කළ පව් සමාකර ගැනීමය.

"මට දැන් මේ ඔක්කොම එපා වෙලා තියෙන්නේ."

රැයේ ඇඳට වැටුණත් වෙණුර උන්නේ සතුටකින් නොවේ.

වෙලාවකට ඔක්කොම දමලා ගහල කොහෙහරි යන්න හිතෙනවා. ඔහු නොකියා කියන්නේ මාත් මේ නූපන් දරුවාත් ඔහුට බරක් වගය.

මගේ ජීවිතය ගිනිගොඩක් කරගත්තේ මා විසින්මය. සුදාරක වෙතින් පතිණියක ලෙස සියල්ල ලබද්දීත් - පිට පිරිමියෙකු කෙරේ සිත අලවාගෙන වශී වී ගෙන මම ඒ ලද සියල්ලට පයින් ගසා පලා ආවෙමි. වෙණුර හා ගෙවුණු මාස පහක යුග දිවිය දැන් මට පසක් කරන්නේ මුලින් දැකි - විදි සියල්ල නිසරු බවය. දුරින් ඇති දෙයට පෙම්කොට අතේ රැඳි සියල්ල දමා ආ මා මොනතරම් මෝඩ ගැහැණියක්ද? මිනිසුන් සමාජය තුළ අසම්මත යැයි නොකළ යුතු දේ හංවඩු ගසා ඇත්තේ පදනම් විරහිතව නොවේ.

"නංගී"

රාජිකා අක්කා පසුදා මා බලන්නට ආවේ බවුන්පේපර් කවරයක දැමූ පාර්සලයක්ද රැගෙනය.

"මේ..... ඔයාට මංගාතෙ බඩුවක්."





මම ඇය අත තැබූ කවරය දිගහැර බැලීමි. තරමක් පරණ නමුත් නවමත් අළුත් පෙනුමින් යුත් ගැබිණි ගවුම් දෙකක් එතුළ තිබිණි.

"පුතා හම්බවෙන්න ඉන්නකොට මං ඇඳපුවා."

"පුතා..."

මා ඇසුවේ පුදුමයෙනි. මේ මාස පහටම ඇය හෝ රනිල් දරුවෙකු ගැන කතා කරනවා මා අසා නැත.

"මගෙයි රනිල්ගෙයි පුතා නංගි, දැන් ඉස්කොලෙ එකවසරේ."

"කෝ ඉතින් ඒ පුතා?"

"අපේ අම්මලගෙ ගෙදර ඉන්නෙ. කුකුල් කූඩු වගේ බෝඩිම් කාමරවලට අවුරුද්දෙන් අවුරුද්දට මාරුවෙවී පුළුවන්ද නංගි දරුවෙක් හදන්න? අම්මල දරුව බාරගත්තා. අපි මාසෙකට දෙකකට සැරයක් ගමේ ගිහින් බලල එනවා."

මට මගේ කුස අතගැවුණේ නිකම්මය. මගේ දරුවාට කුමන කලක් යාවිද? මගේ දරුවා බලාගන්නට - බාරගන්නට ඉදිරිපත්වන කිසිවෙක් නොවේ.

"මං ඔය ගවුම් පරිස්සං කළේ අපේ පුතාට නංගියෙක් හරි මල්ලියෙක් හරි ගේන්න ඕන උනහම අඳින්න. කෝ ඒත් මේ යන විදිහට තව දරුවෙක් ගැන හිතන්නෙ කොහොමද?"

මම රෝසපාට ගවුමක් ගෙන ඇඟට තබා හැඩ බැලීමි.

"මේ වෙලාවේ ඇඳුම්වලට සල්ලි යටකරන්නත් අමාරු ඇතිනෙ. නංගි ඕවා අඳින්න. බ්‍රහස්පතින්දට ඔය එකක් ඇඳගෙන ලෑස්තිවෙන්න ක්ලිනික් එකට යන්න."

රාජිකා කීවාය.

මගේ ඇස් නිකම්ම තෙත්විය.

"අක්කට මේ කරන උදව්වලට ගෙඩක් පිං."

මම කඳුළු බර දෑසින් කීවෙමි. ඈ සිනාසුනා විතරය.

ගැබිණි සායනයට යනදා මමත් වේලාසන අවදිවීමි. රෝසපාට ලොකු ගවුම හැඳ ලකලෑහැස්තිවීමි. වැඩට යන්නට සැරසෙමින් උන් වෙණුර හොරැහින් කීපවතාවක් මා දෙස බැලුවාය.

"රාජිකා අක්කා ගවුම් දෙකක් දුන්නා. හොඳයිද?"

හිතේ කහටක් නැතිව මම වෙණුරගෙන් ඇසීමි.

"කොහෙ යන්නද?"

ඔහු මගේ පැනයට උත්තර දුන්නේ තවත් පැනයකිනි.

"ක්ලිනික් එකට - රාජිකා අක්කාත් එනව කිව්වා."

"අතේ සල්ලි තියෙනවද?"

වෙණුර ඊගාවට ඇහුවේය. අතේ සල්ලි තියෙන්නට මා පඩියක් ගන්නා රැකියාවක් කරන ගැහැණියක නොවන බව ඔහු හොඳාකාරවම දනී.

"රාජිකා අක්කා කිව්වා එයාගානේ එක්ක යන්නං කියලා."

"හැම එකටම පිට මිනිස්සුන්ට අතපාන්න ගියහම මං කොහොමද කලිසමක් ඇඳගෙන පාරෙ බැහැල යන්නෙ?"

මට දැනුණේ දැඩි අසරණ හැඟීමකි. අනේ දෙවියනේ මාදිවෙල සර්ගේ පන්තියට මුලින්ම ආ දවසෙන් මට ජීවිතය ආපස්සට





හරවා ගන්නට පුළුවන් උනානං? නැත්නම් වෙණුර ආදරෙයි කී දවසෙන් පසු පන්ති නොයා ගෙදරම නතර උනානං. එසේ වුවානම් වෙණුර හා මා අතර ආදරයක් හටගන්නේ වත් මා සුදාරක දමාවින් මේ සා දුක් විඳින්නේවත් නැත.

"ආං"

වෙණුර රුපියල් දෙසීයක් ගෙන මට පෑවේය.

එය නොගෙන ඉන්නට තිබුණානං හොඳය. එහෙත් එයින් තවත් අසරණ වන්නේ මාය. ඇසේ කඳුළු හංගාගෙන මම අතපා මුදල ගතිමි.

වවුණේ පිහිටි සායනයට ආ බොහෝ මව්වරු උන්නේ තමන්ගේ සැමියා සමගය. තාත්තෙක් නැති දරුවෙකු බිහි කරන්නට යනවා වගේ අසරණකමක් මගේ හිතට දැනිණ.

රාජිකා අක්කා කීවාවාගේ සායනයට එන්නට මාස තුනකුත් පහුවීම ගැන හොඳ නිලධාරිනිය කළේ පලමුව මුළු සායනයටම ඇහෙන්නට බැණ වැදීමය.

"මෙච්චර කල් ලංකාවෙ නෙමේද හිටියේ?"

එය සමච්චලයට පමණක් කීවකැයි මට මගහැර සිටිය නොහැකිවූයේ ඇය පිළිතුරක් බලාපොරොත්තුව මාදෙසම බලා උන් හන්දාය.

"මෙහෙම තමා."

මම ඇහෙන නෑහෙන ගාණට කීවෙමි. නමුත් එය ඇයට ඇසී තිබිණ.

"එහෙනං අපරාදෙ බබා හම්බවෙන්න අමාරු උනහම මෙහෙට එන්න තිබ්බා."

ඒ ටිකනං ඇ කීවේ සමච්චලයට බව විශ්වාසය. සිද්ධිය බලා උන් කීපදෙනෙකුගේ මූවග සිනහවකින් ඇදවිණ. මගේ නෙත කඳුළින් පිරී ගියේ නිකම්මය.

"ඇගේ ලේනං අඩුයි. ඇයි කන්න බොන්න අමාරුද?"

ඇ ඊගාවට ඇහුවේ හඬබාල කොටය. මගේ නෙතේ විසුල කඳුළකැට ඇ සමහරවිට දකින්නට ඇත.

"කෑම අප්පිරියද?"

පිළිතුර පමා වූ නිසාවෙන් ඇ නැවත ඇසුවාය.

මුල් මාසයේ තිබූ ඔක්කාර ගතිය හැරෙන්නට මට ඉන්පසුව දෙඩියානේ කියා කිසිදු කෑම අප්‍රිය ගතියක් නොවිය. ලේ හිඟවෙන්නට හේතු වූයේ බඩගිනි දැනුණ තරමට මට කන්නට දෙයක් නොමැති වීම හින්දාය. එහෙත් මම කෑම අප්‍රියබව ඇයට හැඟෙන්නට හිස ඉහල පහල සෙලවීමි.

"දූන් ඉතින් අප්පිරියයි - වමනෙට එනවා කියල නිකා ඉඳල හරියන්නෑ. කොහොම හරි කෑමවේල සමබරව ගන්න ඕන... කුඩා මාළු, හාල්මැස්සො, පලා ජාති, අළුත් පලතුරු, එළවළු වැඩිපුර කන්න.... ඒ අතරේ මේ විටමින් පෙති ටිකත් දවසගානේ බොන්න."

පොල් අතු බත් කඩේ බත් පැකට් එකෙන් - ඉදිආප්ප මුලෙන් - පාන් බාගයෙන් යැපෙන මට ඔය කියන කෑම ජාති ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. සායනයෙන් ලැබුණ බේත් පෙති ටිකත් රැගෙන මම රාජිකා අක්කා සමඟ පාරට ආවෙමි.



kathapothak.blogspot.com

# 14

වෙලාව දහවල් දොළහ පමණ වීද අහස තිබුණේ කළු කොටය. ලොකු වැස්සක් ඇද වැටෙන්නට ඔන්න මෙන්න කියා අහසේ වලාකුළු පිරී තිබිණි.

"නංගී ඔහොමම ඉන්න හෙවණට වෙලා. මං එළවළු මුකුත් අරගෙන එන්නං."

පාර අයිනේ ලොකු අඹගහ පාමුල මා රඳවා රාජිකා අක්කා පාර මාරුවිය. මම දෙකන්පෙති අද්දරින් ගලන දහඩිය පරණ ලේන්සු පොඩින්නට පොගවමින් බලා උනිමි.

පාරෙන් එහා පැත්තේ එළවළු කඩයකට, ග්‍රොසරි එකකට යාබදව රටබීම හලක්ද වේ. එහි මුදුලේ තබා තිබූ බංකු මත හිඳ මත්වන මිනිසුන් පාරටද පෙනෙයි. කටින් ළැමට පිඹගත් මම නැවතත් රාජිකා අක්කා ගිය දෙස බැලීමි.

දූන් බීම හල ළග එකම කලබලයකි. එහි සේවකයෙක් පමණට වඩා මත්ව උන් මිනිසෙකු කරෙන් අල්ලා ගෙනැවිත් පාරට ඇද දැමීය. වැනි වැනී කෙලින් හිටගත් මිනිසා බීමහල දෙස මොහොතක් බලා හිඳ සෙමින් ගමන ඇරඹීය.

පැටලෙන අතපය වාරුකරගනිමින් අඩියෙන් අඩිය පිය මනින්නා කවුදැයි හඳුනාගත් මොහොතේ මසිත එකතැන නතරවිණ.

"දෙයියනේ සුදාරක"

කිලිටි අත්දිග කමිසයත්, බිම ඇතිල්ලෙන කකුල් ගෙවීගිය දිග කලිසමත්, බාටා දෙකත් සුදාරකව වෙනස් කොට තිබුණත් ඔහු හඳුනාගන්නට මට අමාරු නොවීය. කොයි අත යමදෝ - කොහේ හැංගෙන්නදෝ කියා හිතා එහා මෙහා බලද්දීත් සුදාරකගේ ඇස්වලට මා අසුවී තිබිණ.

"මානවී"

ඔහු පාර පුරා දෝංකාර දෙන්නට කෑගැහුවේය. එහං වෙන්නට මා පමා වුවා වැඩිය. ඔහු නොනවත්වා යනෙන වාහන ගැන පවා නොතකා පාරට පැන්නේය.

"ක්‍රීස්..."

"බ්‍රාස්..."

"කොහෙ යනවද බූරුවා."

"අඩෝ මැරෙන්නද හදන්නෙ"

"සුදාරක..."

මට කෑගැසිණ. වාහනවල ගැවී නොගැවී පාර මාරුවූ සුදාරක අන්තිමට ආ යතුරුපැදියේ හැපී විසිවී වැටිණ. මොහොතක් හැරී බලන්නට ගතකල යතුරුපැදිය නැවත පණ ගැන්වී නොපෙනී ගියේය.

"අනේ දෙයියනේ සුදාරක."



මා හඬාගෙනම විලාපදීගෙනම ගොස් බිම පෙරළී උන් සුදාරකගේ මුහුණ අල්ලා ගතිමි. ඔහුගේ හිස පැලී ලේ ගලමින් තිබිණ.

"මා.... න.... වී"

අමාරුවෙන් නෙත් විවර කළ සුදාරක මගේ අතක් අල්ලා ගන්නට දැඩිසේ උත්සාහ කළද බැරිවිණ.

"ඉතිං.... කො...හො...මද මානවී"

ලෙයත් - දහඩියත් අතරින් ඔහු අමාරුවෙන් කතා කළේය. අර ඉස්සරම දවස්වල වාගේ හිනාවෙන්නට උත්සහ කළේය.

"මේ ඔයා මොනාද කරගත්තෙ දෙයියනේ..."

මගේ දෑසින් නොකඩවා කඳුළු කඩාවැටෙමින් තිබිණ.

"මි... මං... ඔයාව කොච්චර හෙව්වද මානවී...?"

සෙනග එකා දෙන්නා දුරින් හිඳ වටව අප දෙස බලා උන්හ. මම සුදාරකගේ හිස උස්සා මගේ ඔඩොක්කුවට ගතිමි. ඔහුගේ කම්බුලක් මගේ පිරුණු කුසේ ගෑවිණ.

"ඔයාගෙ... හීන... ඔක්කොම... දැන් ඉටුවෙලා... නේද මානවී? ඔයා දරුවෙක් ගැන හීන දැක්කෙ... ඒ කාලෙ ඉඳලනේ... දැන් ඔයා සතුටින්ද මානවී."

සුදාරක හිනැහී ඇසුවේය.

මට මගේ ළය පලා ගන්නට හිතිණ. මහපාරේ හිස ගසා මියෙන්නට හිතිණ. ලෝකයක් තරමට මට ආදරය කළ සුදාරක - අද මා නිසාම හිඟන්නෙක් තරමට අසරණව හිඳී. මේ ආදරයේ දිග

පළල ඔහු ළඟ හිඳියදී මට අවබෝධ කරගන්නට බැරි වූයේ ඇයි?

අනේ මේ අපට මොනාවිද?

"මා... න... වි..."

සුදාරකගේ නෙත් පියව ගියේය. ඔහුට සිහිනැතිව ගියබව මට තේරිණ.

"අනේ මට කවුරුහරි මෙයාව ඉස්පිරිතාලෙ ගෙනියන්න උදව් කරනවද?"

මම හඩමින් අවට මිනිසුන්ගෙන් විමසීමි. එහෙත් දුරින් බලා උන්නා මිස එකෙකුවත් ඉදිරියට ආවේ නැත.

"අනේ පිං අයිතිවෙයි මට උදව් කරනවද? මෙයා මෙහෙම මහපාරේ මැරෙන්න ඕන මනුස්සයෙක් නෙමේ."

දෝත එක්කොට වදිමින් - හඬමින් - කියවමින් මම ආයාචනා කළෙමි. එහෙත් මේ ගැබිණි ගැහැණියටත් - බීමත්, තුවාලලත් මිනිසාටත් උපකාර කරන කිසිවෙකු නොවිණ.

"මානවි"

එළවළු පිරවූ සිලි මල්ලක් ගෙන සෙනඟ අතරින් ඉදිරියට ආ රාජිකා අක්කා පුදුමයෙන් මට ළංවිය.

"අනේ අක්කේ... මෙයාව ඉක්මණට ඉස්පිරිතාලෙකට ගෙනියමු."

මම ඇගේ අතේ එල්ලීමි.

"කව්ද මේ?"



ඇය ඇසුවේ පුදුමයෙනි.

"මං ඔක්කොම විස්තර කියන්නං අක්කේ. ඒත් ඊට කලින් මෙයාව ඉස්පිරිතාලෙකට ගෙනියමු. මෙහෙම ලේයන හැටියට මෙයා මැරෙයි."

මම පිංසෙන්ඩු වීමි.

"ඉඳපං ම ත්‍රීවීල් එකක් කතා කරන් එන්නං."

එළවළු බෑගයත් මාළඟ තබා ඇ නැවත දුව ගියාය. රාජිකා අක්කා කැඳවාගෙනා කොළපාට ත්‍රීවීලරයට සුදාරකව ගොඩකරගත්තේ රියදුරාගේත් - තවත් තරුණයින් දෙදෙනෙකුගේත් උදව්වෙනි. රාජිකා අක්කා එක පසෙකිනුත් මම අනෙක් පසිනුත් එයට ගොඩවූ පසු ගමන ඇරඹිණ. සායනයෙන් මා නමට ලැබුණ පෙති සියල්ල ලිහි ඉහිරී පාර පුරා විසිරී තිබෙනවා ත්‍රීවීලරය පිටත්වන ඇසිල්ලේ මම දුටුයෙමි.

රෝහලට ඇතුළු කරනවිටත් සුදාරකගේ හිසින් නොනවත්වා ලේ ගලමින් තිබිණ. බෙත් දමන්නටත්, තුවාලයට මැහුම් දමන්නටත් ඔහු ඇතුළට ගත් පසු මම කොරිඩෝවේ දිග බංකුවකට කඩාවැටීමි.

"නංගී..."

රාජිකා අක්කා මා ළඟින් වාඩිවූයේ මගේ අතක් අල්ලා ගෙනමය.

"නංගී කව්ද ඒ?"

මේසා මට පිහිටවන - මේසා මගේ දුකට ළඟ ඉන්නා ගැහැණියට බොරුවක් කියන්නට මට හිතුණේ නැත. ඇරත් හිතේ දුක කාටහෝ කීමෙන් වේදනාව මදකට හෝ තුරන්වනු ඇත.

"ඒ මගේ මහත්තයා..."

මම සෙමින් කීවෙමි.

"මහත්තයා ?"

ඇගේ දෑස් පුදුමයෙන් පළල් විය.

"එතකොට වෙණුර ඔයාගෙ කව්ද?"

ඈ ඊළග ප්‍රශ්නයත් ඇසුවාය.

මම ඇයට මේ තුන්කොන් ගැටුමේ මුල මැද අග සවිස්තරව විස්තර කළෙමි.

"උඹ හරිම මෝඩ ගෑණියෙක් නංගී. උඹ හරිම පව්කාරියක්."

කියන දෙය මුහුණටම කියනා ගැහැණියක වූ රාජිකා අක්කා එකවරම මට කීවාය.

"ගෑණියෙක් කල්පගාණක් පෙරුම් පුරල බලාපොරොත්තු වෙන ජීවිතේ උඹට නිකම්ම ලැබිලත් උඹ ඒක තේරුම් අරගෙන නැහැ. ඒ මදිවට මේ වගේ රත්තරං මනුස්සයෙකුට දුක් දීලා උඹ නව ආත්ම ගාණකට පව්පුරවගෙන ඉවරයි."

"අනේ මට බනින්නෙපා අක්කේ."

මෙතෙක් දවස් මගේ හිත මට පෙන්නාදුන් නමුත් මා පිළිගන්නට අකමැති වූ ඒ ඇත්ත පිට කෙනෙකුන් පෙන්නාදෙන විට මේතරම්ම දරාගන්නට අමාරුවගක් මට නොහිතිණ.

"උඹට එක අතකින් බැනල වැඩකුත් නෑ නංගී. උඹ පැණි රහයි කිය කියා වැරදි කරපු ගෑණියෙක්. එකාතකින් උඹට හරි වැරැද්ද කියලා දෙන්නවත් කවුරුත් ඉඳල නැතේ. අවුරුදු දාසයෙන්





දාහතෙන් මිනිහෙක් එක්ක පැනල ආවා. ඒ මිනිහා ටිකක් වයසින් වැඩි හින්දා ඊළගට අහුවෙච්ච පොඩි කොල්ලෙක්ගෙ දාංගලේටයි - රූපෙටයි රැවටිලා උං එක්ක ආවා. අනේ මන්දා මේවට කාට වැරදි කියන්නද කියලා."

රාජිකා අක්කා තමන්ටම කියන්නා වාගේ කියවාගෙන ගියාය.

හිසේ පැලුමට මැහුම් 3ක් දමුවත් සුදාරකගේ තුවාල කිසිවක් බරපතල ඒවා නොවේ. වැඩියමක් ඔහුට බලපෑවේ ශරීරය දුර්වල වීමය. ඒ හින්දා ලේ දෙන්නටත් ඔහු වාට්ටුවට ඇතුලත් කරන්නත් සිදුවිය. සුදාරක යනු උතුම් මිනිසෙකු බව මගෙන් අසා අවබෝධකොටගෙන උන් රාජිකා අක්කා මේ සියල්ල කරගසා කෙරුවේ අප්‍රමාණ කැපවීමකිනි.

"සුදාරක හම්බවෙච්ච බවක් වෙණුරට කියන්ඩෙපා."

ආපසු ගෙදර එන අතරේ රාජිකා අක්කා කීවාය.

"ඇයි අක්කේ.."

"මෝඩියේ කොයි මිනිහද කැමති තමන්ගෙ ගෑණි පරණ මිනිහට ආයෙ ළංවෙනවා දකින්න. ඔන්න උඹට ලොකු රණ්ඩුවක් අල්ලගන්න ඔතනං කිව්වට කමක් නෑ."

රාජිකා අක්කා කියන්නේ ඇත්තය. වෙණුර දන් මගේ ඇහිපිල්ලමක් වැරදිලා ගැහුණත් රණ්ඩුවට එයි. හොඳම දෙය නම් සිදුවූ කිසිවක් ඔහුට නොකියා හිඳීමය.

මම ලේපැල්ලම් සහිත ගවුම හෝදා දමා නාගතිමි. හවස වෙණුර ගෙදර එන වේලාවට පේවී දොරකඩ බලා උනිමි. ඒ සිනාවක්ද මුවේ තවරාගෙනය.

"අද මොකා එක්කද ගියේ?"

ඔහු ගෙට ගොඩ උනේ මගෙන් එහෙම අහගෙනය.

"රාජිකා අක්ක එක්ක. ඇයි මං ඔයාට කියලනෙ ගියේ රාජිකා අක්කා එක්ක ක්ලිනික් එකට යනවා කියලා."

"මං ඇහුවෙ ඒක නෙමේ. මහ ඉස්පිරිතාලෙට ගියේ මොකා එක්කද කියලා."

මගේ ඇග පණනැතුව වගේ ගියේය. මේවා කොහෙත් කොහොම වෙණුරට ආරංචි වෙනවාද?

"මානවි මං තමුසෙගෙන් ප්‍රශ්නයක් ඇහුවා. තමුසෙ කා එක්කද ඔයි ඉස්පිරිතාලෙ ගියේ?"

වෙණුරගේ හඩ පෙරටත් වඩා උස්ය. ඔහු මොන මොනවා දන්නවාදැයි නොදන බොරුවක් කියන්නත් බැරිය. ඇත්ත කියන්නට මම හිත හදාගතිමි. සුදාරක යනු වෙණුර නාඳුනන්නෙක් නොවේ. සුදාරක හා මා අතර ඇති සම්බන්ධය වෙණුරට කලබල වෙන්නට හේතුවක් වන තරම් මැනදී ඇතිකරගත් එකක්ද නොවේ.

"සුදාරක එක්ක."

"මොකා?"

වෙණුරගේ ඇස් පුදුමයෙන් ලොකු විය.

"සුදාරක එක්ක."

මම හිතට දිරිගෙන නැවත කීවෙමි.

"මං හිත්දා ඒ අසරණයා පිස්සෙක් වගේ පාර පුරා ගියා. පාර පැන්නෙ මාව දැකලා... මගේ ඇස් දෙක ඉස්සරහ පිටම





වාහනේක හැප්පුණා. අහක බලාගෙන යන්නෙ කොහොමද? මං ඉස්පිරිතාලෙට ගිහින් දැම්මා."

පුදුමයෙන් ලොකුව ගිය ඒ ඇස්වලට මම පැහැදිලිව විස්තර කළෙමි.

"මහලොකු හපන්කමක් කරලා තියෙන්නෙ"

වෙණුරගේ මුව කෝපයෙන් - උපහාසයෙන් ඇදවිය.

"මං හිත්දා ඒ මනුස්සයා ජීවිතේ කාලකන්නි කරගත්තා. මං හිත්දා ජීවිතෙන් පාර මැද්දෙ නැතිවෙන්න ඉඩදීලා මට මගඇරලා යන්ඩද කියන්නේ?"

තවදාවත් නැතුව මගේ කටහඩ වෙණුර ඉදිරිපිටදී පණපෙවී ගිහිණ.

"උඹට උ‍ාවම ඕනනං ඇයි උඹ මා ළගට ආවෙ"

බෝඩිමේ ටකරන් ඉහල යන ගාණට වෙණුර කෑගැවේය. විශ්වාසය අහල පහල කාමර කැලි දෙකතුනටම මේ දබරය ඇහෙන්නට ඇත. යාබද රාජිකා අක්කාගේ කාමරයේ කැසට් යන්ත්‍රයේ හඩත් ඉබේම නතරවිය.

"උඹ ඌ ගැන ඔච්චර හිතනවනම් ඇයි බොල මා එක්ක ආවේ?"

වෙණුර යළිඳු කෑගැවේය. මගේ ඇගේ ලෙය රත්වීගෙන එනවා වාගේ මට දැනිණ.

"ඔව් ඒවගේ බෝධිසත්වයෙකුට කරපු අපරාධෙ තමා මේ පඩිසන් දුන්නෙ මට."

මමද කැගැසුවෙමි. ලැජ්ජාව හා බිය මවෙතින් තුරන්ව තිබිණ.

"ඌ උඹට බෝධි සත්වයා. එතකොට වෙන එකෙක් එක්ක බුදියගත්තු උඹව කරගහපු මං දේවදත්තයා."

වෙණුර මට දෙවනි නොවීය.

"උඹ මාව රැවට්ටුවා.... මං සුදාරකත් එක්ක යස අගේට පවුල් කෑවා. උඹ තමා අපේ ජීවිත විනාශ කළේ..."

මම හිතේ මෙතෙක් කලක් හිරකර විඳි දුක මහ හඬින් කෑගසා කීවෙමි. සුදාරකව දකීමෙන් - ඔහු හා ගත කිරීමෙන් පමණක් නොව රාජිකා අක්කා වර්ණනා කළ සුදාරකගේ හොඳ ගතිගුණ සිහිවීමෙන් අභිමිකරගත් සොඳුරු ජීවිතය පිළිබඳ උපන් ලෝබය මට මා කව්දැයි අමතක කොට තිබිණ.

"මොනාද උඹ කිව්වේ. තව එක වචනයක් හරි කිව්වොත් ගහනවා උඹේ දත්ටික කැඩෙන්ඩ."

වෙණුර අඩියක් පෙරට තිබ්බේය.

"ගහපං.... ගහල මරපං මාව.... උඹ වගේ තිරිසනෙක් එක්ක ආවට මට එහෙම කරල මදි."

මගේ හිතේ උපන් හදිසි ආවේගය වෙණුරව පොලඹවා තිබිණි.

"චටාස්...."

වෙණුර පෙරට පැන මගේ කම්මුලට පහර කිපයක් ගැසීය.

"මරපං... මාව මරපං."





වේදනාව දරමින් මම නොනවත්වාම විලාපදීමි.

"අනේ මල්ලී මොනාද මේ කරන්නෙ?"

රාජිකා අක්කාත් රනිල් අයියාත් බලා උන්නා වාගේ ඇර තිබුණ දොරින් අප අතරට පැන්නේ මේ වේලාවේය. රනිල් අයියා වෙණුර අතින් ඇද ඉවත් කළේය.

"ඔය දෙන්නා අතරේ මොන ප්‍රශ්න තිබ්බත් මේ වෙලාවේ මෙයා ඉන්න තත්වය ගැන චුට්ටක් හිතන්න."

රාජිකා අක්කා වෙණුරට කීවේ තරහෙනි.

"පිරිමියෙක් කවදාවත් බඩදරු අම්මකෙනෙකුට අත උස්සනවද මල්ලී..."

රනිල් අයියාද කීවේය.

"පිරිමියෙක්.... මේ මිනිහා කවදාවත් පිරිමියෙක් නෙමෙ."

මම හැකිවෙර යොදා කෑගැසීමි. මේ කටින් මේ මොනවා පිටකරනවාදැයි කියා මා තුළ අවබෝධයක් නොවීය.

"මිනිහෙක් කියන්නේ තමන්ගෙ ගෑනිගෙ ඕනෑ එපාකං අවබෝධ කරගත්තු කෙනෙකුට. මෙයා කවදාවත් ඒ ගැන හිතුව මිනිහෙක් නෙමේ. ගෑණිව ඇදට පෙරලගෙන තමන්ගෙ වැඩේ විතරක් කරගත්තම ඒ ගෑණිගෙ මිනිහා වෙනව කියලයි මෙයා හිතාගෙන ඉන්නෙ."

මෙතෙක් කලක් වෙණුර හා සංවාසයෙන් මා ලද අතෘප්තකර හැඟීම මේ විදිහට සියල්ල වමාරන්නට මා පොලඹවන්නට ඇත.

පළමුව වෙණුර මා දිහා බැලුවේ අදහාගන්නට බැරිවා වාගේය. බලා හිදියදිම ඒ ඇස්, වත මැළවිණ. මිට මොලවාගත් දෑත කඩා වැටිණ. ඔහු හැසිරුන විදිහෙන් පෙනුණේ ඔහුගේ ආත්මයම කඩා වැටුණා වාගේය.

"නංගී... මොනාද උඹ මේ කියවන්නෙ?"

රාජිකා අක්කා මා උරහිසින් හොලවා ඇසුවාය. ඇත්තය. පිට මිනිහෙක් හා ගෑණියක් ඉදිරිපිට දී මට එකට ජීවත්වන මිනිහා ගැන ඔහොම නොකියා ඉන්නට තිබිණ. එහෙත් මා ඒ තත්වයට පත් කළේත් වෙණුරගේම හැසිරීම නොවේද?

වෙණුර හිමින් අඩිතියා මිදුලට බැස්සේය.

"මල්ලී...."

රනිල් අයියා හඩගෑවත් වෙණුර හැරුණේවත් - නතර වූයේවත් නැත.

"ඔහෙ ගියාවෙ තරහ නිවුණාම එන්නැතෑ...."

රාජිකා අක්කා රනිල් අයියාට කීවාය.

මම ඇඳ මතට කඩා වැටීමි. මෙතෙක් වේලා සිරුර වෙලා පැවති ආවේගය තුරන්ව හිතට දැනුණේ විශාල කලකිරීමක් - හිස් බවක් හා වේදනාවකි. මට මා ගැනත්, කතාබහක් නොකොට පරාජිතයකු වාගේ පිටව ගිය වෙණුර ගැනත් එකවාගේම දුක හිතිණ.

මම ඈතේ මුහුණ හොවා ඉකිබිඳින්නට වීමි.



## 15

වෙණුරගෙන් සමාව යදින්නට ලොකු උවමනාවක් තිබූ මම මැදියම් රැය වෙනතුරුත් මගබලා උනිමි. එහෙත් වෙණුර ආවේ නැත. රැයේ කොයි මොහොතක හෝ නින්දට වැටී ඇති මට වෙණුර ගෙදර පැමිණ නැති බව අවබෝධ වූයේ පසුදා උදේය. දවල් එක දෙක වෙනතුරුත් වෙණුර ආවේ නැත. මා උන්නේ තවදුරටත් උහුලා දරාගත නොහැකි අඩියකය.

"අනේ අක්කෙ වෙණුර..."

මා රාජිකා අක්කලාගේ බෝඩිං කාමරයට ගොඩවූයේ හඩාගෙනමය.

"තරහ නිවුණම ඌ ගෙදර එයි බං...."

රාජිකා අක්කා කීවේ අඩදබර පිරි පවුල් දිවියක් ගතකොට ලත් පුරුද්දෙන් වන්නට ඇත. එහෙත් ජීවිතේ පළමු වතාවට අඹුසැමියන් ලෙස දුරදිග ගිය රණ්ඩුවක පැටලී උන් මට ඈ මෙන් සංසුන්ව මේ ප්‍රශ්නය දිහා බලන්නට පුළුවන්කමක් වූයේ නැත.

"අනේ අක්කෙ මට වෙණුර ගැන දුකයි..."

මම හිතේ දුක රාජිකා අක්කාට කීවෙමි.

"උඹට විතරක් නෙමේ ඒකා ගැන අපේ රනිල්ටයි මටයි දෙන්නටත් දුකයි. මොනා උනත් ඌත් පව්."

රාජිකා අක්කා කියවාගෙන ගියාය.

"ගෑණු උනහම ටිකක් හිතලා බලලා වචන පිට කරන්නෝන බං. කටට ආව පලියට හැමදේම පිටකරලා බෑ. උඹ නං කලින් කසාද බැඳපු ගෑණි. ඒත් ඌ කොල්ලෙක්නේ. එහෙම වෙලත් උඹව බාර අරගෙන උඹ මත්තෙම නැගීගෙන හිටියනෙ. මොකෝ උඹව මෙතන දාලා පිට ගෑණු පස්සෙ ගියේ නැනෙ. උඹල අතරෙ ප්‍රශ්න තියෙනවා තමා. ඒ උනාට ගෑණියෙක් උනාහම ඉවසන්න ඕනෙ. ඔව් ඉතින් ඉවසන්න පුරුදු වෙච්ච ගෑණියෙක් උනානං අර වගේ රත්තරං මිනිහෙක්ව දාල එයිද...?"

රාජිකා අක්කා හා කතාබහ කිරීමෙන් වූයේ මගේ හිතේ තෙරපෙන වේදනාව තවදුරටත් වැඩිවීමය.

"අනේ මට බනින්නෙපා අක්කේ..."

හිතේ ගිත්ත වැඩි කරගැනීමට නොව නිවා ගැනීමට ඈ සොයා ගිය මා කීවේ අන්ත අසරණවය.

"මං උඹට බනිනවා නෙමේ නංගී. මෙවා තේරුම් කරල දෙන්න උඹට මීට කලින් කවුරු හරි හිටියනං උඹ මේ තරම් අමාරුවෙ වැටෙන්නෑ. දැන්වත් මං බනිනවා කියල හිතන්නැතුව මේ කියනදේවල් ටිකක් මොළේට ගනිං."

"මට වෙණුරව බලන්න ඕනෙ අක්කේ."

"උඹ අඩන්නැතුව ඉදින්. ඔය ඉන්න තත්වය හැටියට ඔහොම දුක් විඳින්න හොඳ නෑ. වෙණුර හවස ගෙදර එයි."





රාජිකා අක්කා මගේ හිස අතගා කිවාය. මං එහෙම හිතා හිත හදාගතිමි.

එහෙත් අප සිතුවා වැරදිය. රැය දෙකක් ගෙවී ගිහිනුත් වෙණුර ගෙදර ආවේ නැත. හිත පෙලූ බිය ස්තිරව ගියාවාගේ මට දැනිණ.

"වෙණුර වැඩ කරන තැන දන්නවද නංගි."

රනිල් අයියා ඊළඟ දවසේ ඇහුවේ මා ගැන උපන් දුකට වන්නට ඇත. මම කිසිදාක ගිහින් නැතත් වෙණුර වැඩකල බව කී වෙළඳ කලාපයට අයත් ඒ ඇඟලුම් කම්හලේ නම රනිල් අයියාට කීවෙමි.

"මං ගිහින් කතා කරල බලන්නං."

රනිල් අයියා කීවේය. එදා හවස ඔහු වැඩ ඇරී එනතුරු මා බලා උන්නේ පුදුම තරමේ නොඉවසිල්ලකිනි. එහෙත් ගෙදරට ආ රනිල් අයියා මට කෙලින් පිළිතුරක් නොදී ළතැවිණ.

"එයා ගෙදර එන්න බෑ කිව්වද අයියේ? අයියා කිව්වේ නැද්ද මං කරපු වරදට සමාව ගන්න බලා ඉන්නවා කියලා."

මම රනිල් අයියාගෙන් ඇහුවේ නෙත කඳුළු අවුත් කොටගෙනය.

"මට වෙණුර හම්බ උනේ නෑ නංගී."

"වෙණුර හම්බ උනේ නෑ? ඇයි එයා එහෙ නෙමේද වැඩ කළේ?"

"මිනිහා එතන තමා වැඩ කරලා තියෙන්නෙ. ඒත් දැන් දවස් දෙකකට කලින් මිනිහ රස්සාවෙන් අයින් වෙලා ගිහිල්ලා.

කොහේ ගියාද මොනවා කරන්න ගියාද කියලා යාළුවෙක්වත් දන්නෑ."

මගේ නෙත කඳුළු වියැකිණ. වෙණුර පිටව ගොස් තිබේ. ඔහු පිටව ගොස් ඇත්තේ යළි කිසිදාක මා ළගට නොඑන්නය. මේ ඇත්ත කතාවය. මට දැන් ඒ අප්‍රිය ඇත්ත වැටහේ.

හාදුනනා මිනිසුන් අතර කිසිඳු පිහටක් නැති අසරණියක ලෙස ඔහු මා දමා ගිය බව මට විශ්වාස කරන්නත් අමාරුය.

"නංගී"

රාජිකා අක්කා මගේ අතින් අල්ලා ගත්තේ අනුකම්පාවෙනි.

"එයා මාව දාලා ගිහින් අක්කා..."

මම බොහෝ සෙමින් මතුලෙමි.

"එයා කොහොමද මාව දාලා ගියේ? අනේ යන්න කලින් එකපාරක් එයා මට මොනවාහරි කියල ගියානං මගේ හිතට මෙච්චර දුක නෑ. ඇයි එයා ගියේ? කිසිම පිහිටක් නැතුව මාව මෙහෙම දාලා යන්න එයා කොහොමද හිත හදාගත්තේ?"

ඇස් වලින් ගොඩ ගොඩ ගා කඳුළු වැටිණ. මම නොනවත්වාම කියවාගෙන ගියෙමි. එහෙත් වෙණුර සියල්ල හැරදා නික්ම යන තැනට පත්කළේ මා විසින්ම නොවේද?

මා නොසලකා උන්නාට ගෙවී ගිය මාස දෙකතුනම වෙණුර ගත කළේ දැඩි කලකිරීමෙන් පිරි ජීවිතයකි. මට ඔහු තේරුම් ගන්නට තිබිණ. ඔහුගේ හිත හදන්නට ඔහුට පෙම්බර වන්නට තිබිණ. එහෙත් මෙ කිසිවක් මා අතින් සිදුවූයේ නැත. ඉතින් මා හැර ගියා කියා ඔහුට පමණක් දොස් කියා දැන පිසදා ගන්නේ කොහොමද?





"ඔයා දැන් මොනා කරන්නද හිතං ඉන්නෙ නංගී"

රාජිකා අක්කා ඇහුවේ මගේ හෙට දවස ගැනය.

"මං දන්නෑ අක්කේ. මට කිසිදෙයක් හිතාගන්න බෑ."

මම හඩමින් කියෙව්වෙමි.

"බෝඩිමට නම් ඇඩ්වාන්ස් එකක් ගෙවල තියෙන නිසා මාස දෙක තුනක් මෙහේ කුලී ගෙවන්නැතුව හිටියහැකි. ඒත් පිරිමියෙකුගෙ ආරක්ෂාවක් නැතුව ගැණියෙකුට දරුවෙක් එක්ක හැමදාම තනියෙන් ඉන්න බැනෙ."

රාජිකා අක්කා කීවාය. මා උන්නේ ඔය ප්‍රශ්න කිසිවක් ගැන මනස මෙහෙයවිය හැකි තරමේ නිරවුල් මානසිකත්වයක නොවේ.

එල්ලේ පිටියේදී වෙණුරව මුලින්ම දුටු හැටි - මාදිවෙල සර්ගේ පන්ති කාමරයේදී වෙණුරව මුණගැසුණ හැටි - වෙණුර ආදරෙයි කී හැටි හා ඒ ආදරය පිළිගෙන ඔහු හා පලා ආහැටිත් මගේ මනසේ මැවී මැවී පෙනිණ.

මා පව් යැයි මා හිතනවා නම් ඔහුත් පව් නොවේද? තාරුණ්‍යයේ උපදින උද්වේගකර හැඟීම්වලට නතුව ආශාවන් සන්තර්පණය උදෙසාම ජීවත් වූ ඔහුත් මා මෙන්ම අසරණයෙක් නොවේද?

"මගෙ හිතේ එයා ගැන තරහක් නෑ අක්කා. අනේ එක පාරක් මට එයාගෙන් සමාව ගන්න තිබ්බ නං ඇති අක්කා."

මම රාජිකා අක්කාගේ ළමැදේ හිසහොවා හැඩිමි.

## 16

නිස්කාරණේ ගෙවුණ ජීවිතයට දවස් හනි හනිකට ආවේය. මාසයක් මම වෙණුර නැති බෝඩිං කාමරයේ ගතකොට තිබිණ. තුන්වේලට කෑම ටික රාජිකා අක්කා වෙතින් ලැබිණ.

"අක්කට ගොඩක් පිං මේ කරන දේවල් වලට. අක්කලටත් මං කරදයක් උනා නේද?"

මා ඇසුවේ ඇස්වල කඳුළු තියාගෙනය.

"බඩදරු ගෑණියෙකුට කෑම ටිකක් දෙන එක අපට නම් කරදරයක් නෙමේ නංගී. ඒත් උඹ මීට වඩා පිළිවෙලක් වෙනවනං මමයි රනිලුයි දෙන්නම කැමති."

"මගෙ ජීවිතේට දැන් ඉතින් මොන පිළිවෙලක්ද අක්කා. මට දුක මං ගැන නෙමේ. මේ බඩේ ඉන්න දරුව ගැන."

මම බත්පත අනමින් කන්නට පටන් ගත්තෙමි. දැන් මගේ ඇගේ පේන්නට ඇත්තේ මේ බඩගෙඩිය විතරය. අතපය කෝටු වී ඇස් මැලවී ගිය මගේ රූපය මටම සමහර විටක ගෙනාවේ පුදුමයකි. බඩේ ඉන්නා දරුවාට මානසික අස්වැසිල්ලක් නොවුවාසේම කායික පෝෂණයක්ද නිසිලෙස නොලැබිණ.





"ජීවිතේ හදාගන්න උඹ තාමත් පරක්කු වැඩි නෑ නංගී."

මම රාජිකා අක්කා දෙස බැලිමි. ඈ නිතර කියන මේ පිළිවෙල කුමක්ද?

"අක්කා මොනාද මට කරන්න කියන්නෙ?"

"ඇයි නංගි ආයෙත් සුදාරක ළගට යන්නැත්තෙ?"

මට රාජිකා අක්කාගේ විසඳුම ගැන පුදුම හිතිණ.

"මේ තියෙන ප්‍රශ්නවලට ඒක විසඳුමක් නෙමේ අක්කා."

"ඇයි නැත්තෙ? සුදාරක වගේ මනුස්සයෙක් කවදාවත් උඹව බාර නොගෙන ඉන්නෑ නංගී."

"ප්‍රශ්නෙ එයා මාව බාරගනීද නැත්ද කියනෙක නෙමේ අක්කා."

"එහෙනං"

"අනුන්ගෙ දරුවෙක් බඩේ තියාගෙන මට එයාගාවට ආපහු යන්න බැරි එක."

ඉපදී මැරෙන ටිකට ගෑණු පිරිමි එකතුව රගන මේ මායාව මොකද්දැයි මට දැඩි කලකිරීමක් දැනේ. ගෑණියෙක් හා පිරිමියෙක් එකතුව ජීවත්වීමට පටන්ගැනීම පමණක්ම විවාහය යැයි මට මුලින්ම අවබෝධ කොටගන්නට පුළුවන් උනානං සුදාරක සමග ජීවත්වනවා විනා මා අප අතරට වෙණුරව ඈදගන්නේ නැත. මිනිස් ආත්මයක් ලද මා කළ යුතුව තිබුණේ තෝරාගත් මිනිසා සමග ජීවත්වන ටික කාලය හොඳින් ජීවත්වීමය. එහෙත් මා සියල්ල වරද්දා ගත්තේ ඒ වනවිටත් පවුල් ජීවිතය ගැන තබා විවාහය ගැනවත් මට අවබෝධයක් නොවූ නිසාය.

"එයාව එදා ඉස්පිරිතාලෙට ගිහින් දැම්මා විතරයි. ඉන්පස්සෙ උන්නද මලාද කියලවත් බලන්න යන්න මට බැරි උනා."

මම හදිසියේම සිහිවී පසුතැවිල්ලෙන් කීවෙමි.

"මායි රනිලුයි සුදාරකව බලන්න ගියා නංගී."

රාජිකා අක්කා කීවාය.

"කවද්ද?"

මා තිගැස්සී ගියේ නිකම්මය.

"වෙණුර මෙහෙන් ගිහින් දවස් දෙකකට පස්සේ. ඒත් අපි යනකොට සුදාරක ටිකට් කපාගෙන ගිහින්."

මම නොදැනුවත්වම බර හුස්මක් හෙළීමි.

"අපි දෙන්නා ගියේ ආයෙත් ඔයාලව එකතු කරන්න පුළුවන්ද බලන්න. අපටත් ඔහේ උඹටයි ඔය දරුවටයි හොඳක් වෙනවා දකින්න නංගී."

රාජිකා අක්කාට හා රනිල් අයියාටත් මේ වන විට මා විශාල ප්‍රශ්නයක්ව තිබුණා නිසැකය.

"මේ දරුවා ලැබෙනකං විතරයි මං මෙහේ ඉන්නෙ අක්කෙ. දැන් මාස හතයිනේ. තව මාස දෙකයි මේ දුක. ඊටපස්සේ මං කොහේ හරි අනාථ මඩමකට හරි යනවා."

"දැන්වත් ඔය මුරණ්ඩුකම ටිකක් අඩුකරපං නංගියේ."

රාජිකා අක්කාගේ ඇස්වලද කඳුළු තිබිණ.





"වෙණුර කවදහරි මාව හොයන් එයි. මට ඒක හොඳටම විශ්වාසයි. මං එයාගෙ දරුවව අරන් සුදාරක ළගට යන්නෑ. ඒක පිරිමියෙක්ව දාලා ඇවිත් මං එකපාරක් ආත්ම ගාණකට පව්කරගත්තා. ආයෙත් පිරිමියෙක්ව දාලා ගිහින් තවත් පව්කරන්න මට බෑ. අවුරුදු කීයක් ගිහින් හරි වෙණුර මාව හොයන් එනකං ම බලා ඉන්නවා."

එක්කෝ මගේ හිත හදාගන්නට හෝ තැත්තං බිඳුණු රාජිකා අක්කාගේ හිත හදන්නට මට උවමනා කරන්නට ඇත.

රනිල් අයියාත් රාජිකා අක්කාත් නිතර මා ගැන සොයා බැලූහ. කතා කරන්නට - විසඳන්නට ඔවුන්ට දැන් අසල්වැසි මගේ ජීවිතය ප්‍රශ්නයක්ව තිබුණ හින්දා දෝ දැන් ඔවුන්ගේ ජීවිතවල ප්‍රශ්න හෝ අඬදබර නොවීය.

"නංගී..."

වැඩ ඇරී දවසක් දා හවස රනිල් අයියාත් රාජිකා අක්කාත් මගේ කාමරයට ගොඩවිය.

"අපි ආවෙ වැදගත් දෙයක් කියන්ඩ..."

ඔවුන්ගේ මුහුණුවල තිබූ බැරෑරුම් බව දැකී මොහොතේම මේ කියන්නට සැරසෙන්නේ ලේසිපාසු කාරණයක් නොවන බව මට දැනිණ.

"මෙක අහල නංගී කලබල වෙන්නෙපා."

රනිල් අයියා සෙමින් කතාබහ පටන් ගත්තේය.

"මට අද වෙණුරව හම්බඋනා නංගී."

මගේ දෑත කුස මතට ගියේ නිකම්මය.

"අනේ මගේ දරුවගේ තාත්තා."

සම් - මස් - ඇට - මිදුළු හරහා දනුණු සියුම් කම්පනය තෘප්තියක්ද වේදනාවක්ද පහදා කියන්නට මට හැකිවූයේ නැත.

"අනේ අයියා එයාව කොහෙදිද හම්බ උනේ?"

"පුංචි බොරැල්ලෙදි"

"පුංචි බොරැල්ලෙ? පුංචි බොරැල්ලෙ එයා මොනා කළාද? ඉතින් එයා මොනාද අයියට කිව්වෙ?"

මම ඉවරයක් නොදීම ප්‍රශ්න කරගෙන ගියෙමි.

"එයාව මට හම්බ උනේ නෑ නංගී. මං එයාව දැක්කා විතරයි. එයා පාස්පෝට් කන්තෝරුවෙ ඉඳලා එළියට ආවා. මං කතාකරන්න හිතාගෙන පාර මාරුවෙන ටිකටත් මිනිහා බස් එකට ගොඩවෙලත් ඉවරයි. එයා මාව දැක්කද කියන්න මං හරියටම දන්නෑ. ඒත් මම නං එක පාරින්ම මිනිහව අඳුනගත්තා."

මොහොතකට පෙර හිතේ පිදුනු බලාපොරොත්තු උපන් තැනම මැලවී යනවා මට දැනිණ.

"පාස් පෝට් කන්තෝරුවෙ එයා මොනවා කළාද අයියා?"

"මර්වින් කියලා මගෙ දුර නෑයො වෙන කෙනෙක් ඔතන වැඩ කරනවා. මං හිමීට මිනිහලව්වා හොයල බැලුවා. පාස්පෝට් එක හදන්න දීලා දැන් ටික දවසක්ලු. අද ඇවිත් කියලා තියෙනවා මිනිහට වැඩේ ඉක්මණට ඕනෙ කියලා. හෙට උදේ ඇවිත් පාස්පෝට් එක අරන් යයි කියල තමා කිව්වෙ."





මම එහෙම්ම ඇඳමතට කඩාවැටීමි. වෙණුර හදන්නෙ රටින් පිටවෙන්නය. ඔහු කවදාක හෝ දරුවාත් මාත් ළඟට ඒවියැයි තිබූ එකම බලාපොරොත්තුවත් ඉතින් හෙදී ගිය ගාණය.

"අනේ දෙයියනේ මොනාද මට මේ උනේ?"

මම විලාප දෙන්නට පටන් ගතිමි.

"ඔහොම අඩන්නෙපා නංගී. අඩලා දොඩලා වැලපෙන්න ගියොත් උඹට අල්ලපු අත්තයි පයගහපු අත්තයි දෙකම නැතුව යනවා. ඇඩිල්ල පැත්තක තියලා දැන්වත් මොලේ කල්පනා කරලා වැඩ කරපං."

රාජිකා අක්කා මට කීවේ තරමක නොරිස්සුමකිනි.

"අනේ මං මොනාද කරන්නෙ අක්කේ ?"

මා ඇසුවේ විසඳුමක් පතාගෙනය.

"හෙට උදේ මුවර් එකටම වෙණුර පාස්පෝට් එක ගන්න එනවා. උඹ යමං අපි දෙන්නත් එක්ක. මිනිහා රටින් පනින්න කලියෙන් මේක බේරුමක් කරගන්න එක උඹගෙ වැඩක් නංගී."

"එයා මාව එළවගනීද අක්කේ"

"එයා කොහොමද එහෙම කරන්නෙ? ඔය බඩේ ඉන්න දරුවගෙ තාත්තා එයා. කලින් කසාද බැඳපු ගෑණියෙක් උණත් උඹව මෙහෙම අනාථ කරලා යන්න එයාට කිසිම අයිතියක් නෑ. රණ්ඩුකරලා මේ ප්‍රශ්නෙ විසඳගන්න බෑ. පුළුවන් තරම් ආදරේ පෙන්නලා හොඳින් කතාකරලා දරුවටයි උඹටයි දෙන්නටම හොඳ තීරණයකට එන්න බලපං."

රාජිකා අක්කා කීවා වාගේ මෙය මට මගේ කුසේ ඉන්නා දරුවාගේ තාත්තා ලබාගන්නට ලැබෙන අවසන් අවස්ථාව විය හැකිය. රාජිකා අක්කාත් රනිල් අයියාත් සමග වෙණුර මුණගැහෙන්නට යන්නට මම තීරණය කළෙමි.

එදා රාත්‍රී මම වෙනදාටත් වඩා නොසන්සුන්ව ගත කළෙමි. හිතේ දුක පරදන වේදනාවක් වරින්වර කුස දෙසින් මතුව ආවත් මම හැකි උපරිමයට උහුලා හිදියෙමි. මාස හත පිරුණු කුස තුළින් දැනුණ වේදනාව උහුලාගන්නට බැරි තැන වරෙක මම කොට්ටය පවා විකාගෙන දරාගතිමි. වටින් ගොඩින් ඉර එළිය වැටෙන විටත් මා උන්නේ සිහිසුන් වන තරමේ වේදනාවකින් උවත් මම කිසිවක් රාජිකා අක්කාට හෝ රනිල් අයියාට නොකීවෙමි.

මේ තරම් වේදනාවක් මට දැනෙන බව දන්නේ නම් ඔවුන් මා රෝහල් ගත කරනු ඇත. එහෙත් මට ඕනෑ වෙණුර මුණ ගැහෙන්නටය. මේ අවස්ථාව මග හැරගෙන ඉතිරි මුළු ජීවිතකාලයම පසුතැවෙන්නට මට උවමනා නොවීය.



# 17

රනිල් අයියාත්, අක්කාත්, මාත් පුංචි බොරැල්ලට ආවේ කලී ත්‍රීරෝද රියකිනි. අප පාස්පෝට් කන්තෝරුව ඉදිරිපිට රථගාලේ පැයක් පමණ බලා හිඳින්නට ඇත.

"අන්න... අන්න මිනිහා."

මම නොඉවසිලිමත් දෙනෙත් රාජිකා අක්කා පෙන්නු දිශාවට යොමු කළෙමි. තද දුඹුරුපාට අත්කොට කමිසයක් හා කළු කලිසමක් හැඳ උන් වෙණුර පාර මාරුවිය. මම වෙව්ලන දෙනෙත් ඒ රුව මතම අලවා ගතිමි. වෙණුර - ඔහු හොඳින් මැද අළුත් ඇඳුම් ඇඳ ඔප දැමූ සපත්තු දමා ලස්සනට උන්නේය.

ඉස්සරෝම මාදිවෙල සර්ගෙ පන්තියේදී ඔහු දැකි මොහොත ගෙවී කාලයක් ගතව තිබූ හන්දා ඔහු මෝරා ඇති බව හැබෑවය. එහෙත් ඔහු ඉස්සරටත් වඩා ලස්සනට උන්නේය. වැහැරී ගිය මා මේ කයට ඔරොත්තු නොදෙන කුසකුත් උස්සාන ඔහු ඉදිරිපිටට යන්නේ කොහොමද?

"යං ටක් ගාලා."

මට තීරණයක් ගන්නට තියා හිතන්නවත් ඉඩනොදී රාජිකා අක්කාත් - රනිල් අයියාත් මාත් ඇදගෙන වෙණුර ළඟය.

"වෙණුර"

කතා කලේ රාජිකා අක්කාය.

"ආහ්ං"

විශ්වාසය. ඔහු හීනෙන්වත් අප මේ විදිහට මුණ ගැහෙන්නට බලාපොරොත්තු නොවන්නට නැත.

"හොඳයි කරපු වැඩේ. පැදුරටත් නොකිය මාරු උනා."

රාජිකා අක්කා කතා කලේ තරමක් තදිනි.

"ඇයි වෙණුර මට මෙහෙම කලේ?"

මා කතා කලේ හැඩුම්බරවය.

ඔහු මා දිහා කෙලින් නොබලා ඈත බලාගෙන ඇස්නටු ගැසුවේය.

"මං මේක හොඳට හිතලා ගත්ත තීරණයක්."

වෙණුර කතා කලේත් ඉවත බලාගෙනය.

"ඒක යකාගෙ තීරණයක්නෙ"

රාජිකා අක්කාටනං ඉවසන්නට බැරිගාණය.

"මොන ප්‍රශ්න ආවත් තමන්ගෙ දරුවෙක් බඩේ තියාගෙන ඉන්න ගෑණිකේව දාලා යනවද ඇගේ පණ කලදක් තියෙන මනුස්සයෙක් ?"

"අනේ අක්කා කෑගහන්නෙපා."

මම රාජිකා අක්කාගේ අත අල්ලාගතිමි.





"උඹලවගෙ ගෑනුන්ගෙ ඔය ලීලෙ හින්ද තමා මිනිස්සු මෙහෙම නටන්නෙ."

එවර රාජිකා අක්කා මගේ ඇගට කඩා පැන්නේය.

"අනේ අක්කා මං එයත් එක්ක මේක කතා කරගන්නං"

මම බැගෑපත් වීමි.

මග යනෙන කීපදෙනෙක් පවා විමසිල්ලෙන් අප දෙස බැලූහ.

"ඒ දෙන්නට කතා කරලා තීරණයක් ගන්න දීල අපි පොඩ්ඩක් පැත්තකින් ඉම්මු රාජිකා."

රනිල් අයියා රාජිකා අක්කාව අතින් ඇදගෙන ගියේය. පුංචි බොරැල්ලේ බෝගහයට මාත් - වෙණුරත් එකිනෙකාට මුහුණලා හිටගෙන සිටියෙමු.

"ඔයා මාවයි, දරුවවයි දාලා මේ රටිනුත් යනවද වෙණුර?"

මා හැඩුවේ උනුලා දරාගන්නට බැරිවය.

"මේක මං හොඳට හිතල ගත්ත තීරණයක්. අපි දෙන්නගෙම යහපතට ගත්ත තීරණයක් මානවී."

පළමු වතාවට වෙණුර මගේ ඇස් දෙස කෙලින් බැලුවේය. ඒ ඇස්වල යාන්තමට කඳුලු පටලයක් බොඳව තිබිණ.

"මාව දාලා යන එක කොහොමද මගෙ හොඳට ගත්ත තීරණයක් වෙන්නෙ?"

"මගේ අතින් කවදාවත් ඔයාට යුතුකං ඉෂ්ට උන්නෑ. මිනිහෙක් තමන්ගෙ ගෑණියෙකුට සලකන්න ඕන විදිහට මගේ අතින් ඔයාට යුතුකං ඉෂ්ට උන්නෑ."

"හිතේ දුකට කටින් පිටවෙච්ච වචනයක් අල්ලගෙන දිගටම පිද්දන්නෙපා වෙණුර. මං කොහොමද ඔයා නැතුව ජීවත්වෙන්නේ. ඔයාට මං ගැන දුක නැද්ද?"

"අපිට කවදාවත් සන්තෝෂෙන් එකට ජීවත් වෙන්න බෑ මානවී. ඔයා දැනටමත් සුදාරකගෙ වයිෆ්. එයා ගැන මතකෙ හිතේ තියාගෙන ඔයා කොහොමද මා එක්ක සතුටින් ඉන්නෙ?"

ඔහු දිගටම කියවාගෙන ගියේය. මම අසා උනිමි. අමාරුවෙන් යටපත් කොට දරා උන් තුසේ වේදනාව වැඩිවිගෙන එනවා වාගේ මට දැනිණ.

"තවත් අපි එකට හිටියොත් මීට වඩා ලොකු ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්. අපි මුණගැහිලා ආදරේ කරපු එක එකට ජීවත්වුන එක ලොකු වරදක්. ඒ වරද හදාගන්න තාමත් අපි පරක්කු නෑ මානවී...."

"එතකොට මේ දරුවා?"

"මං මට පුළුවන් හැටියට දරුවා ගැන බලන්නං. රට ගියාට පස්සේ මං ඔයාට සල්ලි ටිකක් එවන්නං."

හැමදාම වාගේ ඔය දරුවා මගේ ඕනකමට හදාගත්තු එකක් නෙමේ කියා වෙණුර නොකී බව හැබැය.

එහෙත් මා බලාපොරොත්තු වූ සැනසීම ඔහුගේ එකම පිළිතුරක් තුළවත් නොවීය.

"අනුන්ගෙ ගෑණියෙක් එක්ක පවුල්කන්න පටන් ගන්න කොයි මිනිහටත් සැනසීමක් ලැබෙන්නෑ මානවී. අපි ආයෙ ආයෙත් එකට ඉන්නවය කියන්නෙ මේ ප්‍රශ්නෙ ආපහු මුලට යනවය කියන එක."





ඔහු මට නතර කරවන්න බැරිය. ඔහුට මේ කිසිවක් අවබෝධ කරවන්නත් බැරිය. තමන්ගේම තීරණයක මුල්බැසගෙන ඉන්නා ඔහුට මගේ හිතේ දුක - වේදනාව තේරුම් කරවන්නට බැරිය. සමහරවිට ඔහු නිවැරදි වන්නටත් පුළුවන. මම අන්තිමේදී තේරුම් ගතිමි.

"ඔයා යන්න."

තවදුරටත් වෙණුරට කතා කරන්නට ඉඩ නොදී මම හදිසියේම කීවෙමි. වෙණුර මා දිහා බැලුවේ ගැස්සීය. මගේ නෙත් මත තිබූ කඳුලු වියැකී තියෙන්නට ඇත.

"දැන් ඔයා මෙතනින් යන්න වෙණුර.... ආයෙ කවදාවත් මගෙ ඇස් දෙකට පේන්න එන්නෙපා."

මාවත් දරුවාත් දමා යන්නෙපා කියා බදා වැළඳගන්නට ඕනෑ කළත් මා කළේ ඔහොම කීමය.

වෙණුර අදහාගන්නට බැරිව බලා උන්නේය. මා දිගටම පෙරැත්ත කරාවී - හඬාවී දොඩාවී කියා ඔහු බලා ඉන්නට ඇත.

"යන්න...."

මම සෙමින් නමුත් සෘජුව කීවෙමි.

වෙණුර ආපසු හැරිණ. අප දෙසටම නෙත් තියා දුරින් උන් රාජිකා අක්කාත් රනිලුත් වෙණුර පිටව යනු දැක කලබල වූහ. ඒ දෙදෙනා මා ළඟට ආවේත් ඒ කලබලයෙනි.

"රනිල් වෙණුර නතර කරගන්න."

රාජිකා අක්කා මගේ අතකින් අල්ලාගෙන සැමියාට කීවාය.

"එපා අක්කා එයාට යන්න දෙන්න."

මම සන්සුන්ව කීවෙමි.

"මොකා?"

රාජිකා අක්කා සැපින්නක වාගේ මගෙ මූණට පිම්බාය.

"එයාව නතර කරවන්න එපා අක්කා. යන්න දෙන්න."

මම සන්සුන්ව නමුත් ඍජුවම කීවෙමි.

"ඇයි මෝඩියේ ඉන්පස්සෙ උඹ කොහොමද මේ දරුවෙක් එක්ක ලෝකෙට මූණ දෙන්නේ?"

"වැරදි වැරදී - පැටලි පැටලී එකට ජීවත්වෙනවට වඩා මෙහෙම වෙන එක හොඳයි අක්කා. එයාට යන්න දෙන්න."

වෙණුර අද්දවමින් තිබූ බසයක එල්ලුනේ ආපසු හැරීවත් නොබලාය. ඔහු රැගත් බස්රිය නෙතුමානෙන් නොපෙනීයත්ම මෙතෙක් දරා උන් කඳුළුවැල් රිසිසේ ගැලුවේය. ජීවිතයම සෝදාපාළු වී ගියාවාගේ තනිකමක් මට දැනිණ. ඒත් එක්කම යටිබඩ පෙරලාගෙන මතුව ආ වේදනාව නෙත අඳුරු කරවීය.

"අක්කේ... මට අ...මා...රු..."

කටට ආ වචන ටික සම්පූර්ණ කරන්නත් පෙරාතුවම අවට අන්ධකාරව ගියේය.

# 18

හිසේ බරගතිය පරදන ගතේ වේදනාව දරාගෙන මම ඇස් පිහාවූ ගැසීමි. වැහිර උන් යහන වටා වූ රූප අඳුනාගන්නට උත්සහ කෙරිද්දී මේ මා ඉන්නේ රෝහලක ගැබිනි වාට්ටුවක බව මට සැණින් අවබෝධ විය.

"මානවී"

රාජිකා අක්කාත් - රහිල් අයියාත් ඇඳ ළඟ උන්හ. මම සිදුවූ දෙය මතකයට ගන්නට උත්සහ කළෙමි. කුස තුළින් මතුව ආ දරන්නට බැරි වේදනාව උත්සන්න වද්දී මගෙ දෙනෙත් අඳුරුව ගියා පමණක් මට මතකය. මගේ එක අතක සේලයින් බටයක් ගසා තිබූ අතර නිදහස් අත කුස මතට යැවුනේ නිකම්මය. මගේ කුස හැල්ලුව තිබිණි.

"මගේ දරුවා..."

මම කටහඬ අවදි කළෙමි.

"මානවී"

රාජිකා අක්කා මගේ ඒ අත මත අතක් තැබුවාය.

"අක්කෙ මගෙ දරුවා?"

"දරුවා ලැබුන නංගී...."

"දූවෙක්ද? පුතෙක්ද? අක්කා ....." මම සැනසුම් සුසුමක් හෙලීමි.

"අඩු මාසෙන් උපන්න දරුවා හරියට වැඩිලා නෑ නංගී. උපදිනකොටත් දරුවා මැරිලා පැයගාණක් ගත වෙලාලු."

"අනේ අක්කේ..."

මම රාජිකා අක්කාගේ අත අල්ලා ගතිමි.

"ඔක්කොම වෙන්නෙ හොඳටයි කියල හිත හදාගන්න නංගී."

ඈ මගේ හිස අතගෑවාය.

දරුවා උපන්නේ අඩු මාසයෙන් බව ඇත්තය. කුස ඔත් දින පටන්ම දරුවාට කිසිදු පෝෂණයක් නොවිණ. මානසික ආතතියෙන් හිඳියදී වැඩුණු දරුවාට අඩුම ගානේ විටමින් පෙත්තක්වත් නොලැබිණ. මට දරුවා ගැන දුනුණේ වචනයෙන් පහදාදිය නොහැකි සංතාපයකි.

පසුදින දහවල් මගේ ටිකට් කපා තිබිණ. ඒ වනවිටත් ලෙඩුන් බලන වේලාව වූ බැවින් මම මගේ ලට්ට ලොට්ට අල්පය ටියුලිප් බෑගයට ඇහිරීමි. සමහරවිට රාජිකා අක්කා මා බලන්නට එන්නට පුළුවන. තවදුරටත් ඔවුන්ට බරක් නොවී ඒ බෝඩිං කාමරයේ හිඳගෙනම රැකියාවක් හොයා ගැනීමට මම තීරණය කළෙමි.

"මානවී"





බෑගය නවා තුරුල්කරගෙන මා හැරුණේ තිගැස්සීය.

"සුදාරක"

සුදාරක මා ළඟ හිටගෙන උන්නේය.

"කොහොමද මාව හොයාගත්තෙ?"

මම මොහොතක් බලා හිඳ ඇසීමි.

"වෙණුර ආව මාව හොයාගෙන."

සුදාරක පැහැදිලි කළේය. මම අසා උනිමි.

"වෙණුර ඊයෙ රෑ මාව හොයන් ආවා. අද උදේ ෆ්ලයිට් එකේ මිනිහා රට යන බවක් තමා කිව්වෙ. මිනිහා ඇවිත් තිබ්බේ මගෙන් සමාවගන්න. වෙණුර තමා මට බෝඩිමට යන පාර කිව්වෙ. මං අද උදේම බෝඩිමට ගියා. එනකොට අර රාජිකා අක්කා තමා මේ වෙච්ච දේවල් මට කිව්වෙ."

මගේ නෙත් අළුතින් තෙත් විය. මේ වනවිටත් ගඩන්නේ නැතැයි තීරණයක් ගෙන උන්නත් නෙත කඳුළු වරා තිබුණේ නැත.

"ආයිත් මාව බලන්න එන්නෙපා සුදාරක."

මම ආයාසයෙන් කියාගතිමි.

"මානවී..."

සුදාරක තවත් අඩියක් මට ළං විය.

"ඔයා හොඳ කෙනෙක් හොයාගෙන බැඳගන්න සුදාරක."

"ඔයා කරපු වරදම මටත් කරන්නද කියන්නෙ මානවී."

"වරද?"

"ඔව් ගෑණියෙක් මිනිහෙක් ඉපදිලා මැරෙන ටික කාලෙට එකට ඉන්න තීරණය කළානං අන්න ඒකට තමා විවාහය කියන්නෙ. ඔයා ඒ ටික තේරුම් නොගෙන අපි අතරට තව කෙනෙක් ගාවගෙන කරපු වරද මටත් කරන්න බෑ."

ඔහු අතැර ගොස් ගතව ගිය අවුරුදු එකහමාරට අනන්ත දුක්විඳ මා තේරුම් ගත් හැටියට ඔහු මට කීවේ වචන දෙක තුනකිනි.

"මං දන්නවා මං ඔයාට කළේ සමාවෙන්න කියලා කටින් කියන්න බැරි තරම් වරදක් කියලා."

"ඒ වරද හදාගන්න තවත් [illegible] නෑ මානවී."

"අපි තව කොච්චර පැය ගාණක් අවුරුදු ගාණක් ජීවත් වෙයිද කියලා අපිම දන්නෑ මානවී. ඒ ටික කාලෙට මහලොකු දේවල් ජීවිතෙන් බලාපොරොත්තු [illegible]. ඉතිරි ටික කාලෙත් මගෙ වයිෆ් වෙලා මා එක්ක ඉන්න."

සුදාරක මගේ අතේ තිබූ මල්ල අතට ගත්තේය.


"අපි ගෙදර යං මානවී."

මගේ අත අල්ලාගෙනම ඔහු පෙරනුරු පුරුදු ආදරයෙන් කීවේය. මා ඔහුට ඉඩදී අවනත වූයේ කැමැත්තෙනි. කහපාට මලින් පිරුණු මල්කොහොඹ ගහ ළඟ සුදාරකගේත් මගේත් සෙනෙහස පිරුණු ගෙදර මට සැණින් මතකයට ආවේය.

kathapothak.blogspot.com

අවසානයි.

kathapothak.blogspot.com



ISBN: 978-955-0225-01-9